# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2560 වප් මස පුර පසළොස්වක නම් තිථිය ලත් ශනි දින ■ 2016 ඔක්තෝබර් මස 15 වැනි සෙනසුරාදා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ

# වප් පුර පසළොස්වක
# පොහොය දිනයේ වැදගත්කම



පෙර වස් එළඹුණු භික්ෂූන් වහන්සේ කුසල් දම් පුරා තෙමසකින් වස් පවාරණය කරන්නේ වප් මහේ පුර පසළොස්වක පොහොය දිනයකදීය.

සීමාමාලකයට රැස්වෙන උපසම්පදා කාලයෙන් අඩු වූ භික්ෂූන් වහන්සේ මධ්‍යයේ උක්කුටිකව වැඩ සිටින නායක තෙරණුවන් වහන්සේ විනය වාක්‍ය වදාරමින් පෙර වස් පවාරණය වන්නේ මෙවන් පොහොය දිනකදීය.

"ඔබ වහන්සේලා මාගේ යම් වරදක් දකීමෙන් හෝ ඇසීමෙන් හෝ එසේ නොවේ නම් මා ගැන යම් සැකයක් ඇත්නම් හෝ එය පහදා දෙනු මැනව. වරදක් සිදුවී ඇත්නම් එය සත්‍ය නම් වරද නිවැරදි කර ගනිමි" යි පොරොන්දු වන නායක තෙරුන් වහන්සේ රැස්වූ පිරිස මධ්‍යයේ වස් පවාරණය කරන අතර උපසම්පදාවෙන් කාලය අඩුවූ අනෙකුත් භික්ෂූන් වහන්සේලාද "සංඝං භන්තේ පවාරේමි".... යනුවෙන් තෙවරක්ම වදාරමින් පෙර වස් පවාරණය කරන්නේ වප් පුර පසළොස්වක පොහොය දිනකදීය.

බුදු වදනට අනුව ළඟම ඇසුරෙන් තම අඩු පාඩු සකසා ගත හැකි යැයි උදානපාලියෙහි දැක්වෙන සප්ත ජටිල සූත්‍රයේද මාතිකමාතා කතාවේද සඳහන් වෙයි. සාකේත නුවර තිස් නමක් භික්ෂූන් වහන්සේ වස් පවාරණය කිරීමෙන් පසුව බුදුරදුන්ගෙ න් බණ ඇසීමට කැමැත්තෙන් සැවැත්නුවර දෙව්රම් වෙහෙර වෙත වැඩම කළහ. මෙහිදී අතරමගදී ඇද හැලුණු මහා වැස්ස තෙමී දැඩි අපහසුතාවට පත්වූ භික්ෂූහු තෙත බරිත වූ කසාවත් දරාගෙන සීතලයට ගැහෙමින් ක්ලාන්තව පසුවූහ. මෙයින් දැනුවත් වූ බුදුපියාණන් වහන්සේ "මහණෙනි, කඨිනය අනු දනිමි" යි වදාළ සේක.

එදා බුදු වදන අදටත් සුරැකෙමින් පෙර වස් එළැඹී පවාරණය කරන භික්ෂූන් වහන්සේට කැපවූ කඨින චීවරය රැගත් පෙරහර ගම්වාසීන්ගේ සාධු නාදය මධ්‍යයේ ගම් නියම් ගම් කරා පිවිසෙන චීවර මාසයේ ආරම්භක පොහොය වන්නේ වප් පුර පසළොස්වකයි.

මෙම දිනයේ සිට ඇරඹෙන එකුන් තිස් දිනය කඨිනාස්තරණ කාලය යැයි දේශනා පාඨයෙහි සඳහන් වී ඇත.

බුද්ධත්වයෙන් සත්වන වස තව්තිසා දෙව්ලොව වස් විසූ බුදුපියාණන් වහන්සේ මාතෘ දිව්‍ය රාජයාට විජම් බණ දේශනා කර පෙළහර පා රන් ඉනිමග ක් මතින් දඹදිව සංකස්ස පුරට වැඩම කළේද වප් පුර පසළොස්වක පොහොය දිනකදීය. බුදුරදුන්ගේ මෙම දෙව්ලොව චාරිකාව පිළිබඳ විස්තර දේවාවරෝහණ වර්ණනාවෙහි සඳහන් වෙයි.

මෙසේ වැඩම කළ බුදුපියාණන් වහන්සේ පුන්සඳ මඬලක් සේ දිදුලමින් සවණක් ඝන බුදුරැස් මාලාවන් දස අත විහිදුවා ලූ සේක. මේ අසිරිමත් දසුනින් පළමු වරට ඔද වැඩුණු සැරියුත් තෙරණුවන් සිරිපා කමල මත වැඳ වැටුණේ උතුරා යන බුද්ධාලම්භන ප්‍රීතියෙනි.

මෙහිදී රැස්වූ දෙව්, බඹුන්, මිනිසුන් මධ්‍යයේ බුදු හිමියන් විමසූ ප්‍රශ්න රැසකට පිළිතුරු දීමට සමත් වූ සැරියුත් හිමියන් ප්‍රඥාවන්තයන් අතුරින් අග්‍ර තනතුරට පත්වූයේද වප් පුර පසළොස්වක පොහොය දිනකදීය.

සොළොස් අසංඛ්‍ය කල්ප ලක්ෂයකට පසු මතු බුදු වන මෛත්‍රෙය බෝසතාණන් මෙම ධර්ම සංවාදය ඇසීමෙන් අපමණ සතුටට පත්වී ගෞතම බුදු සසුනෙහි පැවිදි වූයේ වප් මහේ පුර පසළොස්වක පොහොය දිනක වීම විශේෂිතය.

ලාංකික මවුපියන්ට දාව උපත ලබා ලක්බිමේ මුල්ම රහතන් වහන්සේ වූ අරිට්ඨ මහ රහතන් වහන්සේ ලංකාවේදී ඉගෙන ගත් විනය පිටකය ථූපාරාම සීමා මාලකයේදී සංඝායනා කළේ වප් පුර පසළොස්වක පොහොය දිනකදීය.

ලක්දිව බුදු දහම තවත් බැබළවීමට ඇප කැප වූ අනුබුදු මිහිඳු මාහිමියනගේ ඔවදන් හා දේවානම්පියතිස්ස රජතුමාගේ රාජ අනුග්‍රහය ප්‍රශංසනීය වෙයි. සංඝමිත්තා මහ රහත් තෙරණියන් වහන්සේත්, ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් මෙරටට වැඩම කරවීමට අවශ්‍ය බව දන්වන සංදේශය රැගත් අරිට්ඨ කුමරු සමග රාජකීය දූත පිරිස දඹදිව රම්‍ය වූ පැළලුප් නුවරට පිටත් වූයේද වප් මහේ පුර පසළොස්වක පොහොය දිනකදීය.

සංදේශයට අනුව අශෝක රජතුමා මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ උපදෙසින් බුද්ධ අධිෂ්ඨානය සිහි ගන්වමින් බෝ සමිඳුන් වෙත පිවිසියේය. ඇඳිලි බැඳගත් රජුගේ දෑසින් කඳුළු වැගිරෙද්දී මහා ප්‍රාතිහාර්ය පාමින් බෝ සමඳුගේ වෙන්වුණු දක්ෂිණ ශාඛාව මුල් සියයක් අද්දවමින් රන් කටාරමෙහි පිහිටියේ පින්බර වප් මහේ පුර පසළොස්වක පොහොය දිනකදීය.

මෙසේ බොදු සිත ප්‍රබෝධවත් කළ වප් මහේ පුර පසළොස්වක බෞද්ධයාට සුපින්බර පොහොය දිනයකි.

මසකට වරක් උදාවන පුර පසළොස්වක පොහොය දිනයටවත් ගමේ විහාරස්ථානය වෙත නොයන බහුතරයක් නාමික බෞද්ධයන් මෙවැනි පොහොය දිනයක ඇති නිසි වටිනාකම තේරුම් ගෙන වසරකට වරක් සිදු කරන මහත් ඵල මහානිශංසද සහිත වූ කඨින පින්කමට සහභාගී වීමට පෙළඹිය යුතුය.

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

"මේ ලෝකයේ කවරදුවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."



# ලෝකෝත්තර ධර්මය මොන වගේද?

ලෝකෝත්තර ධර්මය කෙබඳු එකක්ද යන්න පැහැදිලිව හඳුනා ගැනීමට ඉවහල් වන විස්තරයක් කිරීම අපහසු කරුණක් වන්නේ ලෝකෝත්තර තත්ත්වයට පත්වූවකුට පමණක් එය විෂය වන බැවිනි. එහෙත් සාමාන්‍ය ජනයාට පමණක් එය විෂය නැති බැවිනි. එහෙත් සාමාන්‍ය ජනයාට යම් පමණක් හෝ ඒ පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට ඉවහල් වන ආකාරයේ විස්තරයක් දැක්වීම කළ නොහැක්කක්ම නොවේ.

ලෝකෝත්තර ධර්මය කොටස් නවයකින් යුක්තව අවබෝධ කරගත් තැනැත්තා අති පාරිශුද්ධ තත්ත්වයට පත්වූවෙකි. මෙම තත්ත්වයට පත්වූ තැනැත්තන් බුදුවරු, පසේ බුදුවරු හා රහතන් වහන්සේලාය. සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අරහත් යන සතර මහ සතර ඵලයන් හා නිර්වාණය එම කොටස් නවයයි. නව ලෝකෝත්තර ධර්මය යනුවෙන්ද මෙය හඳුන්වයි. ලෝකෝත්තර ධර්මයට ඇතුළත් වී අරහත් තත්ත්වයට පත්වීම සඳහා පුද්ගලයා භවයෙන් භවයට ගමන් කරමින් සසර බැඳ තබන සංයෝජන ධර්මයන් ප්‍රහීන කළ යුතුය. සෝවාන් තත්ත්වයට පත්වීම සඳහා සත්සාය දිට්ඨී, විචිකිච්චා, සීලබ්බත, පරාමාස යන සංයෝජනත්‍රය නැති කළ යුතුය. සෝවාන් වන තැනැත්තා කිසිම අවස්ථාවක අපායගාමී නොවන අතර සත්වෙනි ආත්ම භාවයේදී නිර්වාණයට පත් වන්නේය.

සකෘදගාමී යනු එක් අවස්ථාවක උපත ලබන බවයි. සකෘදගාමී වීම සඳහා කාමරාග, ව්‍යාපාද යන සංයෝජනයන් ප්‍රහීන කළ යුතුය. මිනිස් ලොව එක් අවස්ථාවක් උපත ලබා නිවන් ලබන්නේය. අනාගාමී වීම සඳහා කාමරාග, ව්‍යාපාද යන සංයෝජනයන් සම්පූර්ණයෙන්ම විනාශ කළ යුතුය. නැවත උත්පත්තියක් නැතැයි (න + ආගමි - අනාගාමී) යන අර්ථයන් අනාගාමී වන තැනැත්තා රහත් භාවයට පත්වී පිරිනිවන් පාන්නේය.

රූපරාග, මාන, උද්ධච්ච අවිජ්ජා යන ඉතිරි සංයෝජන ධර්ම සියල්ලම ප්‍රහීන කිරීමෙන් රහත් භාවයට පත් වන්නේය. රහත් වන තැනැත්තා ඒ ආත්ම භාවයෙන් පසුව කිසිදු අවස්ථාවක නැවත උත්පත්තියක් සිදු නොවෙයි.

**පදියතලාවේ ඤාණවිමල හිමි - පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."



# මිනිසා පරිහානියට පත්වෙන්නේ මෙහෙමයි

යම් පුද්ගලයකුට තමා හරිහම්බ කළ ධනය රැක ගැනීමට නොහැකි වන අවස්ථා ඇති වෙයි. එම ධනය අපායභාග් වීම විටෙක කෙරෙන්නේය. එම නිසා ධන ධාන්‍ය බව භෝග සම්පත් විනාශ වීමට හේතු වන්නා වූ අපායමුඛ හෙවත් අවාමුඛ සතරක් ගැන බුදු දහමේ පැහැදිලි කිරීමක් කෙරෙයි. එම ධන පරිහානි මුඛ සතර මෙයාකාරය.

ස්ත්‍රී ධූර්තයකු වීම ධන පරිහානියට හේතුවකි. මන්ද ස්ත්‍රී ධූර්තයා නිතරම ගැහැනුන් සන්තර්පනය කරන්නට, ගැහැනුන්ට සැප සම්පත්, බඩු භාණ්ඩ ලබා දෙන්නට, ඔවුන්ට තෑගි පුදන්නට, ඔවුන් හා අල්ලාප සල්ලාපයේ යෙදෙමින් දුර බැහැර වන උයන් සුන්දර ස්ථාන බැලීමට හා ගමන් බිමන් යන්නට තමාගේ පසුම්බියේ ඇති මුදල් වියදම් කරන හෙයිනි. මොවුන් ගැන ජන ව්‍යවහාරයේ එන්නේ ගෑනු පිස්සන් යනුවෙනි. ඔවුහු නිතරම ගෑනු අස්සේ රිංගමින් ගෑනු පස්සේම යති. එම නිසා ඔවුන් නිතරම වෛවාරණ ලෙස සැරසිය යුතු වෙයි. විචිත්‍රවත් ඇඳුම් පැළඳුම් සඳහා විශාල මුදල් සම්භාරයක් වියහියදම් කළ යුතු වෙයි. ගෑනු වශී කරන්නට නොයෙක් ආකාරයේ වශීකරණයන්ගේ පිහිට පතන්නටද ඔවුන්ට සිදුවෙයි. ඒ පෙනුමට හෝ යානවාහනවලින් ගමන් කළ යුතු වෙයි. ඒ අනුව ඔවුන්ගේ ධනය විනාශ වන්නේ මේ ආකාරයෙනි.

දෙවැනි ධන පරිහානි හේතුව නම් සුරාධූර්තයකු වීමය. මොවුන් ගැන පැහැදිලි කිරීම අනවශ්‍ය සේ විටෙක හැඟෙයි. හේතුව සමාජය තුළ මොවුන් හමුවීම සුලබ දර්ශනයක් හෙයිනි. තැබෑරුම්වල, අවන්හල් ඉදිරිපිට මොවුන්ගේ ගැවසීම යකුන් සැන්දෑ කාලයේදී පැන් තොටට වී ගැවසීම බඳු නොවරදින සුළු චර්යාවකි. සැන්දෑ කාලය වනවිට ආවේශ වීමට යක්කු ආතුරයන් සොයති. එලෙසම බේබද්දෝ ආවේශ වන්නට සැන්දෑ කාලයේ තැබෑරුම් වෙත ගමන් කරති. මද ප්‍රමාණයක් ඇඟට ඇතුළු කර ගත් කල මොවුන් තරම් දානපතියන්, ත්‍යාගවන්තයන්, වීරයන්, රණශූරයන් ලෝකයේම නැති සෙයකි. ගඳට වහ වැටෙන මැස්සන් සේ මොවුන් වටා නිතරම බේබද්දෝ රැස් වෙති. තම දරුවන්ට, බිරිඳට නොසැලකුවත් මොවුහු තම යාළු මිත්‍රයන්ට සලකන්නට පසුබට නොවෙති. මෙලෙස චාරිත්‍ර වාරිත්‍ර, යුතුකම් ඉටු කරන මොවුන්ගේ මුදල් පසුම්බියේ අන්තිමට ඉතිරි වන්නේ පිච්චියක් පමණි. මොවුන්ගේ සියලු සම්පත් අපායභාග් වන්නේ මෙයාකාරයෙනි.

තෙවැනි ධන පරිහානි හේතුව නම් අක්ෂ ධූර්තයකු වීමය. සූදු කෙළින්නා යනු මෙහි සාමාන්‍ය අර්ථයයි. සූදු කෙළින්නා තම ආවේගයට ගොදුරු වූ පසු නතර වන්නේ සූදු පොළේම පමණි. මෙම ආවේගය මුදල් නැතිවීම පිළිබඳ ප්‍රශ්නයකුත් නොවෙයි. මුදල් ඇතිවීම පිළිබඳ ප්‍රශ්නයකුත්

කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.”

නොවෙයි. එය යම් ආකාරයේ ගුප්ත ආවේශයකි. මින් කෙරෙනු ඇත්තේ යම් චාරිත්‍රයක් ඉටු කිරීම පමණක් විය හැකිය. මෙම ආවේගයෙන් දෙවිවරුන්ට පවා බේරිය නොහැකිය. සූදු කෙළීමේ ආසාව හැමෝටම ඇති වන්නේ නැත. එම ආවේගය ඇති වන්නේ අතිශය පින්වන්තයන්ටම පමණකි. එවන් සම්මානවත් ආවේගයක් මිහිපිට දායාද ලැබීම අති දුර්ලභ සන්සිද්ධියකි. මහත් උජාරුවෙන් ඔට්ටු අල්ලන සූදු අන්තුවා කිසිදා මට්ටු නොවෙයි. මුලින් පෙනෙන ඔහුගේ උජාරුව සිත රිදවන රුජාවක් බවට පත් වන්නේ පසුවය. තම ගෙදර තිබෙන සම්පත පවා ඔහු ඔට්ටු අල්ලා පරාද වෙයි. අන්තිමට ධන සම්පත් නැති තැන හොරකම් කරන්නට වුවද පෙළඹෙයි. තම ඉඩකඩම් පවා උකස් තියයි. තම බිසව පවා ඔට්ටු අල්ලා පරාද වූ රජවරුන් ගැන ජනප්‍රවාද ගෙතී ඇත්තේය. ඔට්ටු ඇල්ලීම තරම් ක්ෂණික ලෙස ධන පරිහානි වන මාර්ග යක් තවත් නැත. ලක්ෂ, කෝටි ගණනක ධන සම්පතක් එක පැයකදී ඔට්ටුවට තැබිය හැකිය. කෝටි ගණනක මුදලක් එක පැයකදී විනාශ කොට දැමිය හැකිය. මේ නම් අති ශීඝ්‍රයෙන් ධනය විනාශ වන භයානක අවාමුඛයකි. සූදුකාරයා විනාශ වන්නේද තම ධනය විනාශය කරා පමුණුවන්නේද මෙයාකාරයෙනි.

ඊළඟ අපාය මුඛය නම් පාප මිතුරන් ඇසුරයි. පව්ටු මිතුරන් ඇසුර බොහෝ විපත්තීන් හට හේතුවකි. පාප හෝ පව්ටු මිතුරන් යනු මිනීමරුවන්ය, මංකොල්ලකාරයන්ය, හොරුන්ය, තක්කඩියන්ය, මංපහරන්නන්ය, බේබද්දන්ය, ස්ත්‍රී දූෂකයන්ය, කපටින්ය, කුහකයන්ය, ගුණමකුවන්ය. මොවුන් ඇසුරු පිළිබඳව ආයේ අටුවා ටීකා අවශ්‍ය නැත. මොවුන් ඇසුර යමකුට මෙලොවදීම පලදෙන පාප කර්මයක් වේ. අනෙකකුගේ ජීවිතය උදුරා ගන්නාට, අනෙකකුගේ සම්පත උදුරා ගන්නාට, අසරණ තැනැත්තියකගේ ජීවිතය විනාශ කරන්නට තරම් හිතක් පපුවක් නැත්තාට එරෙහිව කෙසේ හෝ ස්වභාවධර්ම බලවේගයන් පෙළ ගැසෙයි. අධිකරණයකින් දඬුවම් නොලැබුණහොත් ස්වභාවධර්මය තුළ නිලීනව ඇති බලවේග මගින් දඬුවම් ලැබීම මඟහැර යාම කෙසේවත් කළ නොහැක.

**පූජ්‍ය යටමලගල සුමනසාර හිමි**
**- කැලණිය -**



''අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය.''

"පඨවිරිව න ජාතු කම්පතෙ
නචලති මෙරුරිවාති වායුනා
වජිරමින නභිජ්ජතෙසතං
තම්දමතො කඨිනන්ති වුච්චති"

සිරිසුගත තථාගත අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ශාසනය මානව පරපුරෙන් පරපුරට ගෙන ඒම සඳහා තම මුළු ජීවිත කාලය කැප කරන ශීලාදී ගුණයන්ගෙන් ප්‍රභාවත් වූ, යථාර්ථවාදී මාර්ග උපදේශකත්වයෙන් ආදර්ශ ප්‍රතිබිම්බයක් වූ දිනෙන් දින වෙනස් වන භෞතික අපේක්ෂාවන්ගෙන් අසහනකාරී වූ ජනතාවට මහා සංඝ රත්නය පරම ශාන්තියකි. නයන රසාංජනයකි. තණ්හාව, වෛරය, මෝහය යන ප්‍රධාන අකුසල චේතනාවන්ගෙන් ඔවුනොවුන් වෙලී, පැටලී මානුෂික ගුණාංග අන්තයටම පිරිහෙන සමාජයේ ගමන් මග වෙනස් කිරීමට හැකි එකම පිරිස නම් ඒ මේ මහා සංඝරත්නයයි.

සුපටිපන්න, උජුපටිපන්න ආදී ගුණයන්ගෙන් ශෝභමාන වූ අපේ මහා සංඝ රත්නය වස් කාලය තුළ තමන්ට සිව් පසයෙන් ඇප උපස්ථාන කරන අනුගාමිකයන්ගේ චිත්ත සන්තානය ශ්‍රද්ධාදී උතුම් චේතනාවන්ගෙන් පුරවා දෙලොව ශාන්තිය ඇති කරලීමට උනන්දු වන්නේ නම් එය ගිහි පැවිදි දෙපක්ෂයටම අපමණ ශාන්තියක් වන්නේය. බණ දහමට පුරුදු කරවීම ආරාම වෙහෙර විහාර පවිත්‍ර කිරීම පුරාණයේ පැවැති ග්‍රන්ථ ධුර, විදර්ශන ධුර පුරුදු පුහුණු කිරීම, ධර්ම දේශනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආගමික, ජාතික කාර්යයන් කෙරෙහි මෙයට වඩා කාලය, ශ්‍රමය, බුද්ධිය ආයෝජනය කරන්නේ නම් සමාජ තුළ ආගමික කුසල භාවය වර්ධනය වන්නේය.


වසර අවසාන භාගයේ මුල් මාසය තුළ සිදුකරන කඨින චීවර පූජා පින්කම්, උත්සව, ගම් නියම්ගම්, නගර පළාත්වල වෙහෙර විහාර, ආරාම, ආවාස, පිරිවෙන්, විද්‍යායතනවල සිදු කෙරෙන්නේ වසරේ කෙරෙන උපරිම, උත්තමතම පුණ්‍ය කර්ම වශයෙනි.

කඨින චීවර පූජා පින්කම අර්ථාන්විතව කරගැනීමෙහිලා ප්‍රධාන කාරණා කීපයක් අවශ්‍යම වන්නේය.

# සසර පුරාවට මහානිශංසය ගෙන දෙන කඨින චීවර පූජාව



"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"



1. උපසපන් භික්ෂුවක් වස් වසා එය ආරක්ෂා කරගැනීම.
2. දයකයන් විසින් ධාර්මික කඨිවස්ත්‍රයක් සපයා ගැනීම.
3. මහා සංඝ රත්නයට කඨින චීවරය පූජා කිරීම.
4. මහා සංඝරත්නය විනයානුකූලව භික්ෂුවකට පැවරීම.

කඨිනය පිළිබඳ විග්‍රහ කරන ආචාර්යවරයෝ කඨ + ඉන යන වචන දෙක එක්වීමෙන් කඨින යන වචන හැදී ඇතැයි කියති. කඨිනය, කඨිනාස්තරණය, කඨින මාසය, කඨින විපත්ති, සම්පත්ති, නිමිත්ත කර්මය, පරිකථා ආදී කරුණු විනය පිටකයෙහි පරිවාර පාළියෙහි විස්තර වන්නේය. අප බුදුරජාණන් වහන්සේ විසින් කඨින චීවරය අනුදන වදළේ පාවෙය්‍ය නම් රටෙහි විසූ භික්ෂූන් වහන්සේලා තිස් දෙනකුන් අරභයාය. එම භික්ෂූහු තිස් නම බුදුන් දකිනු වස් සැවැත්නුවර බලා වඩින්නාහු වස් එළඹෙන දවසට පෙර සැවැත්නුවරට යා නොහැකි වූයෙන් සාකේත නම් නුවර අසල සෙනසුනෙක්හි වස් එළඹුණහ. එතැන් සිට සැවැත්නුවරට ඇත්තේ සය යොදුණකි. ඈත වූ පාවෙය්‍ය නුවර සිට අප ආයේ බුදුන් දක්නා අදහසින් වුවද මෙපමණ සමීපයට පැමිණියද තෙමසක් ගත වනතෙක් යා ගන්නට නොහැකි යැයිද අපේ මුල් අදහස සඵල නොවූ හෙයින් පසුතැවිල්ලෙන් යුතු වස් තෙමස ගෙවා යළි ගමනාරම්භ කළෝය.

මෙකල මහා වැහි කාලය බැවින් මගතොට ජලයෙන් යටවී මග වඩින භික්ෂූහු දණහිස දක්වා බොරදියෙන් තෙතබරිව සිවුරු තෙමී ක්ලාන්ත ගතියෙන් යුක්තව සැවැත්නුවර දෙව්රම් වෙහෙර වෙත ගොස් බුදුන් දක වැඳ එකත්පස්ව සිටියහ. බුදුරජාණන් වහන්සේ සිරිත් පරිදි පිළිසඳර කතා කොට සුව දුක් විමසූහ. එම භික්ෂූන් වහන්සේලාද එන ගමනෙහි විඳින්නට වූ ගැහැට විස්තර කළහ.

අප බුදුරජාණන් වහන්සේ අනමතග්ගිය සූත්‍රයෙන් බණ වදරා ''අනුජානාමි භික්ඛවෙ වස්සංවුත්ථානං කඨිනං අත්ථරිතුං''.

''මහණෙනි, පෙර වස් වසා මහා පවාරණයෙන් පැවරූ භික්ෂූන්ට කඨිනාස්තරණය කරන්නට අනුදනිමියි'' යනුවෙන් කඨින චීවරය අනුදන වදළ සේක.

කඨින චීවරයක් මසා සංඝයාට පුදනු කැමති දයක පින්වතුන් විසින් පිළිපැදිය යුතු සිරිත් විරිත් රාශියක් ඇත. එමෙන්ම වස්ත්‍රයක්, කඨින චීවරයක් වශයෙන් සම්පූර්ණ කරගැනීමෙහිලා ඇති කාර්යයද බහුලය.

1. කඨින චීවරය පිළිබඳ පූර්ව කෘත්‍ය
2. පච්චුද්ධරණය
3. අධිෂ්ඨානය
4. ආස්තරණය
5. මාතිකා
6. පලිබෝධ
7. ආනිශංස

යන කරුණු පිළිබඳ සාමාන්‍ය වශයෙන් හෝ අවබෝධයක් ලබාගන්නේ නම් කඨින චීවර මහා පුණ්‍ය කර්මයේ ආනිශංස නොඅඩුව ලබන්නට අවස්ථාව උදවන්නේය. සංඝයා විසින් කිසියම් භික්ෂුවකට කඨිනය අතුරන්නට වස්ත්‍රය දෙන විට එය සිවුරක් සඳහා කළමනා මූලික කටයුතු සියල්ල නිමවා දීම යෝග්‍ය වන්නේය.

සියලු භික්ෂූන්ගේ සහාය ඇතිව හෝ නැතිව හෝ අරුණෝදයේ දයකයා විසින් භාර දුන් වස්ත්‍රය අංග සම්පූර්ණ සිවුරක් කර ඇතිරිය යුතු වේ. විනයානුකූලව සිවුරක් කඨින චීවරයක් වීමට සේදීම, කඩ අතු බෙද නූල් ගැසීම, ඒ නූල් ගසා ඇති පරිදි කැපීම, හිස් නූල් නැගීම, මැසීම, පඬු පෙවීම, කප්බින්දු තැබීමාදී කාර්යයන් ප්‍රධාන ධර්ම විනයට අනුගතව චාරිත්‍රානුකූලව කෙරෙන මෙම කඨින චීවරය තරම් පූජාර්හ වස්ත්‍රයක් මනු ලොව නැත්තේමය.

මෙතරම් උතුම් කඨින චීවර පූජා පින්කාමේ ආනිශංස වෙනත් පින්කම්වලට වඩා ලක්ෂ ගුණයෙන් වැඩි බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. මහ පොළොව හෝ කම්පා නොවන, සුළඟින් නොසෙල්වෙන, මහා මේරු පර්වතය සේ, විදුරුවියක් සේ ඉතා ඝන කඨින චීවර පූජාවේ ආනිශංස වෙනත් සුළු අකුසල් සිතකින් සොලවන්නට, වෙනස් කරන්නට, අඩු කරන්නට නොහැකි උපනුපන් භවයන්හි උසුරු, ශ්‍රේෂ්ඨ ප්‍රතිවිපාක ලබන මෙම කඨින චීවර පූජාවේ ආනිශංසයේ අන්තිම ආත්මයේදී සිව්පිළිසිඹියාපත් රහත් බව ලබමින් නිවන් සම්පත් ලබන්නටද වාසනා වන්නේය.

**පූජ්‍ය අමුණුපුර පියරතන හිමි**

''යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ.''



# සිතින් දන් දිය හැකිද?

පූජ්‍ය හෑගොඩ විපස්සි හිමියන්ගෙන් දහම් ගැටලුවලට

## පිළිතුරු

**❒ ස්වාමීන් වහන්ස, සිතින් යමක් මවාගෙන දන් දිය හැකිද? ඉන් පිනක් සිදුවේද? උදාහරණයක් ලෙස මහ සඟරුවනට වාහනයක් පූජා කිරීමට සිතුවත් කෙනෙකුට එවැන්නක් කිරීමට වත්කමක් නැහැ. ඒත් සිතෙන් එවැන්නක් මවාගෙන මෙය පූජා වේවා යැයි සිතුවොත් ඉන් පිනක් සිදුවේද?**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී අපට දිය හැකි පිළිතුර වන්නේ එසේ සිතින් දන් දීමට නොහැකි බවයි. බුදුරජාණන් වහන්සේ ඉගැන්වූ පරිදි දානය යන්න මෙසේ විවරණය කොට දැක්විය හැක. ''දීයතීති දානං'', ''දානබ්බං දානං''. මෙම පාලි පාඨවලට අනුව දිය යුතු දෙය දානයයි. දෙනු ලබන දෙය දානයයි. ඒ අනුව අපට පැහැදිලි වන්නේ යමෙකුට දානයක් දීමට තමා සතුව වස්තුවක් නැතිව හිතින් පමණක් ''මම දානයක් දුන්නා'' ලෙස සිතා සතුටු වූවාට පිනක් රැස් වෙන්නේ නැත. දන් දීමේදී චිත්ත, වත්ථු, පරිග්ගාහක යන අංශ තුනම සම්පූර්ණ විය යුතුය. මෙහිදී වත්ථු ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළේ දන් දීම සඳහා යොදාගන්නා වස්තුවයි.

දා ධාතුවෙන් සැදුණු දානය යන පදයේ අර්ථය වන්නේ දීම, පරිත්‍යාග කිරීම යන්නයි. යම්කිසි වස්තුවක් පූජා කොට අතින් එම වස්තුව අත්හැරියා සේම සිතින්ද එම වස්තුව පිළිබඳ ආශාව අත්හැර දුන් දානය පිළිබඳ සතුටු වීමෙන් පින් රැස් වෙයි.

# අධි පොහොයක් යනු කුමක්ද?

සම්මත වසරකදී දොළොස් මහේ පොහොය උදා වෙන්නේ බුදු සසුනෙහි වූ සුවිශේෂී සිදුවීම්වලින් බොදු හදවත පුබුදු කරවමිනි.

පුරාතන සමාජයේ වසරකට පුර පසළොස්වක පොහොය දොළහක් උදාවන බව ගණනය කළද එය ජ්‍යොතිෂයටත්, තාරකා විද්‍යාවටත් අනුව වෙනස් වෙයි. ඒ අනුව වසරකට දින 365 ක්ද, අධික වසරකට දින 366 ක්ද වශයෙන් ගණන් ගැනෙයි.

පෘථිවිය සූර්යයා වටා ගමන් කිරීම නොහොත් පරිභ්‍රමණය වීමට ගත වන නිවැරදිම කාලය දින 365 යි පැය හයක් වශයෙන් ගණනය කර තිබෙයි.

සම්මත මිනුම් අනුව දින 365 ක් ගෙවුණු තැන වසරක් සම්පූර්ණ වන අතර වසරකදී පැය 6 ක් ඉතිරි වෙයි. දවසකට ඇත්තේ පැය 24 කි. එසේ නම් ඉතිරි වන පැය හයේ ඒවා හතරක් එකතු වූ විට තවත් දවසක් උදා වෙයි. මේ ගණනයන් අනුව වැඩිපුර දවසක් උදාවන්නේ සිව් වසරකට වරක්ය. එම වසර හඳුන්වන්නේ අධි වර්ෂයක් වශයෙනි. අධික වර්ෂයකදී පොහොය 13 ක් උදාවන අතර අමතරව එළඹෙන පොහොය දිනය අධි පොහොය වශයෙන් හඳුන්වයි.

ඍතු වර්ෂයක් තුළ එළැඹෙන දහතුන් වැනි පොහොය අධි පොහොයක් යැයි සාරාර්ථදීපනී විනය ටිකාවෙහිද සඳහන් වෙයි.

අධික වර්ෂයකදී එළඹෙන අධි පොහොය දිනයක දී සම්බුදු සසුනෙහි විශේෂිත සිදුවීමක් නොමැති වුවත් එය බෞද්ධයාට මනා අවබෝධයකින් තම දිවි මග ආලෝකවත් කර ගැනීමට පහසුවක් සැලසෙන සේ තවත් වැඩිපුර එක් පොහොයක් උදාවීම භාග්‍යයකි.

එදිනට දාන, සීල, භාවනා දී කුසල්මය පින්කම්වල තව තවත් නියැළෙමින් අධ්‍යාත්මික සුවය සලසා ගැනීමට වීර්ය වඩන්නන්ට අධි වසරක යෙදෙන අධි පොහොය දිනය මහඟු ආගමික තිළිණයක් ලෙසින් හැඳින්විය හැකිය.

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**



''දෙවු වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී.''

# සැපක් යැයි සිතන ආදරය පවා දුකකි

පුද්ගලයකුගේ හදවතේ තවත් පුද්ගලයකු කෙරෙහි යම් යම් බලාපොරොත්තු සහගතව උපදින සිතුවිල්ල ආදරය නම් වේ. මවට, පියාට, දූ දරුවන්ගෙන් හිමිවන ආදරය, පෙම්වතියගෙන් පෙම්වතාට ලැබෙන ආදරය, පෙම්වතාගෙන් පෙම්වතියට ලැබෙන ආදරය, සතා සිව්පාවාට අප විසින් දක්වන ආදරය යනාදී ලෙස සමාජයේ පුද්ගලානුබද්ධව විවිධ බැඳීම් තිබේ. එහෙත් ඒ සියල්ල තුළම පවතින්නේ දුක යැයි පැවැසුවහොත් එය වැරදි නැත. මන්ද ආදරය පවතින්නේ බලාපොරොත්තු මතය. තමා ආදරය කළ දෙය නොලැබී යන විට හෝ වෑනසී යන විට ඒ පිළිබඳව සිතේ දැඩි සේ වෛරයක් හෝ දුකක් ඇතිකර ගනී. එමගින් සිත නොසන්සුන් වේ. "සම්පිච්ඡං න ලභති යම්පි දුක්ඛං", "පියේහි විප්පයෝගො දුක්ඛෝ" යනාදී ලෙස ධර්මයෙහි ගැබුරින් සඳහන් වන්නේ මේ පිළිබඳවය. නිදසුනක් ලෙස දෙමාපියන් දූ දරුවන් කෙරෙහි අපිරිමිත සෙනෙහස වඩති. ආදරය කරති. ඔවුන්ට රැකවල් දෙති. ඔවුන්ගේ අවශ්‍යතාවන් පිළිබඳ සැලකිලිමත් වෙති. එසේම දූ දරුවන් නොමඟ යන විට ශෝක කරති, බැණ වදිති, හඬා වැළපෙති. මන්ද ආදරය යනු බැඳීමක් නිසාවෙනි. එහෙත් බුදුන් වහන්සේගේ දේශනාවන්ට අනුව දෙමාපියන්ගෙන් දරුවන්ට ලැබිය යුත්තේ මෛත්‍රිය, මුදිතාව, කරුණාව, උපේක්ෂාව යන කරුණුය. ආදරය හා මෛත්‍රිය තුළින් නැවත යමක් ලැබීමට බලාපොරොත්තු නොමැත. නිදසුනක් ලෙස අප අප්‍රිය, මනාප, ප්‍රිය මනාප සැමටත් මෛත්‍රිය භාවනාවෙන් මෙත් වඩමු. එමගින් අපේ හිතේ යම් බලාපොරොත්තුවක් ඇතිකර ගන්නේ නැත. මෛත්‍රිය පිටුපස රාගය, ආශාව, තරහා, වෛරය, ක්‍රෝධය, අමනාප නොමැත. එහෙත් ආදරය පිටුපස මෙම කෙලෙස් ගමන් කරයි. ඕනෑම සබඳතාවක් මෙත් සිතුවිලි පෙරදැරිව පවත්වාගෙන යාමෙන් හඬා වැළපීමට, මුලා වීමට අවශ්‍ය නැත. එබැවින් නිරන්තරයෙන් ලෝක සත්වයා වෙත මෛත්‍රී සහගතව බැලීමට සිතා ගත යුතුය. එසේම මෛත්‍රී සහගත වේශයෙන් පැමිණෙන ආදරය, රාගය වෙතද අපගේ නුවණින් විමසා බැලීම අවශ්‍ය වේ. වංක ධර්ම ලෙස අපගේ වෙත එන මෙම මෛත්‍රිය සිහි නුවණින්ම විසඳා ගත යුත්තකි. නැතහොත් මෛත්‍රිය යැයි මුලාවට පත්ව ක්ලේශ ධර්මයන්ගේ පැටලීමට ඉඩකඩ පවතී.

පූජ්‍ය සුගම අනෝමදස්සි හිමි - කැලණිය විශ්වවිද්‍යාලය




"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."

ධර්ම දේශනය



# සියලු සුවඳ වර්ගයන්ට වඩා සිල් සුවඳ ශ්‍රේෂ්ඨය



"න පුප්ඵගන්ධො පටිවාතමෙති,
න චන්දනං තගර-මල්ලිකා වා,
සතං ච ගන්ධො පටිවාතමෙති,
සබ්බා දිසා සප්පුරිසො පවාති.

චන්දනං තගරං වාපි
උප්පලං අථ වස්සිකී
එතෙසං ගන්ධජාතානං
සීලගන්ධො අනුත්තරො"

"මල් සුවඳ හෝ සඳුන්, තුවරලා, බෝලිද්ද මල්වල සුවඳ හෝ උඩු සුළඟට නොයයි. බුද්ධාදී සත්පුරුෂයන්ගේ සිල් සුවඳ උඩු සුළඟට යයි. සත්පුරුෂයා සියලු දිශාවන්හි තම සිල් සුවඳ පතුරුවයි.

සඳුන් සුවඳ, තුවරලා, මානෙල්, දෑසමන් ආදී සියලු සුවඳ වර්ගයන්ට වඩා සිල් සුවඳ ශ්‍රේෂ්ඨයි."

දේශකයාණෝ - මහනුවර හයගිරි
විජයසුන්දරාරාම විහාරද්වයාධිපති,
ඓතිහාසික බදුලු මුතියංගණ රාජමහා විහාරාධිපති,
ශ්‍රී දළදා මාළිගාවේ තේවාවහාර,
අතිගෞරවාර්හ
වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද
ඤාණරතනාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර
පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේ

පින්වත්නි,


සීලය යනු සංවරයයි. හික්මීමයි. සමාධානය හෝ උපධාරණය යන සීලන අර්ථයෙන් ද සීලයැයි කියනු ලැබේ. කුසල කාය කර්මාදියෙන් විසිර යෑමට ඉඩ නොතැබීම සමාධානයයි. කුසල ධර්මයන් උපදවාලිය හැකි ආධාර භාවය උපධාරණයයි. සීලය වනාහි නිවනට ඇති මගෙකි. සීලයෙන් තෘෂ්ණාව නැමැති අවුල නිරවුල් කෙරෙයි. සිදලයි. සීලයේ පිහිටීමෙන් සමාධිය, ප්‍රඥාව වඩා ගැනීමට හැකි වෙයි. සීලයෙන් අධිසීල ශික්ෂාව ද, සමාධියෙන් අධිචිත්ත ශික්ෂාව ද, ප්‍රඥාවෙන් අධිප්‍රඥා ශික්ෂාව ද හට ගනී. සීලය ශාසනයාගේ මූලය

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

මෙන්ම ආදිය වේ. සීලයෙන් සෝවාන් බවට හා සකෘදාගාමී බවට ද පත්විය හැකිය.

සප්ත විශුද්ධියෙහි පළමු වැන්න සීල විශුද්ධියයි. සීල විශුද්ධියෙන් අදහස් කරනුයේ කයෙන්, වචනයෙන්, සිතෙන් සිදුවන වැරදි වලින් මිදී පිරිසිදුකම ලැබීමයි. සීල විශුද්ධිය ඇති කර ගැනීම සඳහා තමා සමාදන් වූ ශික්‍ෂා පද දිවි හිමියෙන් රැක ගැනීම, ඇස, කන, නාසාදී ඉන්‍ද්‍රිය දොරටු වලින් කෙලෙසුන් මතු වීමට ඉඩ නොදීම, දැහැමිව දිවි පෙවෙත ගෙවීම, සිහි නුවණින් ජීවිත උපකරණයන් පරිහරණය කිරීම යන මේ සතර සංවරය අනුව දිවි ගෙවිය යුතුය. එවිට ඇලීමක් හෝ ගැටීමක් ඇති නොවේ. මම ය, මාගේ ය යන හැඟීමෙන් තොරව සැහැල්ලු කයකින් හා සැනසිලිදායක සිතකින් ජීවිතය ගෙවිය හැකිය. ඇලීම්, ගැටීම් ආදියෙන් ඉවත් වීමෙන් චිත්ත විශුද්ධිය ඇති වෙයි. නිර්වාණාවබෝධයට ද සීල විශුද්ධිය හේතු වේ.

සීලය සිවු වැදෑරුම් වේ. පාතිමොක්ඛ සංවර සීලය, ඉන්‍ද්‍රිය සංවර සීලය, ආජීව පාරිශුද්ධි සීලය, ප්‍රත්‍යසංනිශ්‍රිත සීලය වශයෙනි. ප්‍රාතිමොක්‍ෂ සීලය චාරිත්‍ර, වාරිත්‍ර වශයෙන් දෙයාකාරය. ඒ සීලය රකින්නා සතර අපා දුකින් මිදෙයි. චේතනාදියත්, පාරාජිකා ආදී ඇවැත් සිදු වන වැරදි වලට නොපිවිසීමෙන් වන ශික්‍ෂා පද කඩ නොකිරීම පිළිබඳ උපදනා සිතත්, කාය වාග් ද්වාරයෙන් රැකෙන නිසා ද ප්‍රාතිමොක්‍ෂ සංවර සීලය නම් වෙයි. කාය වාග් ද්වාරයන්හි සංවරය, සුලු වරද පාරාජිකාවක් තරම් ලොකු කොට සිතමින් විසීම ද, ශික්‍ෂා පද අවිතික්‍රමණය නොකොට සමාදන්ව විසීම ද ප්‍රාතිමොක්‍ෂ සංවරයට හේතු වේ. ඇස, කන, නාසය, දිව, ශරීරය, සිත



යන ඉන්‍ද්‍රියන්ට අරමුණු වන රූප, ශබ්ද, ගන්ධ, ස්පර්ෂ ධර්ම යන අනුනිමිති ඉපදවීමෙන් රාග, ද්වේෂ, මෝහාදී ක්ලේෂයන් සිත තුළට වැද්ද ගැනීමට ඉඩ නොතබන්නේ ඉන්‍ද්‍රිය සංවර සීලයෙනි. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන පච්චය යන සිවුපසයන් සෙවීමේ උත්සාහය ආජීව පාරිශුද්ධ සීලයයි. ඒ හා සබැඳි ශික්‍ෂා පදයන් උල්ලංගනය නොකිරීමෙන් වන පාරිශුද්ධිය ද ආජීව පාරිශුද්ධියයි. මිථ්‍යා ජීවයෙන් තොරව, දැහැමින් සෙමෙන් උපයා ගත් දෙය පරිභෝජනය කිරීම ආජීව පාරිශුද්ධ සීලයේ ලක්‍ෂණයයි.
දිවි පැවැත්මට හේතු වන චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන පච්චය ආදිය නුවණින් සලකා පරිභෝජනය කිරීම ප්‍රත්‍යසංනිශ්‍රිත සීලයයි. ප්‍රත්‍යසංනිශ්‍රිත සීලය ප්‍රඥාවෙන් සම්පූර්ණ වේ.

පාතිමොක්ඛ සංවරය, සති සංවරය, ඥාණ සංවරය, ඛන්ති සංවරය, විරිය සංවරය යන පංචවිධ සීලය සංවරසීලය නම් වේ. සසර කෙටි කර ගැනීමට අපේක්‍ෂා කරන්නා පළමුව සීලය වැඩිය යුතුය. සිල්වතෙකු වූ විට සමාධිය ද ප්‍රඥාව ද වැඩෙයි. තිදොරින් සිදු වන අකුසල් වැළකීමට ද සීලය බොහෝ සෙයින් ඉවහල් වේ. සීලය කයෙන් වචනයෙන් නොබිඳ රැක ගැනීම අව්‍යතික්‍රම සීලය නම් වේ.

සීලය, චාරිත්ත සීලය, වාරිත්ත සීලය යනුවෙන් දෙවැදෑරුම්ය. චාරිත්ත සීලය නම් මේ දේ කළ යුතුයැයි බුදුන් වහන්සේ පනවා වදාළ ශික්‍ෂා පදයන්ට අනුව පැවතීමය. මේ දේ නොකළ යුතුයැයි පැනවූ නොකළ යුතු දැයින් වෙන්වීම වාරිත්ත සීලයයි. චාරිත්ත සීලය ශ්‍රද්ධාවෙන් හා වීර්‍යයෙන් සිදු කළ යුතු අතර, වාරිත්ත සීලය ශ්‍රද්ධාවෙන්ම වැඩෙයි. තිදොරින් චාරිත්ත, වාරිත්ත සීලය සපුරා ලීමෙන් ලබා ගන්නා ගුණ ධර්ම ඵලාධිගමනයට ද හේතු වෙයි. දුසිල් බව දුරු කිරීමෙන් සීලයේ රසය දැනෙයි.

සීලය ප්‍රකට වන්නේ කය, වචනය, සිත යන තිදොරින් ඇතිවන සංවරය හා හික්මීම තුළිනි. ඉන් ක්ලේෂ දාහය නිවාලයි. ගුණ කීර්තිය පතුරුවයි. සීලය ගොඩනැගෙන්නේ කරුණාව, ප්‍රඥාව මතය. මෙලෙසින් මිනිසාගේ ආධ්‍යාත්මික දියුණුවට සීලයම ප්‍රමුඛ වෙයි. සීලයෙන් මිනිසා පාලනය වෙයි. සීලයෙන් තොර වූයේ නම් උගත්කමින් වැඩක් නැත. දුසිරිතෙන් වෙන් වීමට නම් අවම වශයෙන් පන්සිල් වත් රැකිය යුතුය. පන්සිල් රකින්නා මානව හිතවාදියෙකි. කෙලෙසුන් තවා යහපත් පුරුෂයෙකු විය හැක්කේ සීලයෙනි.

අප්‍රමාදී බවින් යුත් සිල්වතාට ලැබෙන ආනිශංස කීපයකි. මහත් වූ භෝග ලැබේ. කලණ ගුණ කීර්තිය ලොව පැතිරෙයි. ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ හෝ ගෘහපති පිරිසට හෝ ශ්‍රමණ පිරිසකට හෝ විශාරදව එළඹිය හැකිය. නුමුලාව කාලක්‍රියා කළ හැකිය. මරණින් මතු දෙව්ලොව ද උපදී.

සාමණේර පැවිද්දන් සාමණේර සීලයත්, උපසම්පදාව ලැබූ පැවිද්දන් සතර සංවර සීලයත් රැකිය යුතුව ඇත. ගිහියන් තමාගේ ප්‍රමාණයේ හැටියට නිවන අරමුණු කොට සීලයේ පිහිටිය යුතුය. ගිහියන් විසින් පංච සීලය ද, බ්‍රහ්මචරියක පංච සීලය ද, අෂ්ටාංග උපෝෂථ සීලය ද, නවාංගුපෝෂථ සීලය ද, දස සීලය ද යනාදී සීලයන් සමාදන්ව රැකිය යුතු වේ.

ගිහියන් විසින් පංචසීලයෙහි සිල් පද පහම අඛණ්ඩව රැකිය යුතුය. කුමන ආකාරයකින් හෝ සීලය සිදුරු නොමැතිව, පැල්ලමක් ඇති නොකරගෙන, නොකිළිටිව පවත්වා ගෙන යෑමට අදිටන් කරගත යුතුය. සීලයෙහි කිසිදු පැල්ලමක් ඇති නොකර ගනිමියි ද අදිටන් කර ගත යුතුය. පිරිසිදු සීලයක් පවත්වා ගෙන යමින් බුද්ධාදී මහෝත්තමයන් ප්‍රශංසා කරන ලද සීලය පවත්වා ගෙන යෑමට වෙර දැරිය යුතුය. සීලය සපුරා ගත යුත්තේ සමාධිය වඩාගත හැකි පරිදිය. සීලය මෙනෙහි කරන්නාට රාගයෙන් ද, මෝහයෙන්

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුදු මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."



ද මිදිය හැකිය. කය, වචනය, සිත සංවර කර ගත හැකිය. සාමයෙන්, සංසුන්ව ජීවිතය ගත කිරීමට හැකි වේ. සීලය නිසි සේ රකින්නා සියලු විපත්තීන්ගෙන් ද ආරක්‍ෂා වෙයි. දොම්නස්, කරදර, බාධක වලින් සිත මුදවා ගැනීමට ද සීලය උපකාරී වෙයි. සීලය විසින් තමන් ආරක්‍ෂා කරන බැවින් දෙව් බඹුන්ගේ ප්‍රසාදය ද, දිව්‍ය සම්පත් ද ලැබෙයි. පිරිසිදු සීලය තමන් වෙත ඇතැයි සිතා සතුටු විය හැකිය. එහෙයින් ගිහියන් විසින් ගැඹුරු ධර්ම කොටස් කෙසේ වෙතත් අවම වශයෙන් පංච සීලයවත් නිසි ලෙස රැකීමට උත්සාහවත් විය යුතුය.

දිනපතා හෝ විටින් විට සමාදන් වන පංච සීලයේ අර්ථය මැනවින් අවබෝධ කර ගනිමින් එය තම ජීවිතයට සම්බන්ධ කර ගනිමින් සීලයේ පිහිටා සිටින්නේ නම් මෙලොව පරලොව දෙකම ජයගත හැකිය. හොඳ යහපත් බෞද්ධයෙකු වීමට අවශ්‍ය බොහෝ කරුණු පන්සිල් පද පහේ ගැබ්ව ඇත. පැරණි සිංහල බෞද්ධයන් තුළ ගුණධර්ම රැකුනේ, සිල්වත්ව පංච සීලය මැනවින් ආරක්‍ෂා කර ගත් නිසාය.

පංච සීලයේ පළමු සිල් පදය වන 'පාණාතිපාතා වේරමණී සික්ඛාපදං' යනු පර පණ නැසීමෙන් වැළකී සිටීමයි. ඉන් තමාගේ මෙන්ම අනුන්ගේ ද ජීවිතය සුරක්ෂිත වේ. තම ජීවිතය තමන්ට ප්‍රිය වන්නා සේම අනෙකා ද තම ජීවිතයට ප්‍රිය මනාප වේ. තමන් නිදහසේ ජීවත් වීමට අපේක්‍ෂා කරන්නාක් මෙන් අන් අය ද නිදහසේ ජීවත් වීම අපේක්‍ෂා කෙරේ. ප්‍රාණ ඝාතය යනු මිනිස් ඝාතනය පමණක් නොව ලොකු කුඩා සියලු ප්‍රාණීන් නැසීම ගැනේ. පර පණ නැසීම තිරස්චීන ක්‍රියාවකි. මදුරුවන් මැරීම, මී උගුල් ඇටවීම, මස් පිණිස සතුන් ඝාතනය කිරීම, වැඩිහිටියන් විසින් හිරිකිතයෙන් තොරව සිදු කිරීමෙන් ඒවා දකින දරුවෝ ද පර පණ නැසීමට යොමු වෙති. ඉතා සුලු දෙයට පවා කෝප වී තම මවුපියන් හෝ සහෝදර සහෝදරියන් හෝ මිතුරන් හෝ අසල්වැසියන් හෝ අමානුෂිකව ඝාතනය කිරීමට යොමු වන්නේ අන් අයගේ ජීවිතය තම ජීවිතය මෙන් සලකා කටයුතු නොකරන බැවිනි. සිල් පදය හැඟීමෙන් තොරව සජ්ඣායනා කළාට ඉන් ඇති වන ප්‍රතිඵලයක් නැත. සිතේ කෙලෙස් මළ සෝදා ප්‍රාණ ඝාතයෙන් වැළකුණු පුද්ගලයා සියලු සතුන් කෙරෙහි කරුණාව, මෛත්‍රිය දක්වයි. කඩු, මුගුරු ආදී අවි භාවිතයෙන් වැළකෙයි. මෙම සීලයේ මනාව පිහිටා කටයුතු කිරීමෙන් අනුන්ගේ ජීවිත හානිය පමණක් නොව තමන්ගේ ජීවිත හානිය ද වළක්වා ගත හැකිය.

පන්සිල්හි දෙවන ශික්‍ෂා පදය වන 'අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි' යනු අන්සතු දේ බලයෙන් හෝ වංචාවෙන් හෝ තමන් සතු කර ගැනීමෙන් වැළකීමයි. සොරකමට ඇබ්බැහි වීමෙන් සැම දෙනාගේ සැකයට හා අවිශ්වාසයට පාත්‍ර වේ. සුලු වුවත් අන් සතු දෙය සොර සිතින් නොගෙන, ලැජ්ජා බිය ඇතිව තම ආත්ම ගෞරවය ආරක්‍ෂා කරමින් ජීවත් වීමට යත්න දරත් නම් සොරකමින් වැළකී සිටිය හැකිය.

පන්සිල්හි තෙවන ශික්‍ෂා පදය වන 'කාමෙසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි' යනු කාමයේ වරදවා හැසිරීමෙන් වැළකීමයි. ස්ත්‍රී පුරුෂ සම්බන්ධය පමණක් නොව වස්තුකාම, ක්ලේශකාම සැපතෙහි යෙදීම ද ලාමකය. කාමයේ වරදවා හැසිරීම ග්‍රාම්‍ය වූ පෘථග්ජනයන්ට අයත් වූ උතුම් නොවන අවැඩ පිණිස හේතුවන ක්‍රියාවකි.

සිවුවන ශික්‍ෂා පදය වන 'මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි' යනු බොරු කීමෙන් වැළකීමයි. බොරු කීමෙන් විශ්වාසය බිඳ වැටේ. ආත්ම ගරුත්වය පිරිහෙයි.

පස්වන සිවුපදය වන 'සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි' යනු මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමයි. මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිහි මුලාවට පත් වේ. තමන්ට තමන් පාලනය කර ගැනීමට නොහැකි වේ. අඬදබර, කලිකළහ ඇති කර ගැනීමෙන් තමන් ද වැනසී, අනුන්ද වැනසෙයි. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවෝ අඹු දරුවන් තලා පෙලා පීඩාවට පත් කරති. වස්තු විනාශ කර ගනිති. පවුලේ සාමය නැති කර ගනිති. මානසික, ශාරීරික දුර්වලතාවන්ට ලක් වෙති.

තෘෂ්ණාවෙන්, දෘෂ්ඨියෙන්, මානයෙන් කිළිටු නොවන ආකාරයෙන් සිල් රැකිය යුතුය. භව භෝග සම්පත් ලැබීමේ අපේක්‍ෂාවෙන් සිල් රකිතොත් තෘෂ්ණාවෙන් සිත කිළිටි වෙයි. සමථ, විදර්ශනා භාවනාවෙහි නොයෙදී සංසාර විමුක්තිය සීලයෙන් පමණක් ලැබිය හැකියි සැලකීමෙන් සිත කිළිටු වෙයි. තමාගේ සිල්වත්කම ගැන උදම් ඇනීමෙන් මාන කිළිටිය ඇති වෙයි. තමන් රකිනු ලබන සිල් පද මුල, මැද, අග යන තුන් තැන්හිම කඩ නොකොට රැකිය යුතුය. තමන් සමාදන් වන සීලයෙහි සිදුරු හෝ පැල්ලම් ඇති කර නොගත යුතුය. අතරතුර සිල්පද නොකැඩිය යුතුය. එවැනි සිල්වතා තෘෂ්ණාවෙන් මිදෙයි. නුවණැත්තන්ගේ පැසසුමට ලක් වේ. ඔහුගේ සිත තෘෂ්ණා දෘෂ්ඨි මානයන්ගෙන් නොකිළිටි වෙයි.

යටත් පිරිසෙයින් ඉහළ සීලයන් කෙසේ වෙතත් පන්සිල්වත් මැනවින් ආරක්‍ෂා කොට ජීවත් වීමෙන් මෙලොව ද, පරලොව ද දෙකම යහපත් වෙයි. මෙසේ දිනපතා පංචසීලය හා පොහොය අටසිල් සමාදන් වීමෙන් සසර ගමන කෙටි කර ගැනීමට අවශ්‍ය මූලික පියවර තැබීම අධිෂ්ඨානයෙන් කළ යුතුය. සිල්වත්ව ජීවත් වීමෙන් යහපත් ශ්‍රේෂ්ඨ ජීවිතයක් ඇති කර ගැනීමට අදිටන් කර ගනිමු.
තෙරුවන් සරණයි.

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."





# පමාවීමේ
## විපාක ගැන කියාදෙන
# කුටුම්බිය පුත්ත තිස්ස තෙරුන්ගේ කතා පුවත

කුටුම්බිය පුත්ත තිස්ස තෙරුන් මුල් කරගෙන කතා කළ හැකි රසවත් කතා පුවතක් සූත්‍ර පිටකයේ බුද්ධක නිකායේ ජාතක පාලියේ සඳහන් වී ඇත. එනම්, ඒකක නිපාතයේ අටවැනි වර්ගයේ පළමුවැනි වරණ ජාතක කතා පුවතයි. වස් කාලයට විශේෂයෙන් සම්බන්ධකමක් දක්වන මෙම කතා පුවත කාලීන වශයෙන් භික්ෂූන් වහන්සේලාට ආදර්ශමත් කතා පුවතක් වනවාට කිසිදු සැකයක් නොමැත. හාමුදුරුවන් විසිනම දෙනෙක් වස් කාලය තුළ මග ඵල ලබාගෙන බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශංසා ලැබූ අන්දමත්, තවත් භික්ෂූන් වහන්සේ නමක් ඉක්මනින් මගඵල ලැබීමේ අදහසින් භාවනා කිරීමට ගොස් තමන්ගේ පාදයක් කඩා ගත් ආකාරයත් මෙම කතා පුවතින් ඉදිරිපත් කොට ඇත.

බුදුරජාණන් වහන්සේ විසින් මෙම කතා පුවත දේශනා කොට ඇත්තේ කුටුම්බිය පුත්ත තිස්ස තෙරුන් අරභයා සැවැත්නුවර ජේතවනාරාමයේදීය. කුටුම්බිය පුත්ත තිස්ස තෙරුන් වහන්සේ සමග, සැවැත්නුවර මිත්‍රයන් වශයෙන් ජීවත් වූ තරුණයන් 30 දෙනෙක් ජේතවනාරාමයට ගොස් බුදුරජාණන් වහන්සේට වැඳ නමස්කාර කොට ශ්‍රද්ධාවෙන් හා ගෞරවයෙන් ධර්ම ශ්‍රවණය කරන ලදී. ඔවුන් ධර්ම ශ්‍රවණය කරන අවස්ථාවේදී ඔවුන්ගේ සිත්වලට හැඟී ගියේ ''පැවිදි විය යුතුයි'' යන සිතුවිල්ලයි. ධර්ම ශ්‍රවණය කර අවසානයේදී එම සිතුවිල්ල මුදුන්පත් කරමින් බුදුරජාණන් වහන්සේගෙන් පැවිද්ද ලබා, සුදුසු කාලයේදීම උපසම්පදාවත් ලබා, වස්කාලය ආරම්භයත් සමගම කමටහන්ද ලබා ඈත ගමකට ගොස් භාවනා කරන්නට වූහ.

මෙම තිස් නමගෙන් ඉතා අලස වූයේ අර කුටුම්බිය පුත්ත තිස්ස තෙරුන් වහන්සේ පමණි. උන්වහන්සේ ගැන හඳුන්වා දී ඇත්තේ ''**කුසීතො, හීනවීරියො, රසගිද්ධො**'' යනුවෙනි. එනම් කම්මැලියි, උත්සාහවන්ත නැහැ යන අදහසින් යුක්ත වීමයි. කැලේට වැඩියට පස්සේ දනේ ලැබෙන්නැති නිසා සැවැත්නුවර නතර වීම සිදු කළහ. එනමුත් අර අනෙක් භික්ෂූන් වහන්සේලා 29 දෙනාම කොසොල් රටේ එක් ගමක වස් වැසීම සිදු කොට ඒ කාලය තුළදීම විදර්ශනා වඩා සතර මග සතර ඵල අවබෝධ කරගෙන අමාමහ නිවන් සුවයද ලබාගන්නා ලදී.

නිවන් සුවය ලැබූ එම භික්ෂූන් වහන්සේලා විසිනම දෙනාම වස් කාලයෙන් පසු තමන් වහන්සේලා අරහත් බවට පැමිණි බව දන්වීම සඳහා බුදුරජාණන් වහන්සේ හමුවීමට වැඩම කළහ. බුදුරජාණන් වහන්සේද එම පිරිස දැක බොහෝ ප්‍රශංසා කරන ලදී. මෙය අසා සිටි කුටුම්බිය පුත්ත තිස්ස තෙරුන් වහන්සේද කුසීතව සිටීමේ විපාකය ලඟ ලඟියේම වටහාගෙන වීර්යයෙන් මහණ දම් පුරන්නට උත්සාහවන්ත වූහ. ඒ අනුව ඉතා ඉක්මනින් මාර්ග ඵල අවබෝධ කරගැනීමේ අදිටනින් නිදි නොලබාම භාවනාවේ යෙදීම හේතුවෙන් මධ්‍යම රාත්‍රියේදී බිත්තියට හේත්තු වී සිටීම නිසා බිම වැටී උකුලු ඇටය කඩා ගත්තේය. පසුදු උදෑසන බුදුරජාණන් වහන්සේ එම තෙරුන් දැක කොසොල් රටට යන්නට අවසර ගත්තත් නොගියේ මන්දැයි විමසූහ. එහිදී අනෙකුත් භික්ෂූන් වහන්සේලා එම සිදුවීම හුවා දැක්වූහ. පසුව බුදුරජාණන් වහන්සේ ඉස්සරත් මේ කුටුම්බිය පුත්ත තිස්ස තෙරුන් හදිස්සියට වැඩ කරන්නට ගොස් අනුන්ගේ ගමනට බාධා කළ බව දැක්වෙන පෙර කතා පුවත දේශනා කර වදාළහ.

පෙර මහා බෝසතාණන් වහන්සේ දිසාපාමොක් ඇදුරුව තක්සලාවේ උපන් අවධියේ පන්සියයක් මානවකයෝ උන්වහන්සේ ළඟ ඉගෙනුම් කටයුතු කළහ. එක් දවසක් මේ මානවක පිරිස දර ගෙන එන්නට කැලේට ගියේය. මෙහි සිටි කුසීත, කම්මැලි මානවකයෙක් සුවිසල් ලුණුවරන ගහක් දැක මේ ගසේ දර මැනැවැයි සිතා කැලේට නොගොස් ඒ ගහ මුලම ටික වේලාවක් නිදා ගත්තේය. අනෙක් මානවකා පිරිස කැලේට ගොස් දර සොයාගෙන එන ලදී. ඊට පසු අර දර රැගෙන ආ පිරිස මෙම කම්මැලි මානවකයා නිදා සිටින බව දැක අවදි කළේය.

ඊට පසු එම කම්මැලි මානවකයා අර ලුණුවරන ගසේ අතු කඩාගෙන ඒවා අනිත් මානවකයින් ගෙන ආ දර උඩින්ම තැබුවේය. පසුද අළුයම මහ බෝසතුන්ට ගමනක් යන්නට ඇති නිසා උදෙන්ම කැඳ හදන ලෙස ගෝලයින්ට දැනුම් දුන්හ. ගෝලයින්ද කැඳ පිසීම සඳහා ලිප දල්වන්නට දර ගොඩේ උඩින්ම ඇති දර ගෙන ලිප මෙලවීමට උත්සාහ කළද එය අසාර්ථක විය. එම හේතුවෙන් බෝසතුන් හට කැඳත් නොලැබී එම ගමන යැමටත් නොහැකි විය.

''යො පුබ්බෙ කරණියානි'' යනුවෙන් මුලින් කළ යුතු දේ පසුව කරන්නට සූදානම් වන තැනැත්තා කළ යුතු දේ අසාර්ථක වුණාම පසුතැවිල්ලට පත්වන බව මෙම කතා පුවත තුළින් පෙන්වා දී ඇත. ඒ අනුව අද සමාජය තුළද බොහෝ දෙනකු වෙලාවට වැඩ කටයුතු නොකර පසුවට වැඩ කල් තබා ගැනීමේ සිරිතට හුරු වී ඇති අයුරු දක්නට ලැබේ. එය එතරම් සාර්ථක ක්‍රමයක් නොවේ. වීදගම මාහිමියන් ලියූ ලෝවැඩ සඟරාවෙන් දැක්වෙන්නේ,

''අද අද එයි මරු පින් කරගන්නේ
කෙලෙසද හෙට මරු නේති සිතන්නේ''

යනුවෙන් මාරයා අද එන බව සිතන ලෙසත්, හෙට මරු එතියි කියා සිත සිතා නොසිත තම කටයුතු කරගන්නා ලෙසත්ය.

''අප්ප මාදො අමත පදං - පමාදො මච්චුනො පදං
අප්ප මත්තාන මී යන්ති - යෙ පමත්තා යථා මහා''

යන ගාථා ධර්මයට අනුව ප්‍රමාදයේ ආදීනව දැක්වෙන උදේනි රජ බිසවක් වන සාමාවතී ඇතුළු කුමාරිකාවන් පන්සිය දෙනකුගේ මරණය ගැන වදාළ බණ කතාවත් සිහියට ගෙන නොපමාව කුසල් දහම් රැස්කොට මේ භයංකර සසර කතරට විරාමයක් තබා බුදු හිමි විසින් සොයා දුන් උතුම් අමා මහ නිවන් සැපත ලබා ගැනීමට සැම කෙනකුම උත්සාහ කළ යුතු බව මතක් කිරීමට කැමැත්තෙමි.

**පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි**

''සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහ් හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ.''

# යොවුන් ආදරය පිළිබඳ බෞද්ධ මතය කුමක්ද?

## කැලණි වෙහෙර වැන්දොත් උපන් දා සිට කරපු පව් නැති වෙනවාද?

## බරලොස්සු කටුව බලා කෙරෙන ඇතැම් ආගමික පුද සිරිත් බුදු දහමට කෙතරම් ගැලපෙනවාද?

## මියගිය ඥාතීන්ට ඕනෑම තැනක සිට පින් අනුමෝදන් කළ හැකිද?

### ඉඟුරුවත්තේ පියනන්ද හිමියන්ගෙන් අසමු


❑ යොවුන් ආදරය පිළිබඳ බෞද්ධ මතය කුමක්ද?

යොවුන් වියට පත් තරුණ තරුණියන් අතර අන්‍යෝන්‍ය වශයෙන් රාග නිඃශ්‍රිත ඇලීම්, බැඳීම් ඇතිවේ. එය සාමාන්‍යයෙන් මිනිස් ගතියකි. එය තවත් අයුරකින් කියතොත් ප්‍රස්තුතයට අනුව ආදරය යනු අන්‍යෝන්‍ය අවබෝධය පදනම් කරගත් බැඳීමකි. තරුණ තරුණියන් අතරදී එය යොවුන් ආදරය නමින් ව්‍යවහාර කළද, ආශාවන්හි වහලුන් ලෙස ක්‍රියා කිරීමේදී, අතෘප්තිමත් ලෙස සිය අභිමතාර්ථයන් ඉෂ්ට කර ගැනීම සඳහාම ක්‍රියා කරන අයකු තුළ සාමාන්‍යයෙන් කරුණාව, මෛත්‍රිය පදනම් කරගත් අහිංසකත්වයෙන් යුත් ගැඹුරට කා වැදුණු ආදරයක් ඇති නොවේ. එය තිරශ්චීන සත්වයන්ගේ ස්වභාවයකි. තරුණ තරුණියන් අතර සදාචාර සීමාවන් තුළ ඔවුනොවුන් පිළිබඳ හැඟීමක් ඇතිවීම පසුව අන්‍යෝන්‍ය අවබෝධය මත බොහෝ විට දිගුකාලීන ජීවිතයක ආරම්භයක් සනිටුහන් කරමින් අව්‍යාජ ආදරයක් බවට පත් වෙයි. ඇත්ත වශයෙන්ම එය රැවටිලි බවෙන් තොර අව්‍යාජ බැඳීමක් විය යුතුය. නමුත් නූතන සමාජයේ පවත්නා අති බහුතරයක් තරුණ තරුණියන් අතර ඇති කර ගන්නා ප්‍රේමය නමින් හඳුන්වා දෙන ආදරය බොහෝ විට ආත්මාර්ථකාමී, ව්‍යාජ, තාවකාලික එකක් මෙන්ම හුදු ආශ්වාදය මතම ඇතිවන බව ප්‍රකටය. මේ නිසා අද අපේ බෞද්ධ සමාජය තුළ ඇතිවී තිබෙන, ඇතිවෙමින් තිබෙන ගැටලු, ප්‍රශ්න විශේෂයෙන් කාන්තා පක්ෂය අසරණවීම් නිමක් නැත.

පුහුදුන් බවින් යුත් සමාජය තුළ රාගාදී කෙලෙස්වලින් දෝරේ යන සමාජ තලයක වෙසෙන අය අතර විශේෂයෙන් දහමින්



''වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වන්න.''



දුරස් ජීවිත ගත කරන අය තුළ දුර දිග බැලීම, බුද්ධිමත් ලෙස පොරොන්දු දීම හා තීරණ ගැනීම බොහෝ සෙයින් විරලය. බොහෝ විට මෙයට හේතු වනුයේ ඉඳුරන්ගේ අසංවර භාවයයි. බුද්ධ දේශනාව තුළ යෞවන යෞවනියන් ගැන සඳහන් කර ඇත්තේ ආවාහ, විවාහ ජීවිතවලට පත්වන තෙක් මව්පියන්ගේ රැකවරණය තුළ ජීවත් වන කාලය කුමර, කුමරි බඹසර රකිමින් සංවරශීලී, ශීලාචාර ජීවිතයක් ගත කළ යුතු බවය. මේ තුළින් තරුණ තරුණියන් අතර අන්‍යොන්‍ය ඇසුරට බාධාවක් නැති වුවද එම ඇසුර සීමා සහිත ඇසුරකි. නූතන සමාජය එම තත්ත්වයෙන් මිදීම නිසා අද තරුණ තරුණියන්ගේ ජීවිතවලට අත්වන ඉරණම මෙහිලා සඳහන් කිරීම අනවශ්‍යය. ගෘහ ජීවිතයට එළඹුණු අය විසින්ද ස්වදාර සංතෘෂ්ඨීය, ස්ව පුරුෂ සංතෘෂ්ඨීය (පතිවෘතාව) බුද්ධ දේශනාව තුළින්ද මැනවින් අවධාරණය කර ඇත. ගිහි ජීවිතය ගත කරන කවර වයසේ අයකු වුවද ස්ත්‍රී පුරුෂ භේදයෙන් තොරව අසීමිත ආශාවන් ඔස්සේම නොදුවා ජීවිතය ගත කරත් නම් එය කෙතරම් ආදර්ශමත්ද? මිනිසත් බවට ගැළපේද?

බුද්ධ දේශනාවෙන් පිළිබිඹු වන ගිහි බොදු ප්‍රතිපදාව තමාගේ ආජීවය පදනම් කර ගත් සරල ජීවන මාර්ගයකි. පඤ්චශීල ප්‍රතිපදාවෙන් තම ජීවිතය සකසා ගත් තෙසරණය තම ප්‍රතිශ්ඨාව කරගත් ගිහි බෞද්ධයා කෙතරම් වාසනාවන්තයෙක්ද? සිඟාලෝවාද, ව්‍යග්ඝපජ්ජ, මංගල, පරාභව, අණන වැනි සූත්‍ර ධර්ම තුළින් පැහැදිලි කෙරෙන ගිහි බොදු ප්‍රතිපදාවට අනුව යමෙක් තම ජීවිතය සකසා ගනියි නම් තෘප්තිමත් නිරවුල් ජීවිතයක් අනිවාර්යයෙන්ම ගත කළ හැකියි.

කරුණු මෙසේ වුවද අද අපේ ගිහි තරුණ තරුණියන් පමණක් නොව වයස්ගත මහළු වියේ අය පවා කාමයන්හිම ඇලී ගැලී ඉඳුරන් පිනවීමම තම ජීවිතයේ එකම පරමාර්ථය කරගෙන තම අදහස් මුදුන් පමුණුවා ගැනීම සඳහාම කවර නම් හෝ නොහොබිනා වැඩක් වුවද කිරීමට පසුබට නොවන ප්‍රවණතාවක් පැහැදිලිව දක්නට තිබීමෙන් පෙනී යන්නේ නරුම සමාජයක් ඉතා වේගයෙන් වර්ධනය වන බවයි. නගරබද මෙන්ම ගැමි සමාජ තලයන් තුළද (බෞද්ධ) ස්වදාර, ස්වපුරුෂ සංතෘෂ්ඨීය සිහිනයක් බවට පත්වෙමින් තිබේ. සියයට වැඩි ප්‍රමාණයක් පවුල් තුළ ගෘහ ජීවිතය අවුල් වී අඹු-සැමියන් අතර අන්‍යොන්‍ය විශ්වාසය පළුදු වී ගොස්ය. ලජ්ජාවෙන් පීඩිතව තම දූ දරුවන් නිසා ප්‍රශ්න හිස මත තබාගෙන හැඬූ කඳුළෙන් අපා දුක් විඳින කාන්තාවන් අප රටේ කොපමණ වෙසෙත්ද? යම් සමීක්ෂණයක් කළොත් බෞද්ධ සමාජයේ සදාචාරාත්මක ස්වභාවය තේරුම් ගත හැකි වෙයි. නමුත් බොහෝ අයගේ පවුල් ජීවිතය ආරම්භය දෙසට සිත යොමු කළහොත් ඉන් බොහෝ දෙනෙක් සමහර විට කලක් තිස්සේ ආදරයෙන් බැඳී, ඔවුන් දන හඳුනාගෙන විවාහ පත්වූ අය වෙති. නමුත් විවිධ හේතූන් මත තම තමන්ගේ සිත් පාලනය කර ගැනීමට නොහැකි නිසාත්, ආශාවන්හි වහලුන් වීම නිසාත් බොහෝ දෙනෙක් මැදුම් වයස ඉක්මවන විට දුකෙන් දොම්නසින් කාලය ගෙවති. සිය දූ දරුවන්ගේ නින්දා අපහාසවලටද භාජන වෙති. ඇතැමුන් සිය පණ හානිකර ගැනීම, අන්‍යයන්ගේ ජීවිත විනාශ කරන අවස්ථා පවා විරල නොවේ.

බුද්ධ දේශනාව අනුව ලද දෙයින් සතුටු වීම, ආශාවන්ට වහලුන් නොවීම, ආගමික කටයුතුවල යෙදීම වැනි ක්‍රියාවලින් ඇත්වීම ප්‍රධාන හේතුවක් සේ දැක්විය හැකි අතර, කාන්තා පක්ෂයද සිය දූ දරුවන් හැදීම, වැඩීම, ස්වාමියාගේ කටයුතුවලට සහයවීම පසෙක තබා මිල මුදල් සෙවීම එකම පරමාර්ථය කොටගෙන විදේශීය රටවල රැකියාවලට යොමුවීම නිසා අති බහුතරයක් පවුල්වල සමගිය සමාදානය, මාපිය දූ දරු සහ සම්බන්ධය දුරස් වී ඇති බව පැහැදිලිය. බුද්ධ දේශනාව තුළින් ගිහි බොදුනුවන්ගේ ජීවිතය සමගිය, සමාදානය, සතුට, ආත්ම තෘප්තිය ඇති කර ගන්නා ආකාරය මැනවින් දක්වා තිබියදී ඒවා නොතකා හැරීම පිළිබඳව කළ යුත්තක් නැත.

**❒ මෙහෙණින් වහන්සේ නමකට පිරිමි පක්ෂයෙන් වැඳුම් ලැබීම සුදුසුද?**

මහණ යනු භික්ෂුවයි. මෙහෙණ යනු භික්ෂුණියයි නොහොත් පැවිදි බවට පත්වූ කාන්තාවයි. භික්ෂු සේම භික්ෂුණියද පිරිමි පක්ෂයෙන් වැඳුම් පිදුම්, ගරු බුහුමන් ලැබීමට සුදුසුය.

ගිහි පක්ෂයෙහි වැඩිහිටි පිළිවෙළ සැලකීමට වඩා භික්ෂු ශාසනය තුළ වැඩිහිටි බව සැලකීම තරමක් වෙනස්ය. කෙතරම් වයස්ගත වුවද උපසම්පදාවෙන් වස් අඩු භික්ෂුව, වයසින් අඩු වුවද උපසම්පදාවෙන් වස් වැඩි භික්ෂුවට වැඳුම්, පිදුම්, ගරු බුහුමන් කළ යුතුය. ඔවුන් කෙතරම් උගතුන් වුවද, කුමන ගෞරව පදවි තානාන්තර ලැබුවද, භික්ෂු සමාජය තුළ වැඩිහිටි භාවය සලකනුයේ උපසම්පදාවෙන් වෘද්ධ භාවය අනුවයි. එනමුදු භික්ෂුණිය කෙතරම් වස්වලින් වැඩි වුවද භික්ෂුවකට (උපසම්පදාවෙන් නවකයෙක් වුවද) වැඳුම්, පිදුම්, ගරු බුහුමන්, පෙර ගමන්, පසු ගමන් දැක්වීම කළ යුතු බව විනය පිටකයෙහි දැක්වේ. මේ සසුන් පිළිවෙතයි. ගිහි පක්ෂය විසින් (රජකු වුවද) භික්ෂු භික්ෂුණී, සාමණේර, සාමණේරි සියලු දෙනාටම වැඳුම් පිදුම්, ගරු බුහුමන් කළ යුතුය.

**❒ මියගිය ඥාතීන්ට පින් දීමේදී ඔවුන් පෙර පදිංචිව සිටි ස්ථානයේදීම පින් දිය යුතුද? වෙනත් තැනක සිට දෙන පින් අනුමෝදන් විය නොහැකිද?**

මියගිය ඥාතීන්ට පින් පැමිණවීමේදී ඔවුන් පෙර ජීවත් වූ නිවසේදීම පින් පැමිණවිය යුතු යැයි කියා සම්මතයක් නැත. කුමන ස්ථානයක සිට පින් දුන්නත් පරදත්තුප ජීවී නමැති ආත්ම භාවයට පත්ව සිටියොත් ඔවුනට පින් ගත හැකිය. ඒ බව බුද්ධ දේශනාවේ එන ජානුස්සෝණි බමුණාට බුදුරදුන් වදාළ එක්තරා සූත්‍රයක දැක්වේ. එයින් කියනුයේ මියගිය ඥාතීන්ට ස්ථානයේ පින් ගත හැකි බවත්, අස්ථානයේ පින් ගත නොහැකි බවත්ය. එහි ස්ථානය නම් පරදත්තුප ජීවි ආත්මයයි. අස්ථානය නම් සෙසු ආත්ම භාවයන්ය.

අද අප බොහෝ විට මියගිය ඥාතීන්ට පින් දීමකදී අරමුණු කර ගනුයේ මේ ජීවිතයේ අප සමග ජීවත් වූ මව්පිය, දූ දරු යනාදී යම් ඥාතියෙක් හෝ පිරිසකි. එබඳු අය ඇතැම් අවස්ථාවක තමන් පෙර ජීවත් වූ නිවෙස් කරා පැමිණෙන බවද, සවිස්තරාත්මකව තිරෝකුඩ්ඩ සූත්‍රයෙහි දැක්වේ. එසේවතුදු ආත්ම සිය දහස් ගණනක් ඉකුත්වී ගියද ඥාති ප්‍රේතයන් හට තම ඥාතීත්වයෙන් පින් අනුමෝදන්ව සැප ලැබිය හැකි බව බිම්සර රජුගේ ඥාතීන්ට පින් දීමේ ප්‍රවෘත්තියෙන් මනාව පැහැදිලි වේ. ඒ අනුව කාලය, ස්ථානය ඔවුනට පින් ගැනීමට කිසිදු බාධාවක් වන බවක් නොපෙනේ.

**❒ අපේ රටේ ඇතැම් පළාත්වල කෙනෙක් මියගිය පසු මෘත ශරීරය ගෙතුළින් පිටතට ගනුයේද සුදුසු වේලාවක් අනුවය. එම නිසාම අවසන් කටයුතු ප්‍රමාද වීමෙන් ගිහි පැවිදි සියල්ලෝම බලවත් අපහසුවට පත්වන අවස්ථා අපමණය. මෙය බෞද්ධ කමට ගැළපේද?**

අප රටවාසී බෞද්ධ ජනතාව තුළ මෙන්ම ඔවුන් සිදු කරන

"ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත."


ඇතැම් චාරිත්‍ර වාරිත්‍ර අතර බෞද්ධකමට නොගැළපෙන බුද්ධි ගෝචර නොවන අවිචාරමත් ක්‍රියාකාරකම් කොපමණ තිබේද? මෙයට පෙර ප්‍රශ්නයට අදාළ

ඉදිරිපත් කළ කරුණු බඳු ඒ හා සම්බන්ධ දෙයකි මේ
ෂන්ද ඉදිරිපත් කර ඇත්තේ. බෞද්ධයන් වශයෙන් අප කා
නිසා ප්‍රධාන සත්ව වර්ගයාගේ ජාති, ජරා, ව්‍යාධි, මරණාදී
ක ස්වභාවයන් පිළිබඳ යම් ප්‍රමාණයක අවබෝධයක්
ප යම්කිසි ලොවක සිට මව්කුසට පැමිණියේද, මව්කුසින්
යේද පූර්ව දැනුම් දීමකින් තොරව නැකැත් හෝරාව අනුව
). ඉපදීමෙන් අනතුරුව හෝරා, දසා අපි සාදා ගනිමු.
ම දිරීමට පත්වීම, ලෙඩ රෝග සෑදීමද පූර්ව දැනුම්
තොරව නැකැත් නිමිති ක්‍රමයකට අනුව සිදුවන බවක්
පනේ. මේ ලොවින් සමුගන්නා මරණය පිළිබඳවද කිව
ඒ ඒ ටිකමය. ඇතැම් විට
ඒ හෝ රෝහලකදී හෝ මහමග
ියැදෙන මිනිසාගේ සිත සුන්
නිවසට ගෙනෙනුයේද සුබ
කට අනුව නොවේ. එසේ
ෘත කලේබරය තිබූ තැනින්
ට ගැනීමට වේලාවක්, නැකතක්
යද? අනවශ්‍යයි. එය කිසිසේත්
ද්ධ සංස්කෘතියට හෝ හෙළ
ට අයත් නොවන වෙනත්
මකින් කොපි කරගත් නොවැදගත්
ක් බව ඉඳුරාම කිව හැකියි. මෙම
ාරමත් ක්‍රියාවෙහි කිසිදු හරයක්
ැයි මා නම් විශ්වාස නොකරමි.
මෙබඳු ක්‍රියාවලින් සිදුවන එකම
පත එම මෘත දේහය පිළිබඳ සිදු
න ආගමික සහ ජාතික සිරිත්
ත් යම් ප්‍රමාණයකින් හෝ ප්‍රමාදවීම
ණි. මෙතරම් දියුණු යුගයක
සෙන අප මුග්ධ හරසුන් ක්‍රියා
හැර කොට අර්ථවත් ක්‍රියා දෙසට
ාමු වන්නේ නම් කෙතරම් යෝග
ද?

☐ ස්වාමීන් වහන්ස, අප
කරෙහි අනුකම්පා කොට අපායවල්
ා දිව්‍යලෝක පවතින්නේ කොහිදැයි
හඳා දුන මැනවි?

මෙම අසිරිමත් විශ්වය තුළ සිදුවන දෙයින් අප දකිනුයේ, අප
ත්රුම් ගනුයේ ඉතාමත් සුළු පරාසයකි. අනන්තාපරිමාණ ලෝක
ධාතුන් අතර නොහොත් මේ විශ්වය තුළ අප වෙසෙන ලෝකය
ඉතා සුළු ප්‍රදේශයකි. සඳ නැති වළාකුලින් තොර රාත්‍රියක
අහස දෙස බලන්න. කෙතරම් ග්‍රහලෝක හෙවත් තාරකා අපට
දෘෂ්‍යමාන වේද? මෙම ග්‍රහ වස්තු අතරත් බුද්ධ දේශනාව අනුව
අප්‍රමාණ සත්වයන් වාසය කරන ලෝක තිබේ. අපට නොවැටහුණ
පමණින්, අපේ තාර්කික බුද්ධියට අසු නොවූ පමණින් ඒවා
නැතැයි ගැනීම ඥානවන්ත නොවේ. අපට වඩා සත සහස්‍ර
ගුණයෙන් ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවෙන් හෙබි බුද්ධාදී
උතුමන්ගේ ප්‍රඥාව අතිශයින් ගැඹුරුය. එම විෂය අපට අවිෂයය.

සාමාන්‍ය ජනතාවට අවිෂය. ඔවුන් එක් යුගයක හාස්‍යයෙන් පිළිකෙව් කළ බොහෝ අජටාකාශ තොරතුරු නූතන ලෝකයේ තාරකා විද්‍යාඥයන් විසින්, භූ විද්‍යාඥයන් විසින්, විද්‍යා තාක්ෂණ උපකරණ මගින් සොයාගෙන ඇත. මෙයට වසර දෙදහස් පන්සිය අනූවකට පමණ පෙර ගෞතම බුදුරදුන් විශ්වය පිළිබඳ දේශනා කළ අසිරිමත් දෑ යථෝක්ත විද්වතුන්ගේ සොයා ගැනීම් නිසා එහි ඇති සත්‍යතාවය විද්වතුන් තුළ පවා විස්මයට පාත්‍ර වී ඇත. මේ නවවිට විද්වතුන් අනන්ත විශ්වයේ ඉතා සුළු ප්‍රමාණයක් ඔවුන්ගේ නිරීක්ෂණයට භාජනය කර ඇත.



අප වසන මේ ලෝකය තුළම බුදුරදුන් දේශිත සතර අපා අතරින් තිරිසන් ලෝකය බෙහෙවින්ම ප්‍රකටය. ප්‍රේත ලෝකයේ වසන ඇතැම් සත්ව කොට්ඨාසද මිනිස් ලෝකය තුළද සිටින බවට නොයෙකුත් තොරතුරු වාර්තා අසන්නට ලැබේ. ඇතැම් විට අපේ ඇසටද ඒවා විෂය වන අවස්ථා තිබේ. මේ පිළිබඳව ඇමෙරිකා, යුරෝපා වැනි රටවල කරන ලද පරීක්ෂණ තුළින් විස්මිත තොරතුරු සොයා ගෙන තිබේ. මිනිස් ලෝකයෙහිම ප්‍රකට ලෝකයෙන් කොටසක් ඇති බව මේ අනුව උපකල්පනය කළ හැකියි. සෙසු මහා නරක සහ අසුර ලෝක ඇතැම් විට අප වසන ලෝකයෙන් බැහැර ලෝකයක හෝ කර්මානුරූපව විශ්වයේ කවර තැනක හෝ තිබිය හැකියි.

දිව්‍ය බ්‍රහ්ම ලෝක පිළිබඳව කිව යුත්තේද චාතුර්මහා රාජිත නමැති දිව්‍ය ලෝකයට අයත් තරමක් ඖදාරික දෙවියන් කොටසක් වන ගස්වැල්, පර්වත, මුහුදු, භූමි යනාදිය ඇසුරෙහි වෙසෙන දෙවියන් මේ මිනිස් ලෝකය තුළද, උසස් දිව්‍ය නිකායන් අනන්තාපරිමාණ විශ්වය තුළ අප වෙසෙන ලෝකයට ආසන්නව පිහිටි ලෝක ධාතුවල වාසය කරන බව අනුමාන කළ හැකියි. ඒ පිළිබඳ සංයුක්ත නිකායෙහි මෙන්ම වෙනත් සූත්‍ර ධර්මයන්හි දක්වෙන දිව්‍ය නිකායන් පිළිබඳ විමසිල්ලෙන් කියවන විට වටහා ගත හැකියි.

බුද්ධ දේශනාව පිළිබඳවද නූතන විද්වතුන්ගේ සොයා ගැනීම් අනුවද අන්තගාමී නොවී මැදහත්ව කල්පනා කරන අයකුට අපායවල් හා දිව්‍ය ලෝක පිළිබඳව ගැටලුවක් පැන නොනගී.

බුදුවරයෙක් ලොව පහළ වූ අවස්ථාවක මිනිසත් බවක් ලැබීම ඉතාමත් දුර්ලභ ලැබීමකි. එම අවස්ථාවෙන් ගත යුතු ප්‍රයෝජනය විශ්වය පිළිබඳ, සත්වයා පිළිබඳ වාද විවාද, තර්ක ඇති කරමින්, වටිනා ක්ෂණ සම්පත්තිය ගෙවා දමමින් තම පාණ්ඩිත්වය අනුන්ට පෙන්වීම නොවේ. සත්වයා යනු දුක් ගොඩකි. ඉපදීම යනු දුක් රැසක හට ගැනීමකි. මරණය යනු දුකකින් තවත් දුක් ගොඩකට වැටීමකි. මෙයයි සංසාර තත්ත්වය. බුදුවරු දහම් දෙසනුයේ මේ තත්ත්වය වටහා දී සසර දුකින් මුදවාලීමටය. එබැවින් අප බෞද්ධ සාහිත්‍යයේ එන කරුණු දඩමීමා කොට ගෙන අනවශ්‍ය වාද විවාද ඇති නොකොට චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීම සඳහා උත්සාහ කළ යුතුය.

☐ **සජීවී පිරිත් දෙසුමකින් ලැබෙන ගුණ බල ආනිශංස පටිගත කොට ගුවන් විදුලියෙන් විසුරුවා හරින පිරිත් දෙසුමකින් ලැබිය හැකිද?**

දේශක, ශ්‍රාවක දෙපිරිස එක්ව සිදු කෙරෙන සජීවී පිරිත් දෙසුමකින් ලැබෙන ගුණ බල ආනිශංස කලින් පටිගත කරන ලද පිරිත් ධර්මයක් නැවත විසුරුවා හැරීමෙන් ලැබිය හැකි යැයි සිතිය නොහේ. එහෙත් ශ්‍රාවකයා මැනවින් ශ්‍රවණය කෙරේ නම් එයින් තම සන්තානය තුළ තෙරුවන් පිළිබඳ විශේෂයෙන් කෙලෙස් මල දුරුකරන ධර්මය පිළිබඳ පැහැදීමක් ඇති වේ. එය මැනවින් අර්ථ මෙනෙහි කරමින් ශ්‍රවණය කෙරේ නම් ධර්මයෙන් ලැබිය හැකි සුවිශේෂ ආනිශංස ලැබීමටද කිව හැකි බාධාවක් නැත.

දේශකයා මෙත් කරුණා ගුණ පෙරටුව සිදු කරන සජීවී පිරිත් දෙසුමක ඇති ''සජීවී බලය අජීවී'' පිරිත් දෙසුමකින් ලැබීම දුෂ්කර බව පෙනේ. දේශක - ශ්‍රාවක දෙපක්ෂයම සජීවීව එම කටයුත්තට සම්බන්ධ වීමෙන් යහපත් ප්‍රතිඵල ලබාගත හැකියි.

''ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය.''

**"කල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දේසිස්සාමි. නිත්තරණත්ථාය නො ගහනත්ථාය"**

*(මහණෙනි, මෙම පවුර උපමා කොටගෙන දහම් දෙසන්නෙමි. ඒ ධර්මය එතෙර වීම පිණිසය. ගැනීම පිණිස නොවේ.)*

සැඩ පරුණ ගංගාවකින් එතෙර වීමට අවශ්‍ය පුද්ගලයෙක් විවිධ දඬු කැබලි, වැල් කැබලි එකතු කොට පහුරක් තනාගෙන තමාගේ දෑතේ වීර්යයෙන් ගංගාව එතෙර වෙයි. එසේ පහුරක් ආධාර කොටගෙන ආයාසයෙන් ගංගාව එතෙර වූ පුද්ගලයා කිසි විටෙක ගංගාව තරණය කළ පහුර කර තබාගෙන යන්නේ නැත. එනම් පහුර වුවමනා වන්නේ තරණයට මිස යන යන තැන රැගෙන යාමට නොවන නිසාය. ධර්මයද මෙම පහුර වැනිය. ඒ වනාහී කාම, දිට්ඨි, භව, අවිජ්ජා යන සතර ඕඝය තරණය කිරීමට ඇති පහුරයි.

නමුත් වර්තමාන සමාජයේ බොහෝ දෙනෙක් මෙකී භාවිතය නොදන්නාකම නිසා ධර්මය වරදවා ගෙන ඇති බවක් පෙනෙන්නට ඇත. එනම් අවශ්‍ය දෙයට වඩා අනවශ්‍ය දෙය පසුපස හඹා යන ස්වභාවයකි. එනම් බණ අසමින් සිටිනවා විනා බණ පිළිපදින බවක් නොපෙනීමයි. බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය වනාහී හුදෙක්ම පුද්ගල ජීවන දර්ශනයයි.

වී බීජයක් පැළවී අස්වැන්නක් ගෙන දීමට නම් පසුබිම සෑම අතින්ම සාරවත් විය යුතුය. එසේම නිර්වාණය නම් වූ බීජයද ප්‍රතිඵල ගෙන දෙනුයේ සාරවත් වූ පසුබිමකය. එකී පසුබිම වනාහී පුද්ගලයා සතු කායික, වාචසික සහ මානසික චරණයන්ය. එහිලා ධර්මයෙහි සුභාවිතය නැති කළ පසුබිම කිසිවිටෙකත් සරු වන්නේ නැත. එනම් නිසරු පසුබිමක නිර්වාණ බීජය නොවැඩෙයි. අද සමාජය තුළ ඇසෙන "කොපමණ බණ ඇසුවත් නිවන සමීපයටවත් යා නොහැකිය" යන කියමන ඇසෙනුයේ එහෙයිනි. එසේ වී ඇත්තේ ධර්මයෙහි නිසි ගැළපීම හඳුනාගෙන නොමැති නිසාවෙනි. කුල්ලක් මෙන් සරු දෙය තබාගෙන නිසරු දෙය ඉවත් කරනවා වෙනුවට පෙණේරයක් මෙන් නිසරු දෙය තබාගෙන සරු දෙය ඉවත් කිරීමත් සිදුවී ඇත.

වර්තමානය සමාජය තුළ ධර්මය වුවද උපාදාන කරගැනීමක් මිස ධර්මයෙහි සරණ යාමට උත්සාහ දරන පිරිස ඉතා අල්පය. චූල්ල මාලුංක්‍ය සූත්‍රයේදී බුදුන් වහන්සේ මාලුංක්‍යපුත්ත හිමියන්ට දේශනා කරනුයේ විස හීයකින් පහර කෑ පුද්ගලයකු තුවාලයට ප්‍රතිකාර නොකොට විදින ලද පුද්ගලයාගේ හා දුන්නෙහි, හීයෙහි විස්තර ලැබෙනතුරු ප්‍රතිකාර ගැනීමෙන් වැළකී සිටීම ඔහුට අනර්ථය පිණිස පවතින්නා සේ සංසාර රෝගයට ප්‍රතිකාර නොකොට එහි අග මුල් සෙවීමට යාම අනුවණ නිෂ්ඵල ක්‍රියාවක් ලෙසයි. එනම් ධර්මයෙහි දිග පළල සෙවීම නොව එහි උපයෝගිතාව විමසීම බුදුන් අනුදත් ක්‍රමයයි.

අරිය පරියේසන සූත්‍රයේ දක්වා ඇති පරිදි ජාති, ජරා, ව්‍යාධි ආදී සාංසාරික දුක්ඛයන්ට නිසි පිළියම් කිරීම උතුම් පර්යේෂණයයි. එකී පර්යේෂණය සිදු කරනුයේ තමා තුළින්මය. ඒ හරහා තමාට අවශ්‍ය බෙහෙත තමාටම නිශ්චය කරගත හැකිය. ඒ සඳහා තමාට අදාළ සහ අවශ්‍ය දේශනාව හෝ ධර්මෝපදේශය හඳුනා ගත යුතුය. එසේ හඳුනාගෙන නිවැරදිව ග්‍රහණය කරගත යුතුය. ඒ කෙසේද යත් අලගද්දූපම දක්වා ඇති පරිදි සර්පයා නිවැරදිව ග්‍රහණය කරගන්නා සේය. ධර්මයද සර්පයකු වැනිය. නිවැරදිව ග්‍රහණය කර නොගත හොත් අනර්ථය පිණිස පවතියි. ඒ කෙසේද යත් සර්පයා බඳෙන් හෝ නගුටෙන් අල්වා ගත් විට පෙරළා පහර දෙන අතර ඉන් මරණය හෝ මරණාසන්න දුකකට පුද්ගලයා පත්වෙයි. එහෙයින් ධර්මයෙහි නිවැරදි භාවිතය හඳුනා නොගැනීම පුද්ගලයා අනර්ථයටම ඇද දමයි.

බුදුන් වහන්සේ ඉතා නිවැරදිව, විවෘතව කඩමළු ඉවත් කොට මනාව දේශනා කළ ධර්මය නිවැරදිව භාවිත කිරීම තුළින් තමන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා මාත්‍රයක් හෝ ප්‍රේම මාත්‍රයක් හෝ ඇතිවෙයි නම් ඒකාන්ත වශයෙන් ස්වර්ග පරායනය විය හැකි බව අලගද්දූපම සූත්‍ර දේශනාව වැඩි දුරටත් අවධාරණය කරයි. (ඒවං ස්වාක්ඛාතො භික්ඛවේ මයා ධම්මො උත්තානෙ විවටො පතාසිතො ඡින්නපිලොතිකෙ, යෙසං මයි සද්ධාමත්තං පේමමත්තං සබ්බේ ගත සග්ගපරායනාති) එහෙයින් සියල්ලෝම තමන්ට අවැසි ධර්ම මාර්ගයම හඳුනාගෙන අනුගමනය තුළින් ස්වර්ග පරායනට උත්සාහ දරත්වා...!

**පූජ්‍ය ඕපනායක ධීරානන්ද හිමි**



# පවුර ඇත්තේ ගඟෙන් එගොඩ වීමට මිස කර මත තබාගෙන යාමට නොවේ

"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## විහාර දේවාලගම් පනත සහ යහ පාලනය

මුළු ලෝකයටම මානව දයාව, සමානත්වය ඉගැන්වූ ප්‍රථම ආගමික ශාස්තෘවරයා වන්නේ අපේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේය. එපමණක් නොව රටක් පාලනය කළ යුතු දැහැමි පිළිවෙත ගැනද ප්‍රථම පාඩම දේශපාලකයන්ට පෙන්වා දුන්නේද බුදුන් වහන්සේමය. සමාජ සංවර්ධනය ඇති කිරීම තුළින් පුද්ගල සංවර්ධනයත්, අධ්‍යාත්මික දියුණුවත් ඇති කිරීමේ මාර්ග යද ලෝ සතුනට පහදා දුන්නේද උන්වහන්සේ විසින්මය. ඒ අතින් සලකා බලන විට අද බුදුපියාණන් විසින් පෙන්වා දුන් ශ්‍රී සදහම් මාර්ගය අදටත් ලොව බැබළෙමින් පවතී. බුදු සසුනේ චිරස්තිථිය අදටත් මුළු ලෝකය පුරාම නොසැලී, නොබිඳී පවතින්නේ එබැවිනි. කරුණාව, දයාව, මුදිතාව හා උපේක්ෂාව පහදා දුන් බුදුරජාණන් වහන්සේ සියලු භේද දුරලා පුද්ගලයාගේ අධ්‍යාත්මික ගුණාංගවලට ප්‍රමුඛස්ථානය ලබාදුන් සේක. මෙම උතුම් අගය බුදු සසුන තුළට පමණක් නොව සමස්ත සමාජය තුළම පතුරු වන්නට බුදු සමිඳාණෝ සමත් වූහ. බුදු දහම ආගමකටත් වඩා දර්ශනයක් ලෙසට අද සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාව පිළිගන්නේ එබැවිනි.

බුද්ධ දර්ශනය ගිහියන්ටත්, පැවිද්දන්ටත් වෙන් වෙන්ව දේශනා කළ දහමක් නොවන බව අපි කොයි කවුරුත් වටහා ගත යුතු කරුණකි. පන්සිල් සහ අටසිල් ආරක්ෂා කරගනිමින් සදහම් මාර්ගයේ ගමන් කිරීම ගිහි පැවිදි දෙපාර්ශ්වයටම පොදු කරුණකි. ධාර්මික ජීවිතයක් ගත කිරීමෙන් සසර විමුක්තිය ලබාගත හැකි බව බුදු දහමින් උගන්වන වැදගත්ම පාඩම වේ. ''ව්‍යග්ග පජ්ජ සූත්‍රය'' මගින් මෙලොව දියුණුවට බලපාන කරුණු පහදා දුන්නා සේම, අංගුත්තර නිකායේ එන ''වඩ්ඩි සූත්‍රයෙන්'' රටක් සංවර්ධනය විය යුත්තේ කෙසේද යන්නද පහදා දුන්නේද බුදුරජාණන් වහන්සේ විසින්මය. අද වත්මන් සමාජය මේ පිළිබඳව දක්වන අවධානයේ අඩුවක් පවතින බවක් පෙනී යයි. විවිධ පටු මතවාද සමාජගත කිරීමේ උත්සාහයක් අද රට තුළ තිබෙන බවත් අපට දුටුව හැකිය. ගිහි සමාජයේ පමණක් නොව සංඝ සමාජයේ ඇතැම් ස්වාමීන් වහන්සේලා අතරද මෙබඳු දුර්මත තිබෙන බවක් පෙනී යයි. මෙබඳු අවිචාරවත් පසුබිමක ත්‍රෛනිකායික ගරුතම මහානායක ස්වාමීන් වහන්සේලා පාලක දේශපාලන නායකත්වයට නිවැරදි සදහම් මාර්ගය පෙන්වා දෙමින් අනුශාසනා කිරීම අපගේ ගෞරවාදරයට හේතු වන්නේය. ඒ සඳහා හොඳම නිදසුන යහපාලන ආණ්ඩුව සම්මත කරගැනීමට උත්සාහ කළ ''විහාර දේවාලගම් පනත'' ඉවත් කරගැනීමය. ජනාධිපතිතුමා ඒ සම්බන්ධව සංවේදී වී ක්‍රියාකිරීම ගැන රටේ මුළුමහත් බෞද්ධ ජනතාවගේම තුති පුද එතුමාට හිමිවිය යුතුය. එය යහ පාලනයේ උතුම් ලක්ෂණයක් හැටියට අපි දකිමු. ■



# ප්‍රාණඝාතය කළොත් ඔබට අත්වන ඉරණම දැනගන්න

''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙ

ඕනෑම සත්වයකු මරණින් මතු දෙවනුව උපත කරා යන භවය පිළිබඳව දැකිය හැක්කේ චුතුප පාත ඥනය ඇති රහතුන්ට පමණි. එහිද ලොව්තුරා සම්බුදුවරු විශේෂ වෙයි. එම චුතුප පාත ඥනය හෙවත් සත්වයා එක භවයකින් චුති නමැති මරණයට පත්ව කර්මානුරූපව නැවත භවයක උප්පත්ති වශයෙන් යන ආකාරය හා ඒ යන තැන කෙසේ කෙබඳුද? යන්න දැකිය හැකි එම නුවණට සත්වයාගේ ඊළඟ දෙවැනි භවය පමණක් නොව ඒ ඒ සත්වයන් ඉපදෙමින්, මැරෙමින්, නැවත ඉපදෙමින් නැවත මැරෙමින් යන සසර ගමනේදී නිවන් දකින මොහොත දක්වාම චුති සහ උප්පත්ති වශයෙන් යන ස්ථාන සියල්ලක්ම සියයට සියයක්ම ඉතා පැහැදිලිව හා සත්‍ය වශයෙන්ම දැකීමේ හැකියාව ඇත.

බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ කෙනකු මියගිය පසු ඒ නගරයේ ජීවත් වන ජනයා උන්වහන්සේ මුණ ගැසෙන්නට පැමිණ ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අපේ නගරයේ, අපේ ගෙදර අසවලා මියගියා. දැන් ඔහු කොතනක ඉපදී ඇත්දැයි දැනගැනීමට කැමැත්තෙමියි විමසූහ. ඒ අවස්ථාවලදී බුදුරජාණන් වහන්සේ ඒ ඒ සත්වයන්, ඒ ඒ පුද්ගලයන් කරගෙන තිබුණ කුසලා කුසල කර්මවලට අනුව දෙවැනි භවයේ ඉපදුණ තැන චුතුප පාත ඥනය නම් වූ බුදු නුවණින් දැක බලා පිළිසිඳ ඒ ඒ අය මේ මේ තැන්වල ඉපදී ඇතැයි ජීවත් වන මිනිසුන්ට පහදා දෙන සේක.

දිගින් දිගටම මේ කටයුත්ත ක්‍රියාත්මක වන්නට වූ හෙයින් එය භාග්‍යවතුන් වහන්සේට මහා කරදරයක් යැයි සිතූ අග්‍ර උපස්ථායක ආනන්ද හාමුදුරුවෝ භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ විමසා සිටියහ.

"අනේ භාග්‍යවතුන් වහන්ස, මේ නගරයේ මිනිසුන් මිය යන ගාණේ ඒ අයගේ ඊළඟ භවය ගැන ජීවත් වන අපට කියා දෙන්නට සිදුවීම ඔබවහන්සේට මහා පීඩාවකි. ඒ බැවින් චුතුප පාත ඥනය වැනි විශේෂ නුවණක් නැති අප වැනි සාමාන්‍ය ජනයාටත් මැරෙන අය නැවත ඉපදෙන තැන දැනගැනීමට සහ තමන්ගේම ඊළඟ භවය කෙබඳුද යන්න දැනගැනීමට හැකි ක්‍රමයක් පහදා වදාළනු මැනවැයි සැල කළ සිටියහ.

එයට පිළිතුරු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ හා තමන් සමග එකට ජීවත් වන්නන්ගේ මරණින් පසු දෙවැනි භවය කෙබඳු එකක්ද යන්න දැනගත හැකි ඉතා සුපැහැදිලි ක්‍රමයක් පෙන්වා දුන් සේක.

එනම්,

යමෙක් ජීවත් වන කාලය තුළ කයෙන්, වචනයෙන්, මනසින් යන තුන් දෙරින්ම දුශ්චරිතයේ යෙදෙමින් වාසය කරනවාද හෙතෙම සිතින්, කයින්, වචනයෙන් යන තුන් දෙරින් දුශ්චරිතයෙහිම හැසිරී වාසය කොට යම් දිනක කය බිඳී චුති වශයෙන් මරණයට පත්වූ පසුව ඔහුගේ රූපාස් කන්දයෙන් බැහැරට විඤ්ඤාණ යන විඥාන උපාදනස් කාන්දය ප්‍රධාන පංච උපාදනස්කන්ධය දුගතිය නම් වූ සැපයෙන් තොර, දුකෙන් බර වූ නිරය ආදී වූ අපායන් හි ප්‍රතිසන්ධි ලබන්නේය.

මෙහිදී කය දුශ්චරිතය යනු කය වෙහෙසවා - සිතින් සිතා මතාම කරනු ලබන පහත් පාපී ක්‍රියාවන්ය. ඒවා තුනක් ධර්මයේ පෙන්වා දෙයි.

"ප්‍රාණඝාත පරද්දබ්බං පරදාරංච කායතො"

ප්‍රාණඝාතය, සොරකම, පරදර හා පරපුරුෂ සේවනය හෙවත් කාම මිත්‍යාචාරය.

අප මහමග යන එන විට, අතුපතු ගාන විට, කුඹුරු ආදිය කොටන විට, දොර ජනෙල් වසන විට ආදී යම් කාර්යයන් කරනු ලබන විට ඒ ඒ අවස්ථාවලදී අප නොදැනුවත්වම සමහර සතුන් පෑගී, තැලී, පොඩිවී නොයෙක් විදියෙන් මරණයට පත් වන්නට පුළුවන. නමුත් එහිදී එම කටයුත්ත කරන්නාටද ප්‍රාණඝාත අකුශලය සිදු නොවේ.

තමා විසින් ඝාතනය කරනු ලබන සත්වයා විශේෂයෙන්ම තමාගේ මව හෝ පියා නම් හෝ එහෙම රහතෙක් නම් හෝ ඒ ඝාතනය කළ තැනැත්තා නැතිනම් මිනීමැරුව පුද්ගලයාට එය දෙවැනි ආත්මයේදී අනිවාර්යයෙන්ම විපාක පිණිස පැමිණ ඔහුගේ ඒ භවයේ ජනක කර්මය වී හෙතෙම අවීචි මහ නරකයේ උපත කරා ගෙන යන්නට තරම් බලවත් වන්නේය. එය ගරුක අකුශලයක් වූ මාතෘ ඝාතන - පීතෘ ඝාතන හා අරහත්ත ඝාතන ආනන්තරීය කර්මයේ ශක්තිය විශේෂයි. එසේම උපසම්පදා වූ භික්ෂුවක් ප්‍රාණඝාතය කළහොත් විශේෂයෙන් මනුස්සයකු ජීවිතයෙන් තොර කළොත් එය භික්ෂු ජීවිතය අහෝසි වන පාරාජිකාවක් වන්නේය.


මේ ප්‍රාණඝාත අකුශලයම මෙසේ ඒ ඝාතනයට ලක්වන සත්වයාගේ ගුණ මහත්භාත්වයේ අඩු වැඩි වශයෙන් එම ප්‍රාණඝාතය කරන්නාට අල්ප සාවද්‍ය හා මහා සාවද්‍ය අකුශල් බවටද පත්වන බවටද ධම්ම සංගණී අට්ඨ කථා ආදී ධර්ම ග්‍රන්ථවල දක්වා ඇත.

ඝාතනයට ලක්වන සතා තිරිසන් සතෙකු නම් හෙතෙම ගුණයෙන්ද අඩු තිරිසනෙක් නම් එහි අකුශලය විපාක අඩු වේ. ඒ තිරිසනුන් අතරද ක්ෂුද්‍ර ප්‍රාණීන් ඝාතනයෙන් සිදුවන අකුශල විපාකය අල්ප සාවද්‍ය වේ. ඇත්, අස්, ගව ආදී විශාල ප්‍රමාණයේ ශරීර ඇති සතුන් මැරීම හා මිනිසුන් මැරීමද ඒ අතර සාමාන්‍ය මිනිසුන්ට වඩා ගුණයෙන් උසස් මිනිසුන් මැරීමද - මහා සාවද්‍ය අකුශලයක් වන්නේය. ඊට හේතුව ඒ මහා සතුන් හා මිනිසුන් මැරීමට යෙදිය යුතු වෙහෙස හා උපක්‍රම බහුල වීමක් වන අතර ඒ මිනිසුන්ගේ ගුණයේ ඇති වටිනාකමත් නිසාය. එය ප්‍රයෝග මහත්ත්වය හා වත්ථු මහත්ත්වය ලෙස හඳුන්වනු ලබයි.

මේ ආකාරයට විස්තර කරන ලද ප්‍රාණඝාත කාය අකුශල කර්මය අප විසින්ම නිතර නිතර මේ ජීවිතයේ සිදුකරනවාද යන්නත් අප සමග ජීවත් වන අනිකුත් අයද එය නිතර නිතර ජීවිතයේ පුරුදු කරනවාද යන්නත් පිළිබඳ අපටම ඉතා හොඳින් නිරීක්ෂණය කළ හැක.

**පූජ්‍ය මහනුවර කොළබිස්සේ ධම්මානන්ද හිමි**

# බුදුවරුන්ගේ සම - විසමතා



**සම්බුදුවරු බුද්ධත්වයේදී සමානය. එහෙත් සියුම්ව විමසීමේදී හමුවන සමානතා තිහක් සහ අසමානතා අටක්ද මේ ලේඛකයා දක්වයි.**

කලින් කලට සහ වරින් වරට සම්මා සම්බුදුවරු ලොව පහළ වෙති. ඒ එක දිගට නොවේ. බුදුවරුන් පහළ වන කාලය අතරතුර කල්ප ගණනක පරතර පවතී. එක් බුදුවරයකු පිරිනිවන් පානා වහාම වෙනත් බුදුවරයකු පහළ නොවේ. බුදුවරුන් නැතිව කල්ප ගණන් ගතවේ. අප අපේ බුදුහාමුදුරුවන් යැයි පිළිගන්නේ ගෞතම බුදුපියාණන් වහන්සේය. මේ අපේ බුදු හිමියෝ බුදුවරුන් විසිහතර නමකගෙන් නියත විවරණ ලැබූ බව ත්‍රිපිටකයේ සඳහන්ය. තවත් බුදුවරුන් තිස් ගණනකින් අනියත විවරණ ලබා ඇත. බුදු වීමට පෙර මනෝ ප්‍රණීධාන, වාක් ප්‍රණීධාන, මහා ප්‍රණීධාන වඩන කාලය තුළ අනන්ත බුදුවරුන් හමුවී ඇත. අපේ බෞද්ධයෝ අටවිසි බුද්ධ පූජා පවත්වති. ඒ විසි අට නමගෙන් විසිහතර නාමකගෙන් අප ගෞතම බුදු හිමි නියත විවරණ ලබා ඇති අතර හතර නමකගෙන් අනියත විවරණ ලබා ඇත.

බොහෝ විට ව්‍යවහාරයේ පවතින්නේ සම්මා සම් බුද්ධ හා පච්චේන බුද්ධ යන දෙනමයි. එහෙත් සමහර අටුවාවල බුදුවරුන් සතර වර්ගයක නම් සඳහන් වේ. කල්ප ලක්ෂයක් හා අසංඛෙය්‍ය හතරක්, අටක්, සොළොසක් පෙරුම් පුරා වෙනත් බුදුවරුන්ගෙන් විවරණ ලබා සම්බුද්ධත්වයට පත්වන උතුමා ''සබ්බඤ්ඤු බුද්ධ'' නමින් හඳුන්වනු ලැබේ. කල්ප ලක්ෂයක් සහ අසංඛෙය්‍ය දෙකක් පෙරුම් පුරා සිව්පස් අවබෝධ කරගන්නා උතුමා ''පච්චේන බුද්ධ'' නමින් හඳුන්වනු ලැබේ. සියලු කෙලෙසුන් ප්‍රහීණ කොට රහත් බව ලබන උතුමෝ ''චතුපච්ච බුද්ධ'' නම් වෙයි. ''ක්ෂිණාශ්‍රව බුද්ධ'' යනුද මෙතෙමේමය.

සම්මා සම්බුද්ධත්වයට පත්වන පුද්ගලයා අවම වශයෙන් අසංඛ්‍ය කල්ප විස්සක්වත් ඒ සඳහා වෑය කළ යුතු බව බෝධිසත්ව චරියාව, සද්ධර්ම රත්නාවලිය වැනි පොත් පත්වල සඳහන් වේ. මෙම කාලය තුළ ප්‍රණීධාන තුනක් සම්පූර්ණ කරති. වචී ප්‍රණීධානය නම්ව බුදු වෙම්වායි වචයෙන් ප්‍රාර්ථනා කිරීමයි. මෙය තමන් විසින්ම වචනයෙන් ප්‍රකාශ කරන අතර ''ඔබ බුදු වෙම්වා'' යි අන්‍යයෝද ප්‍රාර්ථනා කරති. අනියත විවරණ ලබන්නේ මේ කාලය ඇතුළතය. මහා ප්‍රාණීධානය අසංඛ්‍ය කල්ප ලක්ෂ සතරක් තුළ සම්පූර්ණ කරති. ''ඔබ අසවල් කාලයේ අසවල් නමින් බුදු වන්නේය. ඔබේ මව, පියා, බිරිය, දරුවා අසවල් අය වෙති'' යනුවෙන් බුදු වන බව ස්ථිරවම ප්‍රකාශ වන්නේ මේ නියත විවරණ කාලය තුළදීය. විසිහතර නමකගෙන් විවරණ ලබා ඇති ගෞතම බුදුරදුන් අනාගතයේ බුදු වන බුදුවරුන් දස නමකට විවරණ දුන් බව අනාගත වංශයේ සඳහන් වේ.

ලෝකයේ පහළ වන බුදුවරු පොදු වශයෙන් අන්තරාය හතරකින් ආරක්ෂා වෙති. බුදුවරුන්ගේ සිව්පසට හානියක් කිරීමට කිසිවකුට නුපුළුවන. බුදුවරුන්ගේ මහා පුරිස ලක්ෂණයන්ට හා අසූවක් අනුව්‍යඤ්ජනයන්ට හානියක් කිරීමට කිසිවකුට නුපුළුවන. බුදුවරුන්ගේ රශ්මි මාලාවේ පැතිරීමට බාධාවක් කිරීමට කිසිවකුට නුපුළුවන.

**මේ සෑම බුදුවරයකුටම පොදුවේ බලපාන සමානතා තිහකි. ඒවා පහත පරිදි පෙළගැස්විය හැකි ය.**

1. සෑම බෝධිසත්වයක්ම මව්කුස පිළිසිඳ ගන්නා විට එළඹ සිටි සිහියෙන් පසුවේ.
2. මව්කුස සිටියදී තම මුහුණ පිටතට හවා පිළිමයක් මෙන් බද්ධ පර්යංකයෙන් සිටී.
3. බෝසත් දරුවාගේ ප්‍රසූතිය සිදුවන්නේ බෝසත් මව සිටගෙන සිටියදීය.
4. උත්පත්තිය සිදුවන්නේ මල් උයනකදීය.
5. උපන් සැණෙකින් උතුරු දෙසට පියවර හතක් ගමන් කරයි.
6. අභීත සිංහ නාද පවත්වයි.
7. සතර පෙර නිමිති දැක, මහාභිනිෂ්ක්‍රමණය කරයි.
8. කහ සිවුරු පෙරවයි.



9. බුදු වන දිනයේ කිරිපිඬු වළඳයි.
10. පරිනිර්වාණයට පෙර දවසේ මස්-මාංශ සහිත ආහාරයක් වළඳයි.
11. තණ පලසක තණ ගොඩ හිඳ බුද්ධත්වයට පත්වෙයි.
12. මාර පරාජය කරයි.
13. අනාපානසතිය ප්‍රගුණ කරයි.
14. බෝමැඩ අබියසදී මහා සම්මා සම්බුද්ධත්වයට පත් වෙයි.
15. මහ බඹුගේ ආරාධනාවෙන්ම දම් සක් පවත්වයි.
16. ඉසිපතනයේ මිගදායේදීම දම්සක් පවත්වයි.
17. ඇසළ පොහෝදා සිව් පිරිසට පාමොක් දෙයි.
18. බොහෝ සෙයින් ජේතවනාරාමයේ වැඩ වසයි.
19. සැවැත්නුවරදී යමා මහ පෙළහර පායි.
20. තව්තිසා දෙව්ලොවදී අභිධර්මය දේශනා කරයි.
21. එහි සිට සංකස්ස නුවරට වැඩමවයි.
22. ධ්‍යාන දෙකක් තුළදී අනුන්ගේ සිත් නම්මා ගැනීමට ශක්තිය ලබයි.
23. නිරන්තරයෙන් ඵලසමාපත්තියට සම වදියි.
24. නිසි අවස්ථාවේම විනය නීති පනවයි.
25. ඥාති සමාගමයේදී බුද්ධ වංශ දේශනාව කරයි.
26. තමන් හමුවන්නට එන භික්ෂූන් කරුණාවෙන් පිළිගනියි.
27. දායකයන්ගෙන් සමු නොගෙන වස් විසූ තැනින් පිටත නොයයි.
28. පෙරබත්කිස පසුබත්කිස වශයෙන්ද රාත්‍රියේ තුන් යාමයේදීද එකම කාල සටහනක් අනුව කටයුතු කරයි.
29. පිරිනිවීමට පෙර විසිහතර කෝටි එක්ලක්ෂයක් සමාධිවලට සම වදියි.
30. හේතුවක් කාරණයක් ඇතිවූ විටම විනය නීති පනවයි. නිකරුණේ නොපනවයි.

මෙම ස්වභාවයන් තිහ සෑම බුදුවරයකුටම සමානය.

**එක් එක් බුදුවරුන්ට වෙනස් වන විෂමතා අටකි. මේවා 'අට්ඨ වේමත්තතා' යනුවෙන් දක්වා තිබේ.**


1. ආයුෂ විෂමතා: එක් එක් බුදුවරු ලොව පහළ වන අවධියේ පවතින කල්පයේ ආයුෂ අනුවය. දීපංකර බුදුන් බුදු වන විට ආයුෂ ලක්ෂයකි. ගෞතම බුදුන් බුදු වන විට ආයු කාලය අවුරුදු සියයකි.
2. පමාණ විෂමතා: එක් එක් බුදුවරයාගේ උස වෙනස් වේ. දීපංකර බුදුහු අසූ රියනක් උසය. ගෞතම බුදුහු දහඅට රියනක් උසය.
3. කුල විෂමතා: සමාජ තත්ත්වය වෙනස් වේ. කොණ්ඩඤ්ඤ බුදුහු බ්‍රාහ්මණ වංශය. ගෞතම බුදුහු ක්ෂත්‍රිය කුලයේය.
4. පධාන විෂමතා: වීරිය වැඩීම සඳහා දුෂ්කර ක්‍රියා කාලය වෙනස් වෙයි. දීපංකර, කොණ්ඩඤ්ඤ බුදුවරු දස මාසයයි. රේවත බුදුහු හත් මාසයයි. ගෞතම බුදුහු අවුරුදු හයයි.
5. රශ්මි විෂමතා: ශරීර ප්‍රභවය, ඛ්‍යාම ප්‍රභා මණ්ඩලය වෙනස් වේ. ඒ ඒ බුදුවරුන්ගේ කැමැත්ත පරිදි එය වෙනස් වේ. මංගල බුදුරදුන්ගේ බුද්ධ රශ්මිය දසහස්සී ලෝක ධාතුව පුරා පවතින අතර, ගෞතම බුදුරදුන්ගේ බුද්ධ රශ්මිය බඹයක් පමණි.
6. යානයේ වෙනස: ඒ ඒ බුදුවරු මහාභිනිෂ්ක්‍රමණය සඳහා යොදාගන්නා වාහනය වෙනස් වේ. දීපංකර, සුමන, ඵුස්ස බුදුවරු ඇත් යානයෙන් ගියහ. ගෞතම බුදුහු අශ්ව යානයෙන් ගියහ. පදුමුත්තර, ධම්මදස්සි, කස්සප ආදී බුදුවරු පයින් ගියහ.
7. බෝධියේ වෙනස: බුදු වන ස්ථානය අවිජහිය වුවද, වෙනස් නොවුණද බෝධි වෘක්ෂය වෙනස් වේ. විපස්සී බුදුන් පළොල් ගස යට, සිඛී බුදුන් සුපුන් අඹ ගස යට, කස්සප බුදුන් නුගරුක යට, ගෞතම බුදුන් ඇසතු නුගරුක යට ආදී පරිද්දෙනි.
8. පර්යංක වෙනස: සෑම බෝධිසත්ත්වවරයකුම බුද්ධත්වයට පත් වන්නේ තණ පලසක් මත වුවත් දිගු-පුළුල අනුව එහි ප්‍රමාණය වෙනස් වේ. මේ අනුව දීපංකර, රේවත, අත්ථදස්සි ආදී බුදුවරුන්ගේ ආසන තෙපණස් රියන් විය. සෝභිත, අනෝමදස්සි බුදුවරුන්ගේ ආසන අටතිස් රියනක් විය. අප ගෞතම බුදුන්ගේ ආසන තුදුස් රියනක් විය.

ගෞතම බුදුරදුන් පිළිබඳව සලකන විට සහජාත පරිච්ඡේදයක් හා නක්ෂත්‍ර පරිච්ඡේදයක් දක්වේ. යසෝදරා, ඡන්න, කන්ථක, මහාබෝධිය, කාළුදායි හා නිදන් සැළි සතර සිද්ධාර්ථ කුමරු උපදින දවසේම උපන්හ. ඒ සහජාත පරිච්ඡේදයයි. උතුරුසල නැකතින් මව්කුස පිළිසිඳ ගැනීම, මහබිනික්මන් කිරීම, දම්සක් දේශනාව පැවැත්වීමද, විසා නැකතින් ඉපදීම, බුදුවීම, පිරිනිවීමද, මා නැකතින් ශ්‍රාවක සන්නිපාතය හා ආයු සංස්කාරය හැරීමද සිදුවිය. මෙය නක්ෂත්‍ර පරිච්ඡේදය වශයෙන් දක්වේ.

මෙනයින් බුදුවරුන් අතර ලක්ෂණ වශයෙන් මෙබඳු සම-විසමතා දක්නට ලැබුණහ. සෑම බුදුවරයකුගේම බුද්ධ කර්තව්‍යය නම් එකකි. එනම් සකල ලෝක සත්වයන් වෙනුවෙන් පතළ මහා කරුණාවෙන් නිර්වාණ මාර්ගය දේශනා කිරීමය.

**පණ්ඩිත, ශාස්ත්‍රපති විජිතනන්ද සරත්චන්ද්‍ර**

"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - වීනීල ජාතකය"



# ජය ශ්‍රීමා බෝධියෙන් පැන නැගුණු පළමු අංකුර අට අදටත් වැඩ වසනවාද?

දෙවන පියතිස් රාජ්‍ය සමයේ මිහිඳු මහ රහතන් වහන්සේ හා සමග මෙරටට පැමිණි භික්ෂූන් වහන්සේලා විසින් සිරිලක සඟ සසුන ස්ථාපිත කිරීමෙන් අනතුරුව පළමුවෙන්ම අනුරාධපුර ඇතුළු නුවරට දකුණු දෙසින් වූ මහමෙව්නා වන උයනෙහි මෙරට පළමු සඟ අරම වූ තිසරම් වෙහෙර ඇති වූයේය. ඉනික්බිතිව මිස්සක පව්ව, වෙස්සගිරිය, ඉසුරුමුණි ඇතුළු තවත් සංඝාවාස ගණනාවක්ද එම කාලය තුළදීම මෙරටට වැඩම කළ සඟමිත් මෙහෙණිය සඳහා හත්ථාළ්හක මෙහෙණවර ඇතුළු භික්ෂුණී අරම්ද ඇති විය. සිරිලක සතර දෙස විසිරී පැතිරී පවතින කිතු වසින් පෙර යුගයට අයත් බ්‍රාහ්මී ලෙන් ලිපි දහස් ගණනක් සංඛ්‍යාව සැලකිල්ලට ගැනීමේදී ඒ ලෙන් සකසා පූජා කර ඇත්තේ බෞද්ධ භික්ෂූන්ට වීමෙන් එම සෑම ලෙන් විහාරයකම භික්ෂූන් වැඩ සිටි බව තහවුරු වේ. මෙකී ලෙන්වලට අමතරව ලෙන් නොමැති තැන්වලද කටුමැට්ටෙන් හෝ කුඩා ආවාස පවතින්නට ඇති බව පැහැදිලි වන්නේ පුරාණ බෞද්ධ අට්ඨකථාවල නිතර සඳහන් වන වෙහෙර විහාර නම් පිරික්සීමේදීය. මෙම විහාර ඉදිවූ මුල්ම අවස්ථාවේ මේ සෑම විහාරයකම පාහේ භික්ෂූන්ට මෙන්ම ගිහියන්ටද වැඳ පුදා ගැනීම සඳහා වූ පූජනීය ස්ථාන දෙකක් විය. ඒ ස්තූපය හා බෝධියයි. මිහිඳු හිමියන් මෙරටට වැඩම කොට ඉතා සුළු කලකින් මෙරටට සර්වඥ ධාතු වැඩම කරවා ග්‍රීවා ධාතුව ථූපාරාමයේ නිදන් කොට එම ස්තූපය ඉදිකිරීමත්, ඉතිරි ධාතු නිදන් කොට යොදුනෙන් යොදුන ස්තූප සෑදීමත් ගැන මහාවංසයේ සඳහන්ය. එසේම දෙවන පෑ තිස් රජුගේ ඉල්ලීම පරිදි මෙරට මෙහෙණි සස්න පිහිටුවීම සඳහා සඟමිත් මෙහෙණිය මෙරටට වැඩම කළේ බුද්ධගයාවේ පිහිටි ශ්‍රී මහා බෝධියේ අංකුරයක්ද රැගෙනය. ඒ වන විට ඉන්දියාවේද ස්තූප හා බෝධි වන්දනාව ජනප්‍රියව තිබූ අතර එකී පූජනීය වස්තු දෙක මිහිඳු හිමියන් විසින් මෙරට වාසීන්ට හඳුන්වා දීමෙන් පසුව එදා පටන් අද දක්වාම ඉදිවූ සියලුම බෞද්ධ විහාරවල අනිවාර්ය පූජනීය අංගයන් වශයෙන් ස්තූපය හා බෝධිය ඇති විය. බෝධිය බෞද්ධ සමාජයේ කෙතරම් වැදගත් වූයේද යත් මෙරට බෝධි සංස්කෘතියක් ඇතිවී තිබීමෙන්ම වැටහේ. දීපවංස, මහාවංස, වංසත්ථප්පකාසිනී මෙන්ම පාලි බෝධි වංසය, ඒ සඳහා ලියූ ගැටපදය වූ මහා බෝධිවංස ග්‍රන්ථි පදය, සිංහල බෝධි වංසය ආදී ග්‍රන්ථ කීපයක්ම බෝධි සාහිත්‍යයට එක් වන්නේ මේ නිසාය. එපමණක් නොව බෝධිය වටා මණ්ඩප, බෝධිඝර ඉදිවෙමින් ඒවා බෞද්ධ කලා අංශයෙන් පරිපූර්ණ කිරීම නිසා බෝධිය සමග බෞද්ධ කලා සම්ප්‍රදායක්ද බිහිවූ බවට ඇති එක් නිදසුනක් වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුවට නුදුරින් ඇති නිල්ලක්ගම (නිටොලෑව) බෝධිඝරයේ ඇති විශිෂ්ට කැටයම්ය. තවද අලුත් සහල් මංගල්‍යය, නානුමුර මංගල්‍යය ආදී වශයෙන් බෝධියට කෙරෙන පූජා අනුව තවත් අංශයක් දියුණු වී ගියේය. මෙසේ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියේ සුවිශේෂ වැදගත් කමක් දරන බෝධීන් වහන්සේගේ ඉතිහාසය විමසූ පුරාණ හා මෑතකාලීන නොයෙකුත් විද්වතුන් සංඝමිත්තා මෙහෙණින් වහන්සේ විසින් ගෙන ආ බෝධිය ගැන පමණක් විස්තර සඳහන් කළද ඉන් හටගත් අනිකුත් බෝධීන් ගැන විස්තර නොදක්වීම පාඩුවකි. සඟමිත් මෙහෙණිය විසින් රැගෙන ආ බෝධිය වුවද කුමක්දැයි හඳුනා ගැනීම රජරට ශිෂ්ටාචාර වල්වැදී ගිය අවධියේ ගැටලුවක් වන්නට ඇත්තේ ඒ වටා පරිවාර බෝධීන් ගණනාවක් වැඩී තිබීමය. අනික් අතට සමන්තපාසාදිකා ඇතුළු ග්‍රන්ථවල ඇතුළු නුවර දකුණු දොරටුවේ සිට දුණු පන්සියයක් දකුණු දෙසින් පිහිටි ස්ථානය නිවැරදිව හඳුනා ගැනීමට පහසු වී ඇත.


බෝධිය රෝපණය කිරීමෙන් අනතුරුව ඉන් පැන නැගි පළමු අංකුර අට මෙරට වෙනත් වෙහෙර විහාරවල රෝපණය කළ බව මහාවංසය සඳහන් කරයි. අනතුරුව බීජවලින් හටගත් තවත් පැළ තිස් දෙකක් දිවයිනේ නොයෙක් විහාරවල රෝපණය කළ බව මහාවංසය කියන අතර එම ස්ථාන නම් වශයෙන් සිංහල බෝධිවංසයේ සඳහන් කරයි. කෙසේ හෝ දඹදිව ශ්‍රී මහා බෝධියේ අංකුරයක් මෙරට රෝපණය කිරීමේ වැදගත්කම මෙන්ම වැදගත් කමක් මෙම බෝ අංකුර අට රෝපණය කිරීමටද ආරෝපණය විය යුතුව ඇත. මෙම ස්ථාන මහාවංසයේ සඳහන් වන පරිදි බෝධිය රැගෙන ගොඩබට දඹකොළ පටුන, අතරමග බෝධිය තබා තිබූ තිවක්ක බමුණු ගම, සෑගිරිය, ථූපාරාමය, ඉසුරුමුණිය, පඨමක චේති අංගනය, සෑගිරිය, කතරගම හා සඳුන්ගමය. උතුරේ

"උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය"

දඹකොළ පටුනේත්, ඈත දකුණේ කතරගම හා චන්දනගාමයේ බෝධි රෝපණය කිරීමෙන් බුදු සසුන මුළු ලක්දිවම වෙලාගත් බවට ඉඟියක් කර ඇත. මෙම බෝධීන් රෝපණය කළ ස්ථාන නාම මෙසේ සඳහන් වුවද ඉන් බොහොමයක් පිහිටි ස්ථානය හෝ විහාරස්ථානය හෝ බෝධිය පිහිටි තැන හෝ අද හඳුනාගත නොහැකිව ඇත. උදාහරණයක් වශයෙන් දඹකොළ පටුන, සඳුන්ගම, කතරගම ආදී ස්ථානවල මෙකී විහාර පිහිටි තැන පවා සොයාගැනීම අපහසුය. බොහෝ පුරාණ විහාරවල එක් බෝධියකට වඩා බෝධි රෝපණය කර තිබූ බවට සාහිත්‍යයේ ඇති සඳහන් මෙන්ම පුරාවිද්‍යා සාධකද නිසා මේ හඳුනා ගැනීම තවත් අපහසු වෙයි. උදාහරණ වශයෙන් පැරණි අභයගිරි වෙහෙර තුළම දනට බෝධි පිහිටි ස්ථාන හතරක්ම දක්නට ලැබීම සඳහන් කළ හැකිය. කෙසේ වෙතත් මහමෙව්නාවේ රෝපණය කළ බෝධිය සැදැහැතියන් විසින් නොනැසී රැක ගැනීමට ඒ සම්බන්ධ වගකීම පැවරුණු විහාරගම්කාරයින් සිටියද ඉහත කී අනිකුත් බෝධි සියල්ලම කිසියම් අවස්ථාවක විනාශයට පත්ව ඇත. 1215 න් පසු රජරට වනගත වීමත් නිසා ජනශූන්‍ය වීම, වියළි කාලයට බෝධියට ජලය වත් කිරීමට කිසිවකු නොසිටීම මෙන්ම වන සතුන්ගෙන් වූ උවදුරු මීට හේතු වන්නට ඇත. උදාහරණ වශයෙන් අභයගිරිය, ජේතවනය, ලංකාරාමය, ථූපාරාමය ඇතුළු පැරණි විහාරස්ථානවල බෝධීන් රෝපණය කර තිබූ බෝධිසර හෝ බෝධි මණ්ඩපවල නටබුන් දක්නට ඇතද එහි බෝධීන් නොතිබීම සඳහන් කළ හැකිය. බෝධිය නොමැති වුවද ඉහත කී මුල් බෝ අංකුර අට රෝපණය කළ ස්ථානයවත් නිවැරදිව හඳුනා ගැනීමට හැකි කමක් ඇත්නම් එය මෙරට බෝධි ඉතිහාසයට බොහෝ සෙයින් වැදගත් වනු ඇත. මේ අතරින් අවසානයට ස්ථාන දෙකක් පිළිබඳව යම් තීරණයකට එළඹිය හැකිය. ඒ ථූපාරාමයේ හා ඉසුරුමුණි විහාරයේ සිට වූ බෝධි අංකුර දෙක පිළිබඳවය. මහාවංසයේ ඇති මේ සඳහන තවදුරටත් විස්තර කරන මහාවංස ටීකාව ඉස්සරසමණාරාමෙ යනු ඉස්සරසරණ යැයි කියනු ලබන කසුප්ගිරි වෙහෙර යනුවෙන් සඳහන් කර ඇත. මෙම කසුප්ගිරි වෙහෙර දනට පුරාවිද්‍යාඥයන් හා ඉතිහාසඥයන් විසින් මනාව හඳුනාගෙන ඇත. සීගිරි කසුප් රජතුමා ඉසුරුමුණි වෙහෙර පිළිසකර කර එයට තම දියණියන් වූ බෝධි හා උප්පලවණ්ණාගේ නම්ද, තමාගේ නමද තබා බො උපුල්වන් කසුප්ගිරි රද් මහ වෙහෙර යනුවෙන් නම් කළ බව මහාවංසයේ සඳහන්ය. දනට අනුරාධපුරයේ වෙස්සගිරිය යනුවෙන් බැවහැර වන පැරණි නටබුන් සහිත භූමියෙන් හමුවී ඇති ශිලාලිපි කීපයකම එය ඉසුරුමුණි විහාරය බව සඳහන්ව ඇත. එහි එක් ලිපියක පැහැදිලිවම බො උපුල්වන් කසුප්ගිරි රද් මහ වෙහෙර යනුවෙන් සඳහන්ය. මේ සියලු සාධක අනුව දන් වෙස්සගිරිය කියනු ලබන්නේ පැරණි ඉසුරුමුණි විහාරයට බව පිළිගෙන ඇත.

දන් වෙස්සගිරියේ ප්‍රධාන පර්වතය ඉදිරිපිට හා ඒ පාමුල ප්‍රධාන පාරට මුහුණ ලා පැරණි බෝධිසරයක නටබුන් දක්නට ලැබේ. එහෙත් මහාවංස ටීකාව ඉහත කී බෝ අංකුරය රෝපණය කිරීම විස්තර කරමින් කසුප්ගිරි වෙහෙරෙහි ඉහළ බෝධිසරයෙහි එක් අංකුරයක් පිහිටුවන ලදී යනුවෙන් සඳහන් කරයි. ඒ අනුව අංකුරය රෝපණය කළේ දනට දක්නට ඇති පහළ බෝධිසරයේ නොවන බව පැහැදිලිය. පහළ බෝධිසරය ටීකාව රචිත යැයි සලකනු ලබන 8-10 සියවස් කාලයේදීත් පැවැති බව මෙයින් අනාවරණය වේ. වෙස්සගිරියේ උතුරේ සිට දකුණට ඇති පළමු පර්වතය හා දෙවන පර්වතය මුදුණේ පුරාණයේ කරන ලද ඉදිකිරීම්වල නටබුන් දක්නට ඇතත් මේ සියල්ල පැහැදිලිව හඳුනාගත නොහැකිය. අංක එක පර්වතය මත ඇත්තේ බෝධිසරයක නටබුන් යැයි සැලකිය හැකි වුවද අංක දෙක ප්‍රධාන පර්වතය මතද පැහැදිලිවම ස්තූපයක නටබුන්ද, තවත් ඉදිකිරීම්වල නටබුන්ද ඇති අතර ඒ බෝධිසරයක් වීමටද බැරිකමක් නැත. මන්ද පුරාණයේ සමහර විහාරවල එක් බෝධියකට වඩා බෝධි පැවැති බවට සාක්ෂ්‍ය හමුවන බැවිනි. නිදසුන් වශයෙන් අභයගිරි විහාරයේ දනටමත් බෝධිසර හතරක නටබුන් සොයාගෙන ඇත. මේ අනුව ඉසුරුමුණියේ පළමු බෝ අංකුරය පිහිටු වූ තැන හරියටම පැහැදිලි නැත.

මේ අනුව අපට ඉතිරි වන්නේ ථූපාරාම බෝධිය පමණය. ථූපාරාමයේ බෝධිසරය හඳුනා ගැනීමට සාක්ෂ්‍ය කීපයක්ම ඉතිරිව ඇත. ඉන් පළමුවැන්න වන්නේ ථූපාරාම චෛත්‍යය ඉදිකිරීම පිළිබඳ විස්තරයයි. මහාවංසයේ හා ටීකාවේ මේ පිළිබඳ කරන සඳහනේදී සෑයේ නිදන් කිරීමට ඇතෙකු පිට ධාතු වඩමවාගෙන ආ බවත් ඇතා තමාගේ උසට ස්තූපය බඳින තුරු ඇත් කඳ මත්තෙන් පහළට ධාතු ගැනීමට ඉඩ නොදුන් බවත්, එතෙක් කල් ඇතා දනට ථූපාරාමයේ බෝධිය පිහිටි ස්ථානයට වී නැගෙනහිර දෙස බලා සිටි බවත් කියයි. ඇතා බලා සිටියේ ස්තූපය ගොඩනැගෙන තුරුය. මේ කියමන අනුව බෝධිය තිබී ඇත්තේ ස්ථූපයට බටහිරින්ය. දනට ථූපාරාම මලුවේ දක්නට ඇත්තේ ස්තූපයට දකුණු පැත්තෙන් පිළිම ගෙයක් ස්තූපයට නැගෙනහිර පැත්තෙන් පදලස චේතිය හෝ සංඝමිත්තා සොහොන යැයි කියනු ලබන සෑයත්, ස්තූපයට බටහිරින් ඉතා පැරණි ඉදිකිරීමක නටබුන් පමණකි. මේ ගොඩනැගිල්ලේ දනට දක්නට ඇති අවශේෂද එය බෝධිසරය හෝ බෝධි මණ්ඩපය ලෙස සැලකීමට සාධකයකි. දකුණු දෙසට දොරටුව තබා ඇති මේ මධ්‍යයේ ගොඩනැගිල්ලක් හා ඒ වටා මලුවක්ද දක්නට ඇත. බුදු පිළිමය නෙළීමට පෙර බුදුන්




වහන්සේ සංකේතවත් කිරිමට හා වැඳීමට යොදාගත් ඉතා පැරණි හුණුගලින් කළ සිරිපතුල් ගල් කීපයක් මෙහි දක්නට ඇති අතර පුරාණයේ බෝ මුල බුදුන් වහන්සේ සිටි බව දක්වා ඇත්තේ මෙසේ සිරිපතුල ගල් තැබීමෙනි. අභයගිරියේ ඉපැරණි බෝධිසරයේද මෙසේ සිරිපතුල් ගල් ගණනාවක් දක්නට ඇත. අනික් සාක්ෂ්‍ය වන්නේ අනුරාධපුර ලංකාරාමයයි. මහා විහාරයට තරගකාරී ආයතනයක් වූ අභයගිරිය තුළ ලංකාරාමය (පුරාණ නම මණිථූපාරාම) ඉදිකිරීමේදී මහා විහාරීය ථූපාරාමයේ සැලැස්ම එහෙම පිටින් ගෙන ඇති බව දනට දක්නට ඇති නටබුන්වලින් පෙනේ. ථූපාරාමයේ මෙන් ස්තූපයට වටදා ගෙයක් ඉදිකිරීම එකකි. පසෙකින් ථූපාරාමයේ මෙන් පිළිම ගෙයක් ඉදිකිරීම පමණක් නොව ථූපාරාම පිළිම ගේ අසල ඇති නාගලු ළිඳට සමානව ලංකාරම පිළිම ගේ ළඟද ගලින් ළිඳක් ඉදිකර ඇත. ථූපාරාමයේ බටහිර දෙසින් බැසීමට ඇති පඩි පෙළ පාමුල අප විසින් බෝධිසරය යැයි කියන ගොඩනැගිල්ල ඇති අතර මෑතදී කරන ලද කැනීම්වලින් පැහැදිලිවම එය බෝධිසරයක් බව තීරණය කර ඇත. මේ අනුවද ථූපාරාමයේ ස්තූපයට බටහිර දෙසින් දක්නට ඇත්තේ බෝධිසරයක් බව පැහැදිලි වන අතර එහි වෙනත් බෝධිසර නැති හෙයින්ද, දනට දක්නට ඇති නටබුන් මුල්ම කාලයේ ඉදිකිරීම් සඳහා භාවිත කළ හුණු ගලින් යුක්ත වීමද මෙය පළමු බෝ අංකුරය සිටවූ ස්ථානය ලෙස නිසැකවම තීරණය කළ හැකි වේ.

**අනුෂී සිතාරා කාරියවසම්**

# සදහම් ප්‍රහේලිකා අංක - 100

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773




## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේලිකාව (94), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදන.
3. පිළිතුරු පත් භාරගන්නා අවසාන දිනය ඔක්තෝබර් 5 දය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

### ► හරහට

1. විශාඛා මහ උපාසිකාව ඉදිකළ විහාරය.
2. මොවුන් පෙරහරවලට අභිමානය ගෙන දෙයි.
4. පව් කළ ඇත්තෝ යන තැන.
5. මේවාද යාග හෝමවලට අයත්ය.
8. සොළොස් මහා ජනපද වලින් එකකි.
10. "ඇඳ" යන අරුත ගෙන දෙයි.
12. එක් වගා කන්නයකි.

### ▼ පහළට

2. මෙය නිවනට මග අහුරවයි.
3. එදා මෙරට විසූ ගෝත්‍රයකි.
4. මොවුන් පෙරහරවලට අභිමානය ගෙන දෙයි.
5. එදා ඉසිපතනාරාමය පිහිටි පුරවරය.
6. ප්‍රධාන භාවනාවකි.
7. අටපිරිකරට අයත්ය.
9. රාශි 12 න් එකකි.
11. නුවණින් අගතැන්පත් තෙරණිය.

### ප්‍රහේලිකා අංක 96 ජයග්‍රාහී වාසනාවන්තයින් නම්

- **සරත් වීරසේකර**
  පේරලන්දවත්ත බංගලාව,
  පඩිවත්ත, කුණ්ඩසාලේ.
- **එච්. එම්. ඥානවතී මැණිකේ**
  පැල්පොලවත්ත, අලවතුගොඩ.
- **මාලනී වඩිගෙවත්ත**
  279/2, ගොහාගොඩ,
  කටුගස්තොට.

*යථා කාලයේදී ඔබගේ තිළිණ දයාවංශ ජයකොඩි පොත් සමාගමෙන් එවනවා ඇති.*

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළඳ** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දොළහකට ආසන්න කාලයක් තිස්සේ "දළඳ වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළඳ මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සැම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළඳ වරුණ" කියවන්න
www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# දළදා මාලිගයෙන් පණිවුඩයක්

- **මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න**

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඳ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"

# ඡන්ද ජාතකයෙන් හෙළි වන පෙහෙවස් සමාදන් වීමේ අනුහස්



මහා කාරුණික වූ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වෙසෙන සමයෙහි උපාසකවරුන්ගේ පෙහෙවස් සමාදන් වීමක් අරභයා මෙම ඡන්ද ජාතකය දේශනා කොට වදාළ සේක. එක් දවසෙක පෙහෙවස් රකින උපාසක, උපාසිකාවන් රැසක් බණ අසනු පිණිස දම් සභා මණ්ඩපයට අවුත් රැස්ව සිටිනු දැක, පෙහෙවස් රක්කා වූ ඔබ හැම දෙනා කළ දේ යහපතැයි වදාරා, නුවණැත්තෝ පෙහෙවස් රැකීමෙහි විපාකයෙන් බොහෝ යසස් ලැබූහයි වදාළ කල්හි, උපාසකවරු භවයෙන් වැසී තිබූ පූර්ව කතාව අසනු කැමතිව, බුදුරජාණන් වහන්ස, සිල් රැකීමෙහි අනුසස් අසනු කැමැත්තෙමුයි කීහ. එසේම පුරාතණ නුවණැත්තන් විසින් රකින ලද අඩ පෙහෙවස්හි අනුසස් වදාළොත් යහපතැයි ආරධනා කරනු ලැබූහ. එවිට බුදුරජාණන් වහන්සේ එම අතීත කතාව මෙසේ ගෙනහැර දක්වා වදාළ සේක.

බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජු දසරාජ ධර්මයෙන් රාජ්‍යය කරන කල්හි, සෙසු රජදරුවන්ට වඩා ධර්මයෙහි හැසිරී, පන්සිල් රැක, පොහොය නොවරදවා පෙහෙවස් විසීමෙහි අප්‍රමාදීව විසූහ. ඒ රජතුමා සෙසු අමාත්‍යාදීන්ට ද රාජ්‍ය වාසීන්ට ද පන්සිල් රැකීමාදී දස කුසල් සමාදන් කරවූහ. මේ රජුගේ පුරෝහිත බමුණා අනුන්ගෙන් අල්ලස් ගන්නේය. මැදහත් නොවේ. අධර්මිෂ්ඨව අධිකරණ නායක වශයෙන් රාජ්‍ය සේවය කරමින් දවස් ගත කළේය.

එක් දවසක් රජතුමා පොහෝ දවසක ඇමතීන් කැඳවා උපෝෂථ සීලය සමාදන් වූයේ දැයි විචාළේය. එදින පුරෝහිත බමුණා පෙහෙවස් සමාදන් නොවී අල්ලස් ගෙන හිමියන් අහිමියන් කිරීමෙන් අධර්මය යුක්තිය කොට රාජ සේවයට ආවේය. එවිට ඔහු අතිනුත් උපෝෂථ සීලය සමාදන් වූවා දැයි විචාළ විට, එසේය කියා ප්‍රාසාදයෙන් බැස ගියේය. මොහු සිල් සමාදන් නොවූ නියාව දත් වෙනත් ඇමතියෙක්, ඔහු කරා ගොස් පෙහෙවීමියි දැන් තොප බොරු කීයේ ඇයි දැයි අසා නින්දා කළේය. එවිට පුරෝහිතයා මෙසේ පැවසීය. මම උදෑසන බත් අනුභව කොට ගියෙමි. දැන් ගොස් මුව සෝදා සිල් සමාදන් වන පමණක් වේ ද? එතෙකුදු වුවත් බත් නොකා වාතය නොබිදීමෙන් මට අඩ පෝය රැකෙන්නේය කියා ගෙට ගොස් පිරිසිදුව සිල් සමාදන් විය.

එක් දිනක් අමාත්‍යයා අධිකරණ ශාලාවෙහි උන් විට ආචාරශීලයෙන් යුත් ගැහැණියක් වේලාව ආසන්න බව දැන, මුව සෝදා, පෙහෙවස් සමාදන් වන්නට පටන් ගත්තාය. එකෙණෙහි එක්තරා පුරුෂයෙක් ඉදුණු අඹ එලයක් පුරෝහිත බමුණාට දුන්නේය. හෙතෙම ස්ත්‍රිය පෙහෙවස් සමාදන් වූ බව දැන, වේලාවට මෙපමණ මුත් අනුභව කළ මැනවැයි අඹය ඇයට දුන්නේය. ඇය ද අඹ අනුභව කොට සිල් සමාදන් වූවාය. බමුණා විසින් කරන ලද කුසලය මෙපමණක් විය.

ඔහු කලුරිය කොට හිමාල වන ප්‍රදේශයෙහි කෝසිනික නම් ගංගාව සමීපයේ එක් වනයෙක රම්‍ය වූ භූමි ප්‍රදේශයක, රන් විමනෙක විසිතුරු කරන ලද සිරියහන මත නිදා පිබිදුනාක් මෙන් ගොස් උපන්නේය. විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසුණු රූමත් දෙවඟනන් සොළොස් දහසක් පමණ පිරිවරන ලදුව රෑ කාලයෙහි අපමණ වූ දිව්‍ය සම්පත් වින්දේය. විමන් ප්‍රේතභාවය හේතු කොට ගෙන මොහු පෙර කරන ලද කුසල කර්මය හා සමාන වූ විපාක ලැබුවේය. එහෙයින් අරුණ නැගුණ පසු අඹ වනයට පිවිසි විට ඔවුන්ගේ ආත්මභාවය අන්තර්දහනව අසූ හතක් පමණ ආත්මභාව පහළ වන්නේය. සියලුම ශරීරය

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්ද්‍රගුත්ත ජාතකය"

ගිනිගෙන දිළිසෙමින් සුපිපි මලින් යුත් කැලෑ රුක් වන්නේය. ඔහුගේ අත් දෙකෙහිම එකී එකී ඇඟිලි වන්නේය. ඇඟිලිවල උදලු පමණ තියුණු නිය ඇත්තේය. ඒ නියෙන් තමාගේ පිට මස් පලා, උපුටා කමින් මහත් වේදනාවෙන් පීඩාවට පත්ව, මහත් බැගෑපත් හඬින් හඬමින් දිවා භාගය ප්‍රේත දුක් අනුභව කරයි. හිරු බැස ගිය විට ඒ ප්‍රේත ශරීරය අතුරුදහන්ව දිව්‍ය ශරීරයක් පහළ වෙයි. අලංකාර ලෙස සැරසුණු දිව්‍ය ස්ත්‍රීහු කාම මදයෙන් මත් වී නොයෙක් තූර්‍ය භාණ්ඩයන් ගෙන මොහු පිරිවරා උන්හ. හෙතෙම මහත් දිව්‍ය සම්පත් විඳිමින් නන්දන වනය මෙන් සිත්කලු අඹ වනයට සමීපයෙහි වෛජයන්ත ප්‍රාසාදය මෙන් සිත්කලු වූ තමාගේ ප්‍රාසාදයට නැග්ගේය.

මෙසේ පූර්ව ජන්මයෙහි ආ මැදහත්ව අධිකරණ විචාළ පුරෝහිත බ්‍රාහ්මණයා, එකල පෙහෙවස් රකින්නා වූ ස්ත්‍රියකට දුන් අඹ ඵලයක අනුහසින් තුන් යොදුන් පමණ මධුර ඵලබරිත දිව්‍ය අඹ උයනක් ලැබූහ. අල්ලස් ගෙන අධර්මිෂ්ඨව අධිකරණයේ යුක්තිය පසඳලූ පාපයෙන් තමාගේ පිටමස් තෙමේම උපුටා කමින් දිවා භාගයෙහි මහත් දුක් වින්දේය. අඩ උපෝෂථ රැකි අනුහසින් රාත්‍රියෙහි මහත් වූ දිව්‍ය සැප අත් වින්දේය. සොළොස් දහසක් පමණ දිව්‍ය අංගනාවෝ ද, නැටීම්, ගී කීම්, බෙර වැයීම් ආදියෙන් මොහු සිත් පොළඹවන්නාහ.

මෙකල්හි බරණැස රජතුමා කාමයෙහි ආදීනව දැන පැවිදිව විමාන ප්‍රේතයා වසන කුසනික නම් ගංගාව අසල සිත්කලු වූ භූමියක පන්සලක් කොට ගෙන ඇවිලිලි පළ මුල ආදියෙන් යැපෙමින් පෙහෙවස් රැක්කේය. එකල එහි උඩු ගඟ මහා අඹ වනයෙක මහා දිය කළයක් හා සමාන අඹයක් ගඟ දියෙහි වැටී පහතට ගසා එන විට ඒ තාපසයා ජල ස්නානය කරන ගං තෙරට අඹය ගසාගෙන ආවේය. තාපසයා දිය නා, අඹය දැක රැගෙන ගොස් පිහියෙන් පලා කොටසක් අනුභව කොට ඉතිරි කොටස කෙහෙල් පතකින් වසා තබා නැවත නැවත ඒ දවස මුළුල්ලේ අනුභව කරමියි ලෝභ කොට ගං තෙරට ගොසින් තවත් අඹ ගසාගෙන එතැයි විඩාවෙන් බලාගෙන සිට, අඹ නොලැබ මෙතනින් නැගී නොසිටිමියි සනිටුහන් කරගෙන එතනම උන්නේය. මොහු පෙර පරිද්දෙන්ම නිරාහාරව ක්‍රමයෙන් සය දවසක් මුළුල්ලෙහි අව් සුළඟින් වියළෙමින් බල බලා සිටියේය.

එවිට සත්වෙනි දවස ගං තෙර අධිපති දේවතා දූ මේ තාපසයා මෙසේ නිරාහාරව සිටින්නේ කුමක් නිසාදැයි සිතා, කාරණය දිව නුවණින් දැක, මේ තාපසයා තෘෂ්ණාවෙන් වසඟව සතියක් නිරාහාරව ගඟ බලා සිටින්නේය. මේ සිල්වත් තාපසයාට අඹ ඵලයක් නොදීම යුක්ත නොවන්නේ යැයි සිතුවාය. ඔහු කැමති අඹ පිළිගන්වමියි අහසින් විත් තාපසයෙනි, කවර අභිප්‍රායක්, සිතුවිල්ලක් ඇත් ද? කුමක් පතන්නෙහි ද? ග්‍රීෂ්ම කාලයෙහි ගඟ බලාගෙන ඉන්නේ දැයි විමසුවාය. එවිට තාපසයා මම වනාහි ආදීනව දැක ඍෂි වෙස් ගෙන කොසිනික නම් ගං තෙර පන්සලක් කොට වෙසෙන්නෙමි. එක් දවසක් මුව සෝදනු පිණිස ගං තෙරට බැස්සෙමි. එදින සුවඳින් අඹයක් දැක එය ගෙන ගොස් මුළුතැන්ගේ තබා කොටසක් අනුභව කොට ඉතිරි භාගය කෙහෙල් පතකින් වසා නැවත නැවත අනුභව කළෙමි. එදවස අන් ආහාරයක් නොසොයා එම අඹ රසම අනුභව කළෙමි. අඹය දිවඟ තැබූ පමණින් රස නහර පිනා යයි. කුසගින්න නිවී යයි. කාය චිත්ත පීඩා දුරු වේ. එය අනුභව කළ වේලෙහි පටන් මෙතෙක් දවස් අනුභව කළ කෙහෙල්,



වැල, වරකා ආදී ඵලයන්ගෙන් අස්වැසිල්ලට නොපැමිණියෙමි. ඒ සියලු ඵල දිවෙහි තිබූ විට තිත්ත බව වැටහෙන්නේය. එදින සිට මධුර වූ රස ඇති අඹ ඵල ගනිමියි සිතා සිටි නමුත්, අඹ ඵල නොලද්දෙම් නම් ජීවිතය නොවන්නේ යැයි ඇති සැටියෙන් කීය.

අහසෙහි වැඩ වසන ඔබ පංචකල්‍යාණියෙන් සමන්විත දිව්‍යාංගනාවක් වූයේ කෙසේ ද? ඔබ කවරෙක් දැයි දෙව්දුවගෙන් විචාළේය. දෙව්දුව පිළිතුරු දෙමින්, තාපසයෙනි, යම් මිහිරි ජලයෙන් යුත් ගංගාවක් ඇසුරු කොට වෙසෙයි ද, බොහෝ කලක් මා විසින් අධිගෘහිතව වසන කල මෙතන නොයෙක් ඇසළ, සපු, දුණුකේ, කිණිහිර, දෑසමන් ආදියෙන් ගැවසී ගත්තේය. නොයෙක් කඳුරැළි ඇත්තීය. මේ ගඟෙහි සුනිල දියෙන් යුක්ත වූ ජල ප්‍රවාහය බොහෝ කොට කියා අඹ ඵල ආදී බොහෝ ඵල ජාති ගඟට ගලා ආ හැටි ප්‍රකාශ කළාය. ලාමක වූ ප්‍රඥා ඇති තාපසයෙනි, කාමයෙහි ආදීනව දැක, රජ සිරි හැර තවුස් වෙසත් ගත් තොප විසින් රස ආදියෙහි තෘෂ්ණා බැඳීම නුසුදුසු වෙයි. එබැවින් පැමිණි රස තෘෂ්ණාවෙක් ඇත්නම් එය වළක්වන්න. පිරුණු සිත් ඇති රාජ තාපසයෙනි, යම් හෙයකින් අඹ නොලැබ මරණ කැමති ද, එහෙයින් තොපගේ නුවණ මුහුකුරා යැමක් නැතැයි සිතමි. තපසුන්ට නුසුදුසු වූ තෘෂ්ණාවේ බැඳීම සදිව්‍ය ලෝකයේ දෙවියන් හා බ්‍රහ්මයෝ ද, ඍෂිවරයෝ ද තොප නොකීවත් තමන්ගේ ආනුභාවයෙන් දන්නාහ. ඒ ඍධිමතුන් මෙම තාපසයාගේ අධ්‍යාසය නපුරැයි කී විට එය ඔවුන්ගේ පරිවාර මනුෂ්‍යයෝ ද දැනගන්නාහ.

ඒ නිසා පවු කරන්නාට රහසක් නම් නැතැයි සිතා තාපසයනට දන්වා සිටියාය. දෙව්දුව කී වචන අසා රාජ තාපසයා ත්‍රිවිධ සුචරිත ධර්මයේ ස්වරූපය ද, ශරීරයේ වැනසීම ද, නාම රූපයන්ගේ චුත වීම ද යම් ප්‍රාඥයෙක් දනී නම්, පරූප ජීවිතය තොර නොකරන පිණිස යත්න නොකෙරේ ද, ඔහුට පාප වර්ධනයක් නොවන්නේය. දෙව් දුවගේ බස් ඇසූ තාපසයා යම් කිසි සතෙකුගේ ජීවිතයක් තොර කිරීම පිණිස යත්න නොදරන උතුමෙකුට පාපයක් වර්ධනය වන්නේ නැත. මොහුත් කෙලෙස් තවන තාපස කෙනෙක් යැයි දැන ලෝක වාසීන් මොහු විසින් පාපයන් නස්නේ යැයි යන උතුම් ගුණ ඇති මා කෙරෙහි නුසුදුසු වූ නින්දා වචනයෙන් අපහාස කරන ඔබ කිසි ද්වේශයක් මා කෙරෙහි නැති හෙයින් නිස්කාරණයෙන් පර පව් සොයන කෙනෙකැයි දෙව් දුවට කියා මම ඔබ අධිගෘහිත ගං තෙරෙහි නැසුනොත් මෙසේ වූ තපස් කෙනෙකු නිරාහාරව නැසී යනු බලා ඔබගේ යසස් නැති වී යනු ඇත. එසේ හෙයින් ප්‍රාණයක් නොරැකීමෙන් පවින් දුරු වූ මා මී අඹ නොලැබ මළ කල්හි සියලු දෙවියෝ ඔබට නිඳා කරනු ඇත.

එබසට දෙව් දුව ඔබ රස තෘෂ්ණාවේ බැඳී ඔබ මෙතන උන් කාරණා දනිමි. එසේ හෙයින් මමත් තොපට නතුවෙමි. ඔබ කැමති රස අඹත් දෙමියි කියා එබඳු ඔබ ලාමකයන් විසින් හැරපිය නොහැකි වස්තුකාම, ක්ලේශකාම හැර සීලාදී සුචරිත ධර්මයෙහි පිහිටියේ ද එසේ හෙයින් ඔබ කළ දේ යහපත්ය. යම් කෙනෙක් පළමු මලකින් මිදී, දෙවෙනි මලටත් බැඳේ නම් එපරිද්දෙන් සමහර කෙනෙක් ධර්මය රකිම්හයි වැද අධර්මයේ හැසිරෙත් නම් දවස දවස පාපයම වැඩෙන්නේය. ඒ සා මහත් රජසිරි හැර තාපස වෙස් ගත් ඔබට මෙපමණ වරදක් වේ ද? බොහෝ ගුණයෙන් සිත් සතුටු වූ ඒ දෙව් දුව එම අඹ වනයට පමුණුවාලමියි කියා ඔහු ද රැගෙන අහස් ගමනින් අඹ උයනට පිවිස තාපසයන් සිටුවා රම්‍ය වූ අඹ වනය වර්ණනා කළ දෙව්දුව, තාපසයෙනි, ඔබ කැමති පමණ අඹ අනුභව කොට තෘෂ්ණාව නිවා ගත මැනවැයි පවසා විමානයට ගියාය.


ඒ තාපසයා ද තෘෂ්ණාව පුරා අඹ අනුභව කොට දහවල් දුක් විඳ ඇවිදිනා විමාන ප්‍රේතයා දැක, භයින් කිසිවක් කියා ගත නොහැකිව, හිරු බැස ගිය කල්හි දිව්‍ය ස්ත්‍රීන් පිරිවරා දිව සැප අත්විඳිනු දැක මෙලෙස විචාළේය. රාත්‍රියෙහි මාලාභරණ පැලඳ මිණි ඔටුනු දරා රත් සඳුන් ඇඟ තවරා සියලු දිව්‍යාභරණයෙන් සැරසුනු ඔබ සර්වාභරණයෙන් සැරසුනු සොළොස් දහසක් පමණ දිව්‍ය නාටක ස්ත්‍රීන් පිරිවරා දිව සැප විඳින්නාහුය. එසේ වූ ඔබ දිවා භාගයෙහි අපමණ දුක් විඳින්නේය. ඔබ පූර්වජන්මයෙහි තමහට දුක් ගෙන දෙන දරු තොපට පුරෝහිත තනතුරෙහි සිටියෙහිය. දැන් මේ රාත්‍රියෙහි සැප විඳන්නේ එකල ඔබගේ නියෝගයෙන් රකින ලද අඩඋපොසථයෙහි අනුසස් ලැබීමෙනි. දාවල් මේ දුක් විඳීම එසමයෙහි මා විසින් කළ අකුසලයෙහි විපාකයෙන් පැමිණියේය. ඒ කෙසේද යත්, එසමයෙහි නුඹවහන්සේ විසින් අධිකරණ නායක ධුරයෙහි තබන ලදිමි. යුක්ති විචාරන්නේ ඒ ඇති යුක්ති ඇති අයගෙන් අල්ලස් ගෙන ඈ මැදහත් යුක්ති කියා අල්ලස් ගැනීම් වශයෙන් අනුන් පිට මස් කා දහවල් ගත කිරීම ද, අධර්ම යුක්තියෙහි බලයෙන් දුක් විඳින ප්‍රේතයා මෙසේ කීවේය. ධර්මය දැන ප්‍රේතවත්‍රය හදාරා වස්තුකාමයෙහි බැඳුනෙමි. එසේ හෙයින් එකල බොහෝ දවසක් නුනුවණින් අන්‍යයන්ට අහිත ගෙන දෙන පාපයන් කළෙමි. යමෙක් අනුන් පිට මස් කා අන්‍යය කෙරේ ද එතෙම පෙර පරිද්දෙන්ම තමා ඇඟ මස් තෙමේම උපුටා කමින් ගිණි ගෙන දිළිසෙන සිරුරු ඇතිව මහත් ප්‍රේත දුක් විඳින්නේ යැයි කියා, රාජ තාපසයාණන් වහන්ස, නුඹ වහන්සේ කෙසේ මෙහි ආවේදැයි විචාළේය.

එවිට ඒ තාපසයා ද, රාජ්‍යශ්‍රී අනුභව කෙරෙමින් සිට කාමයෙහි ආදීනව දැක තවුස් වෙස් ගත් නියාව ද, දියෙහි යන අඹ ඵලයක් ලැබ, එහි වසඟ වූ අයුරු ද, ගඟ අධිගෘහිත දෙව්දුව විසින් මේ අඹ වනයට පැමිණ වූ අයුරු ද යනාදී සියලු දේ පැවසීය. එවිට විමාන ප්‍රේතයා, කිමෙක් ද තාපසයන් වහන්ස, මෙහි රඳනා කැමැති දැයි විචාළේය. එබස් ඇසූ තාපසයෝ ද, මෙතැන වසනු නොකැමැත්තෙමි, පෙර මා විසූ තපෝවනයෙහි පන්සලටම යනු කැමැති වෙමියි කීවේය. එකල්හි විමාන ප්‍රේතයා, යහපති ස්වාමීනි, වැඩිය මැනව. මමත් මෙතැන් පටන් නිරන්තරයෙන් පලා ඵල නිසා දුක් ගෙන තපස් කරන පරිද්දෙන් දිවි පමණින් මේ අඹ ඵල දන් දෙමි. තාපසයා තමාගේ ආනුභාවයෙන් ඒ පන්සල බහා උකටලී නොව මෙහි විසුව මැනවැයි ප්‍රතිඥා ලබා ගෙන, නිරන්තරයෙන් අඹ ගෙන ගොස් පිළිගන්වන්නේය. ඒ තාපසයාත් අඹ අනුභව කොට දැහැමින් වැස පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නේ යැයි කියා, බුදුරජාණන් වහන්සේ උපාසකවරුන්ට චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ ජාතක ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා, පූර්වාපර සන්ධි ගලපා නිමවා වදාළ සේක.

මේ ධර්ම දේශනාවේ කෙළවර බොහෝ සත්ත්වයෝ සෝවාන්, සකෘදාගාමී යන මාර්ග ඵලාදියට පැමිණ භව දුකින් මිදුනාහ. එසමයෙහි දෙව්දුව නම් උත්පලවර්ණා මහා ස්ථවිරීන් වහන්සේය, එකල්හි තාපසයෝ නම් බුදු වූ මම්ම යැයි වදාළ සේක. මෙම ජාතකයෙන් හෙළිවන පෙහෙවස් රැකීමෙහි අනුසස් දැන, ඔබ ද නිති පන්සිල් හා පොහොය අටසිල් රැක සසර ගමන කෙටි කර ගැනීමට වෙර දැරීමට අදිටන් කර ගන්න.

**කේ. මීගහකුඹුර**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."



# කඨින පින්කම

## ශ්‍රී දළදා මාලිගාවේ කඨින පින්කම ඔක්තෝබර් 21-22 දිනවල

**ශ්‍රී දළදා** මාලිගාවේ කඨින චීවර පූජෝත්සවය ඔක්තෝබර් 21, 22 දිනයන්හී මහනුවර, කටුකැලේ ලේඩි බ්ලේක් ආරාමාධිපතිනි සද්ධා ප්‍රසාදිනී ධර්මචාරි කොත්මලේ සුධර්මා සිල් මැණියන්ගේ අනුශාසකත්වයෙන් සහ මහනුවර රජපිහිල්ල මාවතේ අංක 38 නිවසේ ශ්‍රියානන්ද විජේකෝන්, කුමාරි විජේකෝන් යුවල ප්‍රධාන පවුලේ පිරිසගේ ප්‍රධාන දයකත්වයෙන් පැවැත්වේ.

ඔක්තෝබර් මස 21 වැනි දින සවස 4 සිට 5 දක්වා ධර්ම දේශනාවකි. රාත්‍රී 7.15 ට ගිලන්පස පූජාවකි. 22 වෙනි දින දවල් මල්වතු අස්ගිරි මහනායක, අනුනායක හිමිවරු ප්‍රධාන ශතාධික මහා සංඝරත්නය විෂයෙහි පිරිනමනු ලබන සිපිරිකර සංඝගත දක්ෂිණාවකි. අමුතු මුළුතැන් බුද්ධ පූජාව සහිත කප්රුක් මහ පූජා සමග කඨින චීවර පූජාව සිදු කෙරේ.

කටුකැලේ ආරාමයේ සිට ඔක්තෝබර් 17 දින විසිතුරු ධර්ම යාත්‍රාවක් සහිත රිය පෙරහරකින් කඨී වස්ත්‍රය රජපිහිල්ල මාවතේ අංක 38 දරන ස්ථානයේ පිහිටි ශ්‍රියානන්ද විජේකෝන් මහතාගේ නිවසට වැඩමවා ඔක්තෝබර් 22 දින අළුයම අලි, ඇතුන් සහිත මහා පෙරහරකින් කඨීන වස්ත්‍රය ශ්‍රී දළදා මාලිගාවට වැඩමවා කඨීන වස්ත්‍රය සඟසතු කර පූජා කෙරේ. කොත්මලේ සුදර්මා සිල් මැණියන්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී දළදා මාලිගාවේ මෙවර සිදුකරනු ලබන්නේ 53 වෙනි කඨීන පින්කම් මහෝත්සවයයි.

## මල්වතු මහා විහාරයේ කඨින පින්කම ඔක්තෝබර් 22, 23 දිනවල

**මහනුවර** මල්වතු මහා විහාරයේ කඨීන පින්කම් පුණ්‍යෝත්සවය ඔක්තෝබර් 22, 23 දිනයන්හි පැවැත්වේ. මල්වතු මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික අග්ගමහා පණ්ඩිත මහෝපාධ්‍යා සංඝරාජ ගුණානුස්මරණ සමිතියේ හා සංඝරාජ කාන්තා සමිතියේ අනුශාසක අලුත්ගම ධම්මානන්ද නාහිමිගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මල්වතු මහා විහාරයේ කඨීන මහා පින්කම 22 වැනි දින සවස 5 සිට 6 දක්වා පවත්වනු ලබන ධර්ම දේශනාවකින් ආරම්භ කෙරේ.

ඔක්තෝබර් 23 වැනි දින අලුයම 4 ට සංඝමිත්තා මාවතේ ජනසිරි නිවසේ සිට එක් කඨීන වස්ත්‍රයක්ද, මහනුවර රජපිහිල්ල මාවතේ මිඩ්ලන්ඩ් නිවසේ සිට එක් කඨීන වස්ත්‍රයක්ද, මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ සිට එක් කඨීන වස්ත්‍රයක්ද පෙරහරෙන් වැඩමවා මහානායක නිල ආරාමයට, පෝය මලුව විහාරයට සහ මල්වතු මහා විහාරස්ථ පෝය ගෙට පිළිගැන්වීම සිදුකෙරේ. හීල් දනය 29 වන වරටත් ශ්‍රී සංඝරාජ ගුණුනුස්මරණ සමිතියේ ඩබ්ලියු. පණ්ඩිතරත්න මහතා ප්‍රධාන පවුලේ පිරිස විසින් පිරිනමනු ඇත. මෙදිනම දවල් මල්වතු මහා විහාරීය මහා සංඝ රත්නය හැට නමක් විෂයෙහි සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමේ. සංඝරාජ ගුණානුස්මරණ සමිතිය, කාන්තා සමිතිය, සංඝරාජ දහම් පාසල, ධර්මෝදය දහම් සමාජය, මහනුවර වෛශාඛ්‍යාදන සංග්‍රහ සමිතිය ඇතුළු බෞද්ධ සමිතිවල සහ දයක දයිකාවන්ගේ සහභාගිත්වයෙන් මහෝපාධ්‍ය අලුත්ගම ධම්මානනන්ද නාහිමිගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරෙන මෙම පින්කමේදී උපසම්පදව පිහිටුවා වදාළ සංඝරාජ මාහිමිපාණන් ඇතුළු අපවත් වී වදාළ මහ තෙරවරුන් ඇතුළු කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජතුමාට පින් අනුමෝදන් කිරීමද සිදුකෙරේ.

## අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරයේ කඨින පින්කම ඔක්තෝබර් 23, 24 දිනවල

**මහනුවර** අස්ගිරිය මහා විහාරයීය ඓතිහාසික ගෙඩිගේ රජමහා විහාරයේ කඨීන පින්කම ඔක්තෝබර් 23, 24 දිනයන්හි අස්ගිරිය පාර්ශ්වයේ අතිපූජ්‍ය, අනුනායක, පොළොන්නරුව සොළොස්මස්ථානාධිපති ගෙඩිගේ රජමහා විහාරාධිකාරී, ශාස්ත්‍රපති, වේඩරුවේ ශ්‍රී උපාලි නාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

ඔක්තෝබර් 23 සවස ආගමික වැඩසටහන් මාලාවකි. පසුදින (24) අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක, අනුනායක හිමිවරු ප්‍රධාන මහා සංඝ රත්නය උදෙසා පිරිනැමෙන කඨීන චීවර සහිත සපිරිකර සංඝගත දක්ෂිණාවකි.


## පොළොන්නරුව ගල් විහාරයේ කඨින පින්කම ඔක්තෝබර් 15, 16 දිනවල

**ඓතිහාසික** පොළොන්නරුව ගල් විහාරයේ කඨීන පින්කම් පූජෝත්සවය ඔක්තෝබර් 15, 16 දිනවලදී පොළොන්නරුව ගල් විහාරාධිපති, සොළොස්මස්ථානාධිපති, අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක, ශාස්ත්‍රපති වේඩරුවේ ශ්‍රී උපාලි නාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

ඔක්තෝබර් 15 වැනිද සවස පිරිත් දේශනාවක් ඇතුළු ආගමික වැඩසටහන් මාලාවකි. 16 වැනිද දවල් කඨීන චීවර පූජාව සහිත මහා සංඝ රත්නය විෂයෙහි පිරිනමනු ලබන සපිරිකර සංඝගත දක්ෂිණාවකි.

**කේ. බණ්ඩාරනායක**

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."



# එක් වන්දනා සමයක් තුළ ශ්‍රී පාද අඩවියට

## කැළි කසල කිලෝ ග්‍රෑම් දෙලක්ෂ හැත්තෑ දහසක්!




සුරකිමු අපි ලංකා

'ගිය සැරෙත් අපට සිරිපා කරුණා කරන්නට බැරි වුණා. මොන තරම් සෙනඟ හිටියත් මෙද සැරේ නම් අපි සිරිපා කරුණා කරනවාමයි.' ඔබත් මෙසේ සිතමින් සිටින බැතිමතකු විය හැකියි.

සාපේක්ෂව වර්තමානයේ ප්‍රවාහන සහ සන්නිවේදන ක්‍රම දියුණු වීම නිසා අද වන විට ශ්‍රීපාද වන්දනාවේ පිරිස්වල ශීඝ්‍ර වැඩිවීමක් දක්නට පුළුවන්. අප රටේ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවලින් ශ්‍රීපාද වන්දනාව සහ ශ්‍රීපාද සංස්කෘතිය පිළිබඳ ලිපි විශේෂාංග සහ වැඩසටහන් වැඩිපුර ඉදිරිපත් වීමත් මේ සඳහා බලපාන්නට ඇති. එසේම අප රටේ වාහන බහුලවීම, මාර්ග පහසුකම් වැඩි දියුණු වීම, වන්දනා, විනෝද ගමන් පිළිබඳ ජනතා උනන්දුවක් පිබිදීමත් මේ සඳහා හේතු වන්නට පුළුවන්. මේ අතර මේ තත්ත්වය යටතේ අද වන විට වාර්ෂිකව ශ්‍රීපාද වන්දනා කරන පිරිස ලක්ෂ තිස් පහක පමණ පිරිසක් ශ්‍රීපාද වන්දනාවේ යෙදෙන බව අනාවරණය වී තිබෙනවා. මතුපිටින් බලන විට ඉතා වාසනාවන්ත තත්ත්වයක් නමුත් මෙහි බොහෝ දෙනකුට නොපෙනෙන අතිශය බියකරු පැත්තක්ද තිබෙනවා. නමුත් ඒ සම්බන්ධයෙන් අදත් බොහෝ දෙනකුගේ අවධානය යොමුවී නැහැ.

දනට පරිසර සංවිධාන මගින් සිදුකොට ඇති නිරීක්ෂණයන් අනුව උඳුවප් පුර පෝද සිට වෙසක් පුර පෝද තෙක් මාස හයක කාලයක් පුරා පවතින ශ්‍රීපාද වන්දනා සමය තුළ හැටන්, නල්ලතන්නි, රත්නපුර, ශ්‍රී පලාබද්දල, කුරුවිට, එරත්න යන ප්‍රධාන ශ්‍රීපාද මාර්ග ආශ්‍රිතව පමණක් එක් දිනක් තුළ කැළි කසල මෙට්‍රික් ටොන් එකහමාරක් එක්රැස් වන වග දළ වශයෙන් ගණනය කොට තිබෙනවා. ඒ අනුව මුළු මාස හය තුළම ශ්‍රීපාද අඩවිය තුළ එක් රොක්වන කැළි කසල ප්‍රමාණය මෙට්‍රික් ටොන් දෙසීය හැත්තෑවක්, නැතහොත් කිලෝග්‍රෑම් දෙලක්ෂ හැත්තෑවක් බව වටහා ගන්නට පුළුවන්. මේවා අතරින් පොලිතීන්, ප්ලාස්ටික්, බෝතල් කටු ආදී නොදිරන ද්‍රව්‍ය විශේෂ තැනක් ගන්නා බව පෙනෙනවා.

සාමාන්‍යයෙන් කිනම් හෝ පරිසර පද්ධතියක් තුළට අවිචාරවත් ලෙස කැළි කසල බැහැර කිරීම පාරිසරික අපරාධයක් ලෙස හඳුන්වන්නට පුළුවන්. එහෙත් එසේ ඉවත හෙලන කැළි කසල සහ ඒ පරිසර පද්ධතියේ ස්වභාවය අනුව ඒ අපරාධයේ බරපතළ බව වැඩිවෙනවා.

ශ්‍රී පාදස්ථානය සමස්ත ශ්‍රී ලාංකික බෞද්ධයන්ගේ පරම පූජනීය ස්ථානයක් බව කවුරුත් දන්නා කරුණක්. නමුත් පාරිසරික වශයෙන් ගත්විටද ශ්‍රී පාද අඩවියට එම පරම පූජනීයත්වයම හිමිවන බව පැවැසීම අතිශයෝක්තියක් නොවෙයි. ඒ අනුව තමන්ගේ පරම පූජනීය පුද බිමක් වන්දනා කිරීමට යන බෞද්ධයන් වෙතින් එම ප්‍රදේශයේ පවතින පරම පූජනීයත්වය බරපතළ අයුරින් කෙලෙසීම නිසැක වශයෙන් ජාතික අපරාධයක්.

ශ්‍රී ලාංකීය ජල සම්පතේ ප්‍රධානතම තිඹිරි ගෙයක් ලෙස සැලකෙන ශ්‍රීපාද අඩවිය මුල්වරට අභය භූමියක් වශයෙන් ප්‍රකාශයට පත්කොට ඇත්තේ මීට වසර හැත්තෑපහකට කලින් 1940 වසරේ ඔක්තෝබර් 25 දයි. එවක අප රට පාලනය කළ ඉංග්‍රීසීන් විසින් මෙම අභය භූමිය නම් කොට ඇත්තේ (Peak wildemes sanctuary) නමින්. එය ශ්‍රී පාදස්ථානය මැදි කොට ගත් වර්ග කිලෝමීටර් දෙසිය විසි හතරක (අක්කර පනස්පන්දහස් තුන්සිය පනස් එකක්) ප්‍රමාණයක්. පනහක් පමණ වන ශ්‍රී ලංකාවේ අභය භූමි අතුරින් විශාලත්වයෙන් තුන්වන තැන හිමිවන්නේ මෙම අභය භූමියටයි. ඒ වගේම මෙම පරිසර පද්ධතියේ ඇති සත්ව, ශාක සහ ජෛව ගෝලීය මුල්කොට මෙය ස්වභාවික රක්ෂිතයක් (Nature reserve) ලෙසද ප්‍රකාශයට පත්කොට තිබෙනවා. ඒ සඳහා අභය භූමියට අමතර තවත් ප්‍රදේශයක් එක්කොට තිබෙනවා. ඒ නොවිධිමත් මානව ක්‍රියාකාරකම් නිසා මේ වන කලාපයට සිදුවිය හැකි හානිය පිටුදැකීමේ අරමුණින්. මීටත් අමතරව මෙම උතුම් පාරිසරික කලාපය යුනෙස්කෝව මගින් 2010 වසරේ සිට ස්වභාවික ලෝක උරුමයක් (World Herritage) ලෙසත් ප්‍රකාශයට පත්කොට තිබීමත් මේ උතුම් පුදබිමේ අගය තවත් ඉහළ නැංවීමක්. නමුත් මේ සියලු වාසනාවන්ත තත්ත්වයන් යටතේ ශ්‍රීපාද වන්දනාවේ යන ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් විසින් අයථා ලෙස කසල බැහැර කිරීම මගින් මෙම උතුම් පූජනීය පරිසරය විනාශ කිරීම ජාතික අපරාධයක් බව කිව යුතු නැහැ.

එමෙන්ම ශ්‍රීපාද කඳු මුදුන දක්වා වන ප්‍රධාන වන්දනා මාර්ග තුනකින් සැදුම් ලත් මේ මහා වනගහනය තුළ දැනට ශ්‍රී ලංකාවේ දුබලතම පාරිසරික සම්පතක් වන නොඉඳුල් වන කලාපද (Virgin Forest) තිබෙනවා. අප බොහෝ දෙනා ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම වනාන්තරය ලෙස හඳුනාගෙන තිබෙන්නේ සිංහරාජ වනපෙත පමණයි. නමුත් සිංහරාජය මෙන් දෙගුණයක් තරම් විශාල ශ්‍රීපාද රක්ෂිතය ජෛව විවිධත්වය අතින් සිංහරාජයද අභිබවන බව කිව යුතුයි.

කෙසේ හෝ ශ්‍රීපාද අඩවියට වන්දනාකරුවන් වෙතින් වන අයහපත් පාරිසරික බලපෑම්වල මූලාග්‍ර මගින් එම නොඉඳුල් වන කලාප දක්වාද පැතිර යන බව බොහෝ දෙනෙක් නොදන්නා කරුණක්. මෙවැනි නොඉඳුල් වන කලාපයක ඇති සුවිශේෂත්වයක් වන්නේ මෙතෙක් හඳුනා නොගත් සත්ව ශාක ප්‍රජාවක් වැනි ජෛවමය සම්පත් තවමත් මේවා තුළ ලොවට රහසින් සැඟවී තිබිය හැකිවීමයි. නුදුරේදී හෝ මතු අනාගතයේදී පාරිසරික ගවේෂණවලට ලක්කොට සුවිශේෂී සොයා ගැනීම් රැසකට මං පාද ගත හැකි මෙවන් වන කලාප පරිසර දූෂණයට ලක්වීම මතු පරපුර සඳහා මෙලොවට බිහිවන බිළිඳුන් මරා දැමීමක් හා සමාන බව කිව යුතුයි.

ඒ කෙසේ හෝ මේ වනවිට දිනෙන් දින ඉහළ යන ශ්‍රීපාද වන්දනාකරුවන්ගේ ප්‍රමාණය අනුව මෙම ශ්‍රීපාදස්ථානය අවට පරිසර පද්ධතියට ආරක්ෂාව සැලසීම රාජ්‍ය සහ පාරිසරික සංවිධාන මුහුණ පා හිඳින බැරෑරුම් අභියෝගයක් බව කිව යුතුයි. එහෙත් මෙහිදී මෙම පරිසර පද්ධතිය ආරක්ෂා කොට මෙහි පූජනීය බවට සැබෑ අගැයුමක් ලබාදීම සම්බන්ධයෙන් සුවිසල් වගකීම් සම්භාරයකට වන්දනාකරුවන් බැඳී සිටින බව ඒකාන්ත සත්‍යයක්. ඒ අනුව ශ්‍රීපාද අඩවියට ඇතුළු වූ මොහොතේ සිට කට වරද්ද නොගන්නා පැරණි සම්ප්‍රදාය සේම එම අඩවිය තුළ කසල බැහැර කිරීමට හිත වරද්ද නොගන්නා මෙන් ශ්‍රීපාද වන්දනා සමය ඇරඹෙන්නටත් කලින් ඔබට ආයාචනා කළ යුතුයි.

**පරිසර සංරක්ෂණ භාරයේ අධ්‍යක්ෂ - සජීව චාමිකර**



"ධර්ම දානය සියලු දානයන්ට වඩා ශ්‍රේෂ්ඨයි."



# කඨින පින්කම්

## අස්ගිරිය විජයසුන්දරාරාම පුරාණ විහාරයේ කඨින පින්කම නොවැම්බර් 6, 7 දිනවල

**මහනුවර,** අස්ගිරිය විජයසුන්දරාරාම පුරාණ විහාරයේ කඨින පින්කම් පූජෝත්සවය නොවැම්බර් 6, 7 දිනයන්හි අස්ගිරිය මහා විහාරීය කාරක සංඝ සභාවේ කාරක සභික මොලගොඩ ධම්මරත්න ලොකු හාමුදුරුවන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. හත්වැනි දින අස්ගිරිය මහා විහාරයීය මහා සංඝරත්නය තිස් නමක් විෂයෙහි කඨින චීවර සහිත සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමේ.

## පේරාදෙණිය ශ්‍රී සුබෝධාරාම මහා විහාරයේ කඨින පින්කම ඔක්තෝබර් 15, 16 දිනවල

**පේරාදෙණිය** සුබෝධාරාම මහා විහාරයේ කඨින චීවර පූජෝත්සවය සහ අපවත් වී වදාළ දමිළ භාෂා විශාරද පිණ්ඩපාතික ගලබඩවත්තේ ශ්‍රී ඤාණාලංකාර නාහිමිපාණන්ගේ 36 වැනි ගුණානුස්මරණ පින්කම ඔක්තෝබර් මස 15, 16 දිනයන්හි ශ්‍රී සුබෝධාරාමාධිපති පණ්ඩිත වත්තේගම, ධම්මාවාස නාහිමිගේ අනුශාසනා පරිදි ශ්‍රී සුබෝධාරාරම ශාසන සේවා සමිතියේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

පහළොස් වැනිදා රාත්‍රී අටට සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව ආරම්භ කෙරේ. පසුදින (16) දවල් ආදි කර්තෘවර ගලබඩවත්තේ ශ්‍රී ඤාණාලංකාර නාහිමිපාණන්ට පින් අනුමෝදන් කරන මහා සංඝරත්නය එකසිය පනස් නමකට පිරිනමනු ලබන සපිරිකර සංඝගත දක්ෂිණාවකි. ගුණ සමරු පින්කමක් සමග කඨින චීවර පූජා පින්කම සිදුකෙරේ.

## මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ පොත්ගුල් මහා විහාරයේ කඨින පින්කම නොවැම්බර් 4, 5 දිනවල

**මහනුවර** ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවතේ කීර්ති ශ්‍රී රාජසිංහ පොත්ගුල් විහාරාධිපති, ශාස්ත්‍රපති, ත්‍රිපිටකවේදී යටිනුවර සුමන නාහිමිගේ ප්‍රධානත්වයෙන් විහාරයේ කඨින පින්කම නොවැම්බර් මස 4, 5 යන දිනයන්හි පැවැත්වේ. නොවැම්ර් මස 4 වැනි දින සවස ආගමික වැඩසටහනකි. සංඝමිත්තා මාවතේ දයානන්ද පින්ගොඩ මහතා ප්‍රධාන දායකත්වයෙන් සිදුකෙරෙන කඨින පින්කම 5 වැනිදා දවල් මහා සංඝරත්නය පණස් නමක් විෂයෙහි සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනමා අවසන් කෙරේ.

## හපුගොඩ ශ්‍රී සුභද්‍රාරාම මහජන විහාරය නොවැම්බර් 5 - 6 දිනවල කඨින පින්කමට සූදානම්

**අඹතැන්න,** හපුගොඩ ශ්‍රී සුභද්‍රාරාම මහජන විහාරාධිපති, මාතලේ විද්‍යානන්ද පරිවෙනාධිපති, ශාස්ත්‍රවේදී බටුගොඩ සංකිච්චායන හිමිගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී සුභද්‍රාරාම මහජන විහාරයේ කඨින පින්කම නොවැම්බර් 5, 6 දිනයන්හි පැවැත්වේ. 5 වැනිදා දවල් කඨින චීවර පූජාව සහිත මහා සංඝරත්නය විෂයෙහි පිරිනමනු ලබන සපිරිකර සංඝගත දක්ෂිණාවකි.

## තලංගමුව වළගම්බා රජමහ විහාරයේ කඨින පින්කම ඔක්තෝබර් 15, 16

**මැල්සිරිපුර,** තලංගමුව රජමහ විහාරයේ කඨින පූජෝත්සව පින්කම ඔක්තෝබර් 15, 16 දිනවලදී විහාරාධිපති, අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ කාරක සභික වදුරාගල ධම්මාරාම හිමිගේ ප්‍රධානත්වයෙන් සහ දායක සභාවේ සහභාගිත්වයෙන් පැවැත්වේ. 15 වැනිදා සවස ධර්ම දේශනාවකි. අපවත් වී වදාළ අස්ගිරිය මහා පාර්ශ්වයේ මහානායක උඩුගම ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත මාහිමි අනුස්මරණ ධර්මා ශාලාවේ සිදුකෙරෙන කඨින පූජෝත්සව පින්කමේදී බුද්ධරක්ඛිත මාහිමි ඇතුළු අපවත් වී වදාළ මහ තෙරවරුන්ට පින් අනුමෝදන් කිරීමද සිදුකෙරේ.

## නොවැම්බර් 4, 5 දිනවල ගල්මඩුව රජමහ විහාරයේ කඨින පින්කම පැවැත්වේ

**ඓතිහාසික** ගල්මඩුව රජමහ විහාරයේ කඨින පින්කම නොවැම්බර් 4, 5 දිනයන්හි විහාරාධිපති කර්මාචාර්ය ගම්මුල්ලේ සුමංගල නාහිමිගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. 4 වැනිදා සවස ආගමික වැඩසටහන් මාලාවක් විහාර කාර්ය සාධක සමිතියේ මූලිකත්වයෙන් සිදුකෙරේ.

**කේ. බණ්ඩාරනායක**




"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



# දෙවියන් සිටින්නේ ඔබ ළඟාමය

බෞද්ධයන් වූ අපි දේව සංකල්පය අත හැර දමා නැත. තථාගත බුදුරජාණන් වහන්සේ මිනිසුන්ට පමණක් නොව දෙවියන්ටද ධර්ම දේශනා කළ බවත්, දෙවියන් සමග ධර්ම සාකච්ඡා කළ බවත්, දෙව් ලොවට වැඩම කර ඇති බවත්, ඇතැම් වටිනා සූත්‍ර දේශනාවල දක්වේ. දෙවියන්ගේ ආරාධනා පරිදි ධර්මය දේශනා කර ඇති බවත්, බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. බෞද්ධ වූ අප සෑම පුණ්‍ය කර්මයක්ම කළ අවස්ථාවේදී දෙවියන්ට පින් දීම සිරිතක් කරගෙන ඇත. බෞද්ධයන් හෝ වේවා අන්‍ය ආගමිකයන් හෝ වේවා දෙවියන් අදහන්නේ තම භෞතික ජීවිතයේ දියුණුව, ලෙඩ දුක් රෝග නිවාරණය හා වෙනත් අවශ්‍යතාවන් සඳහා ආශිර්වාද හා උදව් උපකාර ලබාගැනීම සඳහාය. මේ කවුරුත් "අනේ දෙවියනි මට විපත් හඳුනා ගන්නට උදව් උපකාර ලබා දෙත්වා" යි ආයාචනා කරති. මෙය වැරදි අවබෝධය නිසා සිදුකරනු ලබන ක්‍රියාවකි. දෙවියන්ට අපට පිහිට විය නොහැකිය.

දෙව් ලොව ඉපදීමට බලපෑ පුණ්‍ය කර්මය ගෙවී අහවර වූ පසු දෙව් ලොවින් චුතව ආපසු මනු ලොව කරා ආ යුතුය. ඒ හරියට මුදල් රැස්කර සුඛෝපභෝගී හෝටලයකට ගොස් නතර වී තම මුදල් ඉවර වූ පසු හෝටලය අත් හැර නිවස කරා ආපසු එන්නාක් මෙනි. මේවා සියල්ලම තාවකාලිකය. අප බොහෝ දෙනා ප්‍රාර්ථනා කරන්නේ පින් රැස් කර දෙව් ලොව සැප සම්පත් ලබා ගැනීමටය. ඇත්ත වශයෙන්ම මෙය කම් සැප විඳීමට යොදා ගන්නා තවත් මාර්ගයක් පමණි. අප බලාපොරොත්තු වන නිවන, දෙව් ලොව සැප සම්පත් විඳීමෙන් කිසි දිනක ලබාගත නොහැක. මේ සඳහා සුදුසුම වාතාවරණය ඇත්තේ අප මේ ජීවත් වන මනුෂ්‍ය ලෝකයයි. එය එසේ වුවත් මරණින් පසු අපායගාමී වනවාට වඩා සම්‍යක් දෘෂ්ටික දෙව් දේවතාවුන් ආශ්‍රය කිරීමට ලැබීම වාසනාවකි.

බෞද්ධයන් වූ අප බොහෝ දෙනා පිනක් දහමක් කර අවසානයේදී දෙවියන්ට පින් අනුමෝදනා කරනවා පමණක් නොව තමාටද දිව්‍ය සම්පත් ප්‍රාර්ථනා කරති. ගරු ස්වාමීන් වහන්සේ එසේ දිව්‍ය සම්පත් ලැබේවායි ආශිර්වාද නොකළහොත් එය මදි පාඩුවක් ලෙස ඇතැම්හු සලකති. ඇත්ත වශයෙන්ම දෙව් ලොව ඉපදීමට බෞද්ධයන් වීමටම අනිවාර්ය නොවේ. ඕනෑම අබෞද්ධයකුට වුවත් දිව්‍ය සම්පත් ලැබීමට, දෙව් ලොව ඉපදීමට බාධාවක් නැත. ඒ ඒ ආගම් අනුව කරන යහපත් කුසල කර්ම හේතුවෙන් ඔවුනටද දෙව් ලොව ඉපදීමට හැකියාවක් ඇත. නමුත් මේ අය බොහෝ විට එකතු වන්නේ තමන්ගේ ආගමට අනුරූපව වෙසෙන දිව්‍ය මණ්ඩලවලය. ඒ අනුව බෞද්ධ දිව්‍ය මණ්ඩල සහ අබෞද්ධ දිව්‍ය මණ්ඩල වශයෙන් දිව්‍ය මණ්ඩල දෙව් ලොව ඇත. බොහෝ විට බෞද්ධ මණ්ඩලවලට අයත් දෙව් දේවතාවුන්, සම්‍යක් දෘෂ්ටික දෙව්


"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය"

දේවතාවුන් වශයෙන්ද, අබෞද්ධ මණ්ඩලවල සිටින දෙවි දේවතාවුන් මිථ්‍යා දෘෂ්ටික දෙවියන් හැටියටද හැඳින්වේ. මෙම මිථ්‍යා දෘෂ්ටික දෙවි දේවතාවන් ඇතැම් විට යාග හෝමවලට කැමැතිය. එසේ යාග හෝම කරවන අයට උදව් උපකාර කරති. තමා වෙනුවෙන් කරන පූජා සත්කාරවලට කැමැතිය. සම්‍යක් දෘෂ්ටික දේවතාවෝ එසේ පුද පූජා, යාග හෝම බලාපොරොත්තු නොවෙති. දහමෙහි හැසිරෙන්නට ආධ්‍යාත්මික දිවි පෙවෙතක් ගෙවන්නට ආශිර්වාද කිරීමට ඔවුහු සැදී පැහැදී සිටිති. කෙසේ වුවද සම්‍යක් දෘෂ්ටික දෙවි දේවතාවන්ගෙන් භෞතික උදව් උපකාර බලාපොරොත්තු විය නොහැක. දෙවියන්ට පුද පූජා පැවැත්වූ පලියට ඔවුනට අපට උදව් උපකාර කළ නොහැක. බොහෝ විට ඉරණම අනුව අපට හිමි සම්පත් ලැබෙනා විට බොහෝ අය සිතන්නේ තමන් අදහන දෙවියන්ගේ උදව් උපකාර පිහිට හෝ දේවාශීර්වාද තමන්ට ලැබෙනවා යැයි කියාය. මෙය වැරදි කල්පනාවකි.

දෙවියන් ගැන විස්තර සඳහන් කරන විට ඉෂ්ට දේවතාවන් ගැනද යමක් කිව යුතුය. ඇත්ත වශයෙන්ම ස්වභාව ධර්මයා විසින් නිර්මිත සුවිශේෂී වූ මනුෂ්‍ය ජීවියා ආරක්ෂා කිරීම පිණිස ඉෂ්ට දේවතාවන්ගේ සේවය යොදා ඇත. එය දේව නීතියකි. එය එසේ වුවත් සෑම මනුෂ්‍යයකුටම ඉෂ්ට දේවතාවුන්ගේ සේවය ලබා ගැනීමට වාසනාවක් හෝ හැකියාවක් නැත. ඒ ඔවුන් අධ්‍යාත්මිකව ඊට සුදුසුකම් ලබා නැති නිසාය. බෞද්ධ අප භෞතික කයට අමතරව මනෝකාය නැතහොත් විඥානකාය වශයෙන් තවත් සූක්ෂම කයක් ගැන සඳහන් කරමු. මෙය සාමාන්‍ය ව්‍යවහාරයේදී භෞතික කාය සහ අධ්‍යාත්මික කාය වශයෙන් හඳුන්වනු ලැබේ. අප අපගේ අධ්‍යාත්මය පිරිසිදු කළ විට ඉෂ්ට දෙවියන්ට ඒ හරහා පණිවුඩ ලබාදීමේ හැකියාවක් ලැබේ යැයි විශ්වාස කෙරේ. මේ සඳහා සිතින් කයින් හා වචනයෙන් සිදුවන කළු වලා පටල හෙවත් අකුසල කර්ම ඉවත් කළ යුතුය. මෙම වලා පටල ඉවත් වන්නට, ඉවත් වන්නට අධ්‍යාත්මික කාය ප්‍රභාෂ්වර ස්වභාවයක් ගනී. එවිට මනුෂ්‍ය ශරීරයෙන් පිට වන අප පියවි ඇසට නොපෙනෙන ආලෝක ධාරාවන්ගේ තීව්‍රතා වැඩි වේ. එවිට දිව්‍ය පණිවුඩ තරංග ඒ හරහා අප වෙත පහසුවෙන් එවිය හැකි වේ. මෙවැනි අයට හදිසි අනතුරුවලින් වැළැක්වීම පමණක් නොව අනාගත දියුණුව සඳහා අවශ්‍ය උපදෙස්ද සිතට එවිය හැක. පෙර කළ පින් ඉස්මතු කළ හැක. මේ නිසා ඔබ එක එක දෙවියන්ගෙන් පුද පූජා පවත්වා කන්නලව් කර උදව් උපකාර ඉල්ලනවාට වඩා තමා ළඟ සිටින දෙවියන් ගැනම විශ්වාසය තබන්න. තමන්ට නිර්වාණ මඟ අවබෝධ කරගන්නට පිහිට වන්නේ නොපෙනන දෙවියන් නොව ඔබ තුළම සැඟවී ඇති අධ්‍යාත්මික ශක්තිය වේ.

**ගම්පහ තිලක් රත්නකාර විසිනි**





# බොදු දහම පිළිබඳ ශ්‍රේෂ්ඨ කියමන්

● "ඔබ යමක් පිළිගත යුත්තේ යමකුගේ හෝ යම්කිසිවකගේ හෝ බලපෑමෙන් තොරව තමාටම එය අවබෝධ කර ගැනීමට හැකිවූ කල්හි පමණි."

*- කාලාම සූත්‍රය*

● "බ්‍රාහ්මණය, උපුලක් හෝ පියුමක් හෝ ජලයේ හට ගත්තේ, ජලයේ වැඩුණේ, ජලයේ නොරඳා, ජලයෙන් උඩට නැගේ. එම ජලය නොගෑවුණේ යම් සේ සිටීද, බ්‍රාහ්මණය මම මේ ලෝකයෙහි උපන්නේ, ලෝකයෙහි වැඩුණේ, ලෝකය හා නොගැටුණේ ලෝකය අභිබවා වාසය කරන්නෙමි. එබැවින් බ්‍රාහ්මණය මා බුද්ධය යයි දනුව."

*- දෝණ බමුණා අමතා බුදුන් වහන්සේ කළ ප්‍රකාශය*

● "ආගම අනාගතයේදී විපරීත ස්වභාවයක් ගන්නේය. එය දේවත්වයේ පෞද්ගලික ස්වරූපය ඉක්ම වන දේව විශ්වාසය සහ දේව ධර්මය පිටුදක්නා ස්වභාවික වූත්, අධ්‍යාත්මික වූත් මානව අත්දැකීම් මත පදනම් වූ යථාර්ථවත් එකක් වන්නේය. ඒ යථාර්ථය වටහා ගැනීමට බුදු දහම ආධාර වනු ඇත."

*- ඇල්බර්ට අයන්ස්ටයින්*

● "මේ 2550 වසරයි. මේ වන විට දෙවියන් පිළිබඳව ඉගැන්වෙන සියලුම ආගම් අභාවයට පත්ව ඇත. බුදු සමය සමග තරග කළ අනෙක් ආගම් තුනම අසාර්ථක විය. දුබල විය. එහෙයින් තවදුරටත් මිනිස් සිත් සතන් පුබුදු විය හැකි එකම ආගම වන්නේ බුදු දහමයි."

*- ආතර් සී. ක්ලාක්*

● "දාර්ශනිකයකු හැටියට මා කිසිම ආගමක් පිළිගැනීමට සූදානම් නැත. එහෙත් මා හට යම්කිසි ආගමක් තෝරා ගැනීමට සිදුවුවහොත් මගේ තේරීම බුදු දහමයි."

*- බර්ට්‍රන්ඩ් රසල් සාමි*